7 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 7,330 for Head 7, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 7, Vote 2, ordered to stand part of the Schedule.

8 වන ශීර්ෂය.—රාජ්‍ය සේවා කොමිෂන් සභාව

1 වන සම්මතය :—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අනිකුත් දීමනා, රු. 2,55,000

1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප්, රු. 1,80,000

8 ஆம் தலைப்பு.—அரசாங்க சேவை ஆணைக்குழு

வாக்குப்பணம், இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிறபடிகளும், ரூ. 2,55,000.

உப தலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளங்களும், ரூபா 1,80,000.

HEAD 8.—PUBLIC SERVICE COMMISSION

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 255,000

Sub-head 1.—Cadre and Salaries, Rs. 180,000

මතු පළවන යෝජනාව සභාසම්මත විය :

பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது

Resolved :

"That the Vote be increased by Rs. 6,000 in respect of sub-head 1, item 'Other Staff'."—[*The Hon. Wanninayake*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

2 වන උප ශීර්ෂය.—ජීවන වියදම් සහ විශේෂ ජීවනාධාර දීමනා, රු. 58,000

உப தலைப்பு 2.—வாழ்க்கைச் செலவுப்படியும் விசேட வாழ்க்கைப் படியும், ரூ. 58,000

Sub-head 2.—Cost of living and special living allowances, Rs. 58,000

මතු පළවන යෝජනා සභාසම්මත විය:

பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது:

Resolved:

"That the Vote be increased by Rs. 4,880 in respect of sub-head 2, item '(1) Cost of Living Allowance'.".

"That the Vote be increased by Rs. 1,120 in respect of sub-head 2, item '(2) Special Living Allowance'."—[*The Hon. Wanninayake*].

3 වන උප ශීර්ෂය.—වෙනත් දීමනා, රු. 17,000

உப தலைப்பு 3.—பிறப்படிகள், ரூ. 17,000.

Sub-head 3.—Other Allowances, Rs. 17,000

මතු පළවන යෝජනාව සභාසම්මත විය:

பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது:

Resolved:

"That the Vote be increased by Rs. 500 in respect of sub-head 3, item '(1) Rent Allowance'."—[*The Hon. Wanninayake.*]

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்ணாட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

I move,

"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1."

ගරු සභාපතිතුමනි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩ කටයුතු විවේචනයට ලක් කිරීම පිළිබඳව මේ ගරු සභාවේ සථාවර නියෝග අනුව සීමාවක් තිබෙන බව සලකාගෙනයි මා දැන් මේ කොමිෂන් සභාව පිළිබඳව ප්‍රශ්නයක් මතු කරන්නට බලාපොරොත්තු වෙන්නෙ. මෑතක සිට මේ මණ්ඩලයෙන් බලාපොරොත්තු වන අපක්ෂපාත සේවය හරියාකාර ඉටු නොවන බව මා කණගාටුවෙන් කියන්නට ඕනෑ. අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා යටතේ දේශපාලන බලපෑම්වලින් තොරව රජයේ සේවකයකුට කටයුතු කිරීමට ඉඩ ප්‍රසථාව සැලසිය යුතුය යන ඒ මතය, විශ්වාසය නැත්නම් බලාපොරොත්තුව තරමක් දුරට සිදුරු වී, නැති වී යාමේ තත්ත්වයකට වැටී තිබෙන බව කණගාටු වෙන් මතක් කරන්නට සිදු වී තිබෙනවා. ධනේශ්වර ජන සම්මත වාදය අනුව රජයේ වැඩ කටයුතු තුන් ආකාරයකට බෙදා ඇතැයි යන මතයක් තිබෙන බව අප කවුරුත් දන්නවා. අධිකරණය, පරිපාලනය, නීති සම්පාදනය යනාදී වශයෙන් තුන් ආකාරයකට බෙදීමක් කර තිබෙනවා. ඒ අංශ එකිනෙකට බලනොපාන ආකාරයකට, අයුතු බලපෑම් ඇති නොවන ආකාරයකට වැඩ කටයුතු කර ගෙන යාම ධනේශ්වර ජන සම්මත වාදයේ පදනමක් වශයෙන් ශාස්ත්‍රඥයින් උගන්වනවා. එය ප්‍රංශයේ මොන්ටෙස්ක්‍යු කියන ඒ දේශපාලන දර්ශනවාදියා බ්‍රිතාන්‍යයේ ප්‍රකාශයක් වැරදි විධියකට තේරුම් ගැනීමකින් ඇති කර ගත් නිගමනයක් වන්නේ වී නමුත් ඇත්ත වශයෙන්ම එය ජනසම්මතවාදයේ දියුණුවීමට පෙරදී අදාළ වූ බවත් අප කවුරුත් දන්නවා. මේ අනුව කටයුතු කිරීමට උත්සහයක් දරන විට වුවත් ඇත්ත තත්ත්වය කුමක්ද?

අ. භා. 3.15

ගරු සභාපතිතුමනි, ඕනෑම ආණ්ඩුවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවටත් අධිකරණ සේවා කොමිෂන් සභාවටත් මුවා වී තමන්ගේ දේශපාලන අදහස් හා කටයුතු ඉෂ්ට කර ගන්නා බව දැන් සාමාන්‍යයෙන් කාටත් පෙනී ගොස් තිබෙනවා. ඒ තත්ත්වය කලින් තිබුණාට වඩා දැන් උග්‍ර වී තිබෙනවා. මෑතක සිට වැඩි වශයෙන් මේ කොමිෂන් සභා දේශපාලන බලපෑම් වලට යට වී තිබෙන ස්වභාවයක් ඇති වී තිබෙනවාය යන්න පිළිගන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ කොමිෂන් සභාවල සිටින ගරු මහත්වරුන් පිළිබඳව මා විවේචනයක් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. රටේ සාමාන්‍ය පරිසරය අනුව යම් තත්ත්වයක් දරණ උදවියයි මේවාට පත් කර සිටින්නේ. පුද්ගලයින් වශයෙන් ඒ අයගේ අවංකභාවය ගැන යමක් කීම සුදුසු නොවන බව මා දන්නවා. එවැනි යමක් කියන්නට හැකියාවක් ඇතැයි කියාවත් මා කල්පනා කරන්නේ නැහැ. නමුත් මණ්ඩලයක් වශයෙන් කටයුතු කිරීමේදී නම් තත්ත්වය වෙනස් වෙනවා. ඇතැම් අවස්ථාවලදී මණ්ඩලය පිළිබඳව ඇතිවිය යුතු විශ්වාසය කඩතොලු වන අන්දමේ පත් වීම් දී ඇති බව, ඒ සම්බන්ධව කල්පනා කර බලන විට පෙනී යනවා. මෙම සභාවෙ එක් මහත්මයෙක්, කලකට උඩදී සෙනෙට් සභාවෙ සභිකයකු වශයෙන් සිටියා.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்ளி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

අපේ කාලයෙදි නොවෙයි පත් වීම් දුන්නෙ, අසිස් මහත්මය පත් කළේ ඔය උදවියගෙ කාලයෙදියි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ඒ මහතාගෙන් ප්‍රශ්නය කෙළවර වෙන්නෙ නැහැ.

ඊළඟට, එම මණ්ඩලයට පත් වී සිටින තවත් මහත්මයකුගෙ භාර්යාව ප්‍රසිද්ධ වශයෙන්ම දේශපාලන වැඩ කටයුතුවල යෙදෙනවා. ඇතැම් අවස්ථාවලදි, එතුමිය සහභාගි වී සිටින දේශපාලන පක්ෂයෙ ශාඛාවලින් රජයේ සේවකයින්ට විරුද්ධව පැමිණිලි කරනවා. එසේ කරන පැමිණිලි අනුව සේවකයින්ට දඬුවම් කළාම, ඒ ගැන අභියාචනා කරන්න සිදු වී ඇත්තේ මේ මණ්ඩලයටයි. නමුත් මේ මණ්ඩලයේ සිටින එක් පුද්ගලයෙක්, අර මුලින්ම චෝදනාව උත්පත්තිය ලැබූ ස්ථානයේ සිටින තැනැත්තියගේ ස්වාමි පුරුෂයා නම් ඇති වන තත්ත්වය කුමක්ද? ඇත්ත වශයෙන්ම මෙය නුසුදුසු තත්ත්වයක්. ඒ මහත්මයා ගැන වචනයකින්වත් මා දොස් කියනවා නොවෙයි. ඒ මහත්මයා, මෙයට පෙර තිබුණු ආණ්ඩුවලිනුත් සම්භාවනීයත්වයක් ලැබූ කෙනෙක්. දිවංගත ගරු අගමැතිතුමා, රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමට මුලින්ම එළඹුණු අවස්ථාවේදී ඒ කටයුත්ත භාර ගත්තටය කියා එතුමා පත් කළා. මේ ගරු සභාවේ කැමැත්තද ඇතුව විශෙෂ වරප්‍රසාද එතුමාට වෙන් කර දුන්නා. එම නිසා පෞද්ගලික වශයෙන් එතුමා ගැන මා විවේචනය කරනවා නොවෙයි. නමුත් මෙම මණ්ඩලය මෙරෙහි රජයේ සේවකයින්ගේ විශ්වාසය මෙවැනි පත්වීම්වලින් ඇති වන්නෙ නැති බවයි විශේෂයෙන්ම මා පෙන්වා දෙන්න යන්නෙ.

ඊළඟට, මෙම සභාවෙ සභාපතිතුමා හැටියට කටයුතු කරන පුද්ගලයා ප්‍රසිද්ධ දේශපාලනඥයෙක්; අවුරුදු ගණනාවක් තිස්සේ දේශපාලන පොරපිටියෙ සිටියා. කෙනෙකු වයෝවෘධ භාවයට පත් වුණාට පසුව සේවය කිරීමට සුදුසුකමක් නැත, සේවය අහිමි කළ යුතුය කියා මා කියන්නෙ නැහැ. ප්‍රශ්නය තිබෙන්නෙ, වයෝවෘධ වුණත් කටයුතු කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නයයි. එතුමාගෙ වයස ගැන මා යමක් කියනවා නොවෙයි. නමුත් දේශපාලනඥයකු හැටියට අවුරුදු ගණනාවක් තිස්සේ ප්‍රසිද්ධයක් ඇති කර ගත් පුද්ගලයකුට අවසාන කාලයේදී තම පක්ෂයේ දේශපාලන අදහස්වලින් වෙන් වී අපක්ෂපාතව ප්‍රශ්නවලට මුහුණ දෙන්න හැකියාවක් හදිසියෙන්ම සිත්හි ඇති කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ගන්න පුළුවන්ය කියන අදහස නම් ටිකක් දුරට විශ්වාස කරන්න අමාරුයි.

රජයේ සේවකයින්ට දඩුවම් කිරීම පිළිබඳව, මාරු කිරීම පිළිබඳව, වේතනය නියම කිරීම පිළිබඳව ප්‍රධාන වශයෙන් මේ සභාවට බලතල දී තිබෙනවා. එම බලතල වලින් කොටසක් ඒ ඒ ආයතනවල, දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට පවරා තිබෙනවා. මේ රටේ බලපවතින සාමාන්‍ය නීති සම්ප්‍රාදය අනුවත්, මේ මණ්ඩලයට ඇනට බලපානවාය කියන ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් අනුවත්, තමන් සතුව ඇති බලයක් වෙනත් කෙනෙකුට පැවරීමේදී තමන් සතුව පවත්නා ඒ බලය තාවකාලිකව නැතුව ගියාය කියන අදහස කවුරුත් පිළිගන්නවා. නමුත් අපට පෙනී යනවා, මෙතැනදී, මෙම කොමිෂන් සභාව ඇතැම් අවස්ථාවලදී සභාව සතු ඇතැම් බලතල පහළ සිටින දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පවරා ඇති බව. එහෙත්, එසේ පවරා තිබියදීත්, එම බලතලම පාවිච්චි කරමින් මණ්ඩලය ක්‍රියා කරනවා. එසේ කිරීම නීතියට විරුද්ධයි. බලතල පවරා දී තිබියදීම, කළයුතු මොන දඩුවමදැයි නියම කරනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර තැන්පත් බස්නායක මහත්මයාගේ නඩු තීන්දුවක් තිබෙනවා. ඒ අනුව කියැවෙන්නේ මෙයයි: දඩුවම් ගැන තිබෙන බලතල යම් දෙපාර්තමේන්තු ප්‍රධානයකුට පවරා දී ඇතොත්, ඒ බලතල යටතේ එම දෙපාර්තමේන්තු ප්‍රධානයා දඩුවම් නියම කළාට පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉතිරි වන්නේ ඒ සම්බන්ධයෙන් ලැබෙන අභියාචන ඇසීමට තිබුණු බලතල පමණයි. එහෙත් අද කටයුතු කෙරෙන්නේ එසේ නොවෙයි. මුලින් සඳහන් කළ පරිදි බලතල පවරා දී තිබියදීම අසුවල් දඩුවම දෙන්නැයි දෙපාර්තමේන්තු ප්‍රධානයාට කියනවා. එයට පටහැනිව දෙපාර්තමේන්තු ප්‍රධානියා කටයුතු කළාට පස්සේ එය හරිගස්සන්නට—ශුද්ධ කරන්නට—ඉදිරිපත් වන්නේත් නැහැ.

එක්තරා භයානක සිද්ධියක් කෙරෙහි මේ ගරු සභාවේ සැලකිල්ල යොමු කරන්නට කැමතියි. මේ ගැන කල්පනා කරන්නැයි මා ගරු මන්ත්‍රීන්ට මතක් කරනවා. ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව තුළ ආරක්ෂක හමුදාවක් තිබෙනවා. එහි ප්‍රධානියා ගැන මේ අවස්ථාවේ යමක් කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඔහු ගැන 1956 සිට මේ ගරු සභාවේදී ඇතැම් අවස්ථාවල කරුණු ඉදිරිපත් කර තිබෙන නිසා ඒවා නැවත වරක් ඉදිරිපත් කරන්නට මේ මොහොතේදී මා ඉදිරිපත් වන්නේ නැහැ. ඒ ආරක්ෂක හමුදාවට අයත් සේවකයන්ගේ වෘත්තීය සමිතියක් තිබෙනවා. යම් යම් දේ ගැන සාකච්ඡා කිරීමට අවස්ථාවක් දෙන්නැයි ඒ වෘත්තීය සමිතිය ගරු ඇමතිතුමාගෙන් ඉල්ලුවා. සාකච්ඡාවට ගරු ඇමතිතුමාත් සිටියා. දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන සාමාන්‍යාධිකාරී තැනත් සිටියා. ආරක්ෂක හමුදාවේ ප්‍රධානියාත් සිටියා. රජයේ වෙනත් නිලධාරීන් කීප දෙනෙකුත් මේ සාකච්ඡාවට සහභාගි වුණා. ඒ සාකච්ඡාවට, මා සඳහන් කළ වෘත්තීය සමිතියෙන් නියෝජිත පිරිසක් පැමිණ සහභාගි වුණා. වෙනත් කොමිෂන් සභාවල් මගින් සොයා බලා පළ කරන ලද සමහර කරුණුත් එහිදී මතක් කරන්නට යෙදුණා. ඉදිරිපත් කරන ලද ඒ කරුණුවලින් ඇතැම් අවස්ථාවලදී ආරක්ෂක හමුදාවේ ප්‍රධානියාට විරුද්ධව චෝදනා පැන නඟින්නට පුළුවනි. එහෙත් වෘත්තීය සමිතියේ වැඩ පිළිවෙළක් අනුව සාකච්ඡාවක් කැඳවා තීරණය කරන ලද කරුණක් අනුවයි ඉදිරිපත් කළේ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඝාකවඡාව අවසන්වී දවස් ගණනක් යන විට දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරි මහත්මයා ඒ වෘත්තීය සමිතියේ නිලධාරි මහත්මයකුට චෝදනා පත්‍රයක් නිකුත් කළා. දුම්රිය සේවයට අයිති ආරක්ෂක හමුදුවේ ප්‍රධාන මහත්මයාට විරුද්ධව චෝදනා නැඟුවාය යන්නයි ඔහුට විරුද්ධව ඉදිරිපත් කළ චෝදනා පත්‍රයේ සඳහන් වුණේ. වෘත්තීය කටයුත්තකට ගිය අවස්ථාවේ කරන ලද ප්‍රකාශයක් ගැන මෙසේ චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීම ගැන පොදු සේවා කොමිෂන් සභාවට කරුණු කියා සිටියා. ඊට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පිළිතුර වූයේ මෙම කාරණය මේ මොහොතේදී සෙවීමට අප කල්පනා කරන්නේ නැහැ යන්නයි. මේ අවස්ථාවේදී මෙයට මැදිහත් වීමට කල්පනා කරන්නේ නැහැ යන්නයි ලැබුණ පිළිතුරුවල තිබුණේ. At this stage යන්නයි කීවේ. එයින් අදහස් කරන්නේ වෙන වෙලාවක මැදිහත් වීමට ඉඩ තිබෙන බවයි. මේ සම්බන්ධව පරීක්ෂණයක් පැවැත්වූවා. පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ දුම්රිය සාමාන්‍යාධිකාරිතුමා. දඬුවම දෙන්නෙත් දුම්රිය සාමාන්‍යාධිකාරිතුමා. ඒ නිසා මෙය සුදුසු තත්ත්වයක් නොවන බව පැහැදිලියි. නැවතවරක් ඒ ගැන රාජ්‍යසේවා කොමිෂන් සභාවට කරුණු කියා සිටියා. පිළිතුරු කුමක් ද? මේ අවස්ථාවේදී මැදිහත් වීමට අප කල්පනා කරන්නේ නැහැ යන්නයි ඊට ලැබුණු පිළිතුර. ඒ නිලධාරියාගේ විරුද්ධත්වය නොතකා එම පරීක්ෂණය පැවැත්වූවා. පරීක්ෂණය පවත්වා ඔහු වැරදිකරුවකු ලෙස තීරණය කළා. එසේ වැරදිකරුවකු කිරීම පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ආයාචනයක් කළා. ඊට පිළිතුරු දෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව කියන්නේ මෙයට මැදිහත් වීමට හේතුවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පෙනෙන්නේ නැහැ යන්නයි. දැන්, මේ හැටියට ක්‍රියා කරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් සම්බන්ධව කාට නම් විශ්වාසයක් තැබිය හැකි ද?

ජනවාරි මාසයේ 8 වැනිදා සිද්ධීන් පිළිබඳව මීට පෙර ගරු ඇමැතිතුමාත් කථා කළා. 1966 ජනවාරි මස 8 වැනිදා ඒ සේවකයන් කළ දේවල් හරිද වැරදිද කියා හෝ දෙපාර්තමේන්තු නිලධාරීන් කළ දේ හරිද වැරදිද කියා හෝ නොවෙයි. මා දැන් කථා කරන්නේ. මා කථා කරන්නේ දඬුවම් දීම පිළිබඳවයි. අසුවල් දඬුවම් පැමිණ විය යුතු යයි තීන්දු කෙළේ කවු ද? සංකේත වැඩ වර්ජනයට සහභාගි වූ නිසා එයට හේතු පෙන්විය යුතු යයි හැම දෙපාර්තමේන්තු නිලධාරියකු මඟින්ම වැඩ වර්ජනයට සහභාගි වූ සේවකයන්ට එකම විධියේ ලියමනක් ඉදිරිපත් කරන්නට යෙදුණා. මා මීට පෙර කථා කරමින්, මෙම තීරණය ගත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ බලය ලත් පොදු සේවා කොමිසන් සභාව නොවන බවත්, මෙම තීරණය ගත්තේ කැබිනට් මණ්ඩලය බවත්, පොදු සේවා කොමිසන් සභාව වෙනුවෙන් කැබිනට් මණ්ඩලයේ නියෝගය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ගිය බවත් ඔප්පු කළා. මේ කාරණය නිසා මෙම ආණ්ඩුව තමන්ගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කළ බවට මා මෙම ආණ්ඩුවට චෝදනා කරනවා.

මීට පෙර අවස්ථාවකදී ද මේ විධියට ක්‍රියා කර තිබෙනවා. 1959 මාර්තු මස තුන් වැනිදා සංකේත වැඩ වර්ජනයක් ඇති වුණා. ඒ වැඩ වර්ජනය ඇති වුණේ මහජන ආරක්ෂක පනතට ඉදිරිපත් කරන ලද සංශෝධන පනතක් නිසයි. අද ආණ්ඩු පැත්තේ සිටින සමහර දේශපාලන පක්ෂ ඒ වැඩ වර්ජනයට සහයෝගය දුන්නා. ඒ දේශපාලන පක්ෂවල අනුගාමිකයන් සමහර දෙනකු ඒ වැඩ වර්ජනයට සහභාගි වුණා. එදා වැඩ වර්ජනයට සහභාගි වූ අයට එදා තිබුණු ආණ්ඩුවෙන් දඬුවම් ලැබුණත් මෙම ආණ්ඩුවේ පළමුවැනි පේළියේ සැතපී සිටින ගරු ඇමතිවරුන් ඔවුන්ට අනුකම්පාව දැක්වූවා. ඒ අනුකම්පාව හේතුකොටගෙන 1960 මාර්තු මාසයේදී එක්සත් ජාතික පක්ෂය දින 30 කට ආණ්ඩු බලය ලැබූ අවස්ථාවේදී එදා ඒ වර්ජනයට සහභාගි වූ සේවකයන්ට දඬුවම් නොකළ යුතු යයි තීන්දුවක් ගත්තා පමණක් නොව කපා ගත්තා ලද එක් දිනක වැටුප ආපසු දීමටද තීරණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

කළා. මේ තත්ත්වය අනුව සංකේත වැඩ වර්ජනයක් හරිද වැරදිද කියා තීන්දු වන්නේ එය කාට විරුද්ධව කරනවා ද කියන ප්‍රශ්නය උඩයි. තමන් බලයෙන් පහ වී විරුද්ධ පාර්ශ්වයට වී සිටින අවස්ථාවලදී තමන් නුරුස්සන ආණ්ඩුවක් බලයෙහි සිටිනවා නම්, අන්න ඒ ආණ්ඩුවට විරුද්ධව වැඩ වර්ජනයක් කළ හොත් ඒ වර්ජකයන් හරි. ඒ අතර තමන් බලයේ සිටින විට සංකේත වැඩ වර්ජනයක් කළ හොත් ඒක වරදියි. මෙතෙක් මේ ආණ්ඩුව ක්‍රියා කර තිබෙන්නේ ඔය පදනම උඩයි.

අ. භා. 3.30

1966 ජනවාරි මස 8 වැනිදා ඇති වූ වැඩ වර්ජනය සම්බන්ධයෙන් කළේ කුමක් ද? පොදු සේවා කොමිෂන් සභාව සංකේත වැඩ වර්ජනයට සහභාගි වූ සේවකයන් විශාල සංඛ්‍යාවකගේ වැඩ තහනම් කළා. මේ අය කොටස් දෙකකට බෙදුවා. පොදු වේ සියලුම සමිතිවල නිලධාරීන් සහ සමිතිවල වැඩ කටයුතුවලට කිට්ටු සම්බන්ධයක් ඇති උදවිය එක වර්ගයක් වන අතර ඒ අයගේ අණ පිළිපදින අය අනෙක් වර්ගයයි. මේ විධියට වර්ක කොට කාලයක් තිස්සේ වැඩ තහනම් කර තබා ගෙන පසුව සාමාන්‍ය නියෝගයක් කළා. ඒ නියෝගය මොකක් ද? අණ පිළිපදින් නන් හැටියට සලකනු ලැබූ උදවියට සතියක පඩිය දඩ ගැසුවා. ඒ දඩ ගැසීම ප්‍රධාන දඬුවම කොට ඔවුන් ආපසු වැඩට ගත්තා. සමිතිවල වැඩ කරන අනික් වර්ගය ගැන වඩාත් දරුණු දඬුවම් දී තිබෙන පිළිවෙළ අවුලක් වී ඇත. අසාධාරණකම් බොහොමයි. ඇතැම් උදවියගේ වාර්ෂික පඩි වැඩිවීම පිළිබඳව යම්කිසි දඬුවමක් කර ආපසු වැඩ දෙන්නටයි, ක්‍රියා කර තිබෙන්නේ. රක්ෂාවට පැමිණීම තහනම් කර තිබුණු කාලයේදී අඩක් පඩිය ගෙවා තිබෙනවා. අනෙක් කොටස නොගෙවා සිටීමයි ඇතැම් තැනෙක කර තිබෙන්නේ. මේ අනුව බලා ගෙන යන විට පේනවා, දෙපාර්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුවට ක්‍රියා කර තිබෙන ආකාරය වෙනස් බව. තරමක් අනුකම්පාව් ඇතුව වැඩ කටයුතු කරන්නට තීරණය කළ ඇතැම් නිලධාරීන් විසින් මේ විධියේ දඬුවම් දී ආපසු වැඩට ගෙන තිබෙනවා. ඇතැම් ස්ථානවල සමිති ලේකම්වරුන්ට පවා වැඩ දී තිබෙනවා. සංකේත වැඩ වර්ජනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද පත්‍රිකාවට අත්සන් තැබූ අයට පවා සමහර තැන්වල වැඩ දී තිබෙනවා. එම පත්‍රිකාව තමයි, ප්‍රධාන සාක්ෂිය වශයෙන් ඉදිරිපත් කළේ. එහෙත් සමහර තැන්වල—විශෙෂයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ—උදවිය රක්ෂාවලින් පවා අස් කර සිටිනවා.

දුම්රිය දෙපාර්තමේන්තුව, ආණ්ඩුවක් තුළ ආණ්ඩුවකැයි සඳහන් කළ හැකියි. ඕනෑම කටයුත්තක් පිළිබඳව ඉතා හිතුවක්කාර පිළිවෙළට වැඩ කටයුතු කරන ආයතනයක් තමා, එය. ආණ්ඩුවක් තුළ ආණ්ඩුවකැයි මා සඳහන් කළේ එම නිසායි. ඇතැම් අවස්ථාවලදී මහ ආණ්ඩුවටත් ඉහළින් යන බව පෙනෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු මහතාත් දුම්රිය සාමාන්‍යාධිකාරී මහතාත් අතර අවුරුදු ගණනාවක් තිස්සේ කර ගෙන යන ප්‍රසිද්ධියට පවා පත්වී ඇති මහා යුද්ධයක් තිබෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් සාමාන්‍ය සේවකයන්ට පහර පිට පහර වදිනවා. යම්කිසි දඬුවමක් දීම ලිහිල් කරන්නට හෝ අනුකම්පාවක් දක්වන්නට හෝ දෙපැත්තම බියයි. සුළු වශයෙන් හෝ සහනයක් දෙන්නට ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු මහතා බියයි. ඒකත් තමාට විරුද්ධ චෝදනාවකට හේතුවක් වේවිය කියන බියයි, ඒ. එම නිසා ඔහු දඬුවම් දීමේදී වඩාත් තද වෙන්නට බලනවා. ඔහුගේ දඬුවම ලිහිල් කළාය යන චෝදනාවට ලක් වේවිය කියන බිය නිසා, දුම්රිය සාමාන්‍යාධිකාරීතුමාගේ කාර්යාලයට පැමිණිවිට ඒ පිළිබඳව ඊටත් වඩා තදින් ක්‍රියා කරන්නට බලනවා. එම නිසා මෙතන එක්තරා විධියක පොර කෑමක්, තරඟයක් තිබෙන බව පෙනෙනවා, කවුරුන් විසින් ද වඩාත් දරුණු ආකාරයට දඬුවම් කරන්නේ කියන කාරණය ඔප්පු කිරීම පිණිස. එහි දරුණු ප්‍රතිඵල හැම තැනම පෙනෙන්නට තිබෙනවා.

ජනවාරි 8 වන දින සිද්ධිය සම්බන්ධයෙන් ක්‍රියා කර තිබෙන්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රෙගුලාසි පවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැති විධියට සලකා ගෙනයි. 41 වන වගන්තිය යටතේ සුළු පරිපාලකයන්ට —minor supervisors—චෝදනා පත්‍ර ඉදිරිපත් කළා. ඒ අය පිළිතුරු දුන්නා. එම පිළිතුරු පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමයි, ඊළඟ පියවර විය යුත්තේ. එහෙත් එවැනි පරීක්ෂණයක් පැවැත්තුවේ නැහැ. පරීක්ෂණයක් නොපවත්වාම දඬුවම් කීපයක් දෙන්නට යෙදුණා. දඬුවම් කීපයක් දී ආපසු වැඩට ගත්තා. මොන මොන චෝදනා උඩ කුමන සාක්ෂියක් අනුව දඬුවම් දුන්නාද කියා කිසිවකු දන්නේ නැහැ. එම නිසා චෝදනා මොන වාදයි සොයා බලා ඒවාට නිසි පිළිතුරු සපයන්නට අවකාශයක් සැලසුණේ නැහැ.

රජයේ මුද්‍රණාලය පිළිබඳව රාජ්‍ය ඇමතිතුමා දන්නවා ඇති. එහි වැඩ විර්ජනය කළ සේවකයන්ට දඬුවම් කීපයක් දී තිබෙනවා. ඒ දඬුවම් ද දරුණුය කියා මා පිළිගන්නවා. එහෙත් සේවකයන් පහ කිරීම පිළිබඳව පියවර ගැනීමේදී එක් සමිති නිලධාරියකු පමණක් අතහැර අනික් සියළු දෙනාම රක්ෂාවලට ගත්තා. මෑතදී ඉතිරි තැනැත්තාටත් ආපසු රක්ෂාව දෙනු ලැබුවා. දුම්රිය දෙපාර්තමේන්තුව ක්‍රියා කළේ එහෙම නොවෙයි. එහි 16 දෙන කුම දැන් සේවයෙන් පහකර අවසානයි. ඊට හේතුව සමිතියක නිලයක් දැරුවාය යන චෝදනාවයි. වෙන කිසිම චෝදනාවක් නැහැ. හොරකමක් කළාය; ජනවාරි 8 වන දින කාට හෝ ගහන්නට ගියාය; ජනවාරි 8 වන දින වැඩ විර්ජනයට යම් යම් අය පෙළඹෙව්වාය යනාදී වශයෙන් කළ හැකි කිසිම චෝදනාවක් ඔප්පු වී නැහැ. සමිතියක නිලයක් දැරීම, කාරක සභිකයකු වීම වැනි කරුණු උඩයි සේවයෙන් පහ කර තිබෙන්නේ. දැන් මේවා ගැන ආයාචනයක් කළාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් එකම පිළිතුරයි ලැබෙන්නේ. ඒ පිළිතුර ගල් අච්චුවේ ගසාගෙන සූදානම් කරගෙන තිබෙනවා. වෙනත් කිසිම සැලකිල්ලක් නැහැ. මොකක්ද කියන්නේ? "මැදිහත් වීමට හේතුවක් නොදැනේ."

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

නොපෙනෙන ඒවාට ඒ පිළිතුර. පෙනෙන ඒවාට වෙනම පිළිතුරක්.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ගරු මුදල් ඇමතිතුමාට මම පෙන්වන්නම්. [බාධාකිරීම්] සමහර අය නැවත අරගෙන තිබෙනවා. මා කියන්නේ රාජ්‍ය සේවා කොමිසමේ කටයුතු දෙපාර්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුවට වෙනස් වීම පිළිබඳ තත්ත්වයයි. "මේ නිලධාරියා මෙතැනට ගන්න පුළුවන් නම් අර නිලධාරියා අතැනට ගන්න බැරි ඇයි" කියා විමසූ විට කියනවා "හේතුවක් නොපෙනේ" කියා. ඒ ගැන සැලකීමටවත් හේතුවක් පේන්නේ නැතිලු.

ගරු සභාපතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී තැනගේ පාලනය යටතේත් යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ පාලනය යටතේත් තිබෙන කොටසේ අද තිබෙන තත්ත්වය ඉතාමත් භයානකයි. එහි භයානකකම පිළිබිඹු වන සත්‍ය සිද්ධියක් මම කෙටියෙන් කියන්නම්. තමුන්නාන්සේලා කවුරුත් දන්නවා, නත්තල් දිනට පෙර, නත්තල් උත්සවය සඳහා බොහෝ උදවිය කඩ සාප්පුවලට ගිහින් නොයෙකුත් බඩු ගෙන යාමේ සිරිතක් තිබෙන බව. ඒ උත්සව දිනවලදී මත්පැන් පානය කිරීමේ බලාපොරොත්තු ඇති උදවිය ඒවාත් ගන්නවා. එය සාමාන්‍ය වශයෙන් සිදු වන දෙයක්. ඒ නිසා ඒ දින වල එවැනි දෙයක් පිළිබඳව කවුරුත් සොයන්නේ බලන්නේ නැහැ. එහෙත් නත්තල් දාට පෙර දා අරක්කු බෝතලයක් වැඩපළ ඇතුළට ගෙනාවාය කියා කම්කරුවකුගේ වැඩ තහනම් කළා. මුරකාරයා විසින් මේ කම්කරුවා අරක්කු බෝතලයකුත් සමග අල්ලාගත්තාය කියා ගල් කිස්සේ පොලීසියට පිටත් කර යවා ඒ ගැන පොලීසිය මගින් පරීක්ෂණයක් කෙරෙව්වා. නඩුවක් දැමීමට කාරණයක් එහි නැත කියා පොලීසියෙන් නිගමනය කළා. පොලීසිය එවැනි නිගමනයක් කළාට සසුවවත් ඔහුට වැඩ දුන්නේ

Digitized By Noolaham Foundation
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

නැහැ. දෙපාර්තමේන්තු පරීක්ෂණයක් පැවැත්තුවා. ඒ පරීක්ෂණයේදී මේ කම් කරුවා කිව්වේ නැහැ ඔහු අරක්කු බෝතලයක් ගෙනාවය කියා. ඒ බෝතලේ තිබුණෙ මොනවාද කියා කවුරුවත් දන්නේ නැහැ. එය පොලීසියට ගෙන ගියාට පස්සේ කොහාට ගියාද කියා දන්නෙත් නැහැ. එහෙත් මේ බෝතලේ තිබුණේ අරක්කුය කියන පදනම උඩයි චෝදනාව නඟා තිබුණේ. එම කම්කරුවා වෙනුවෙන් පරීක්ෂණයේදී කථා කළ රජයේ නිල ඛාදියා පෙන්වා දුන්නා, මේ කම්කරුවා අරක්කු ගෙනාවාය කියා ඔප්පු කරන්නේ නැතිව මට මේ චෝදනාවට පිළිතුරු දෙන්න බැහැ කියා. අරක්කු බෝතලය වුවමනාත් නැත, එවැනි දෙයක් ඔප්පු කරන්න වුවමනාත් නැත, කියා ඒ මනුස්සයව සේවයෙන් පහ කර දැම්මා.

මෙහිදී මතු වන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. සංකේත වැඩ වර්ජනයට සහභාගි වුණ අය එක වර්ගයක් වශයෙන් නොහොත් පුරවැසියන් වශයෙන් පහළ කොටසක් හැටියට සලකන අතර, වැඩ වර්ජනයට සහභාගි නොවුණ අය ඉහළ කොටසක් හැටියට සලකනවා. ඒ දෙපාර්තමේන්තුවේ සංකේත වැඩ වර්ජනයට සහභාගි නොවුණ සුද්ධවන්තයෙකු විසින් හොරකමක් කරන්න යෙදුණා. ඒ හොරකම අල්ලාගැනීම සඳහා සංකේත වැඩ වර්ජනයට සහභාගි වුණ කෙනකු විසින් පැමිණිල්ලක් කළා, මෙහෙම හොරකමක් කරනවාය කියා. අවසානයේදී දඬුවම් කෙළේ කාටද? පැමිණිල්ල කළ එක්කෙනාටයි.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

බොරු පැමිණිල්ලක් නිසා වෙන්න ඇති.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

නැහැ, නැහැ, පැමිණිල්ලෙන් කළ චෝදනාව සම්පූර්ණයෙන්ම ඔප්පු කරන්ට සාක්කි තිබුනා. එසේ වුණත්, වැරැද්ද කළ තැනැත්තා එහිම සිටින අතර, පැමිණිල්ල කළ තැනැත්තා දෙපාර්තමේන්තුවෙන් පිටතට මාරු කළා. ඒ නිසයි මා කිව්වෙ, මේ දුම්රිය දෙපාර්තමේන්තුව ආණ්ඩුවක් ඇතුලේ ආණ්ඩුවක් බව.

ගරු සභාපතිතුමනි, මෙම ශීර්ෂය යටතේ මතු කිරීම සඳහා කරුණු රාශියක් තිබෙනවා. එහෙත් අගමැතිතුමාගේ ශීර්ෂය පිළිබඳව විවාදය දික් වූ නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව සාකච්ඡා කිරීමට ලැබී ඇති අවස්ථාව ඉතාමත් සීමිතයි. මා අහන්නේ මෙයයි: සංකේත වැඩ වර්ජනයට සහභාගි වූ විශාල ගණනක් රජයේ සේවකයන්ට ආපසු රක්ෂාව දුන්නා නම්, තැපැල් දෙපාර්තමේන්තුවේත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේත් ආදේශකයන් හැටියට වැඩ කළ, සංකේත වැඩ වර්ජනයට සහභාගි වූ, අය සම්පූර්ණයෙන්ම සේවයෙන් පහ කළේ ඇයි?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

ඒ ඇමතිතුමාගේ වැය ශීර්ෂය සාකච්ඡා කරන විට අහන්න.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

මේ සේවකයන් අයිති, රාජ්‍ය සේවා කොමිෂන් සභාවටයි. එක එක කොටසට වෙන වෙන දඬුවම් දෙනවා. මාසික වැටුප් ලබන ස්ථිර කම්කරුවකු සංකේත වැඩ වර්ජනයට සහභාගි වුණානම් සතියක වැටුප දඩ ගසා ආපසු රක්ෂාව දෙනවා. ආදේශකයකු සංකේත වැඩ වර්ජනයට සහභාගි වුණා නම් සම්පූර්ණයෙන්ම සේවයෙන් අස් කරනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

ආදේශකයන්?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

ඒ මිනිසුන්ට රක්ෂා වුවමනා නැද්ද? බඩගින්නක් නැද්ද? දරු පවුල් නඩත්තු කරන්නට වුවමනාවක් නැද්ද? අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආගම් කර්තෘවරුන්ගේ පංච ශීලය ආදි දේවල්ද මේ පිළිපදින්නේ? තමන්ට වුව මනා තාලයට එකින් එක වෙනස් කළ රෙගුලාසි නොවෙයිද, මේ?

රජයේ සේවකයන් කොට්ඨාශයක් වන ගුරුවරුන් පිළිබඳව කටයුතු කර තිබෙන ආකාරය බලමු. එක ගුරුවරයකුගේවත් ආයාචනයක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව සැලකිල්ලක් දැක්වූවාද? නැහැ. "මැදිහත් වීමට හේතුවක් පෙනෙන්නේ නැත" යන්න පමණයි, පිළිතුර. පුද්ගලයා හඳුනන්නේවත් නැති පැමිණිලිකරුවන්ගේ "මෙන්න මෙයා තමයි, සභාවේ කථා කළේ" යන චෝදනාව උඩ පමණක් දඬුවම් කරනු ලැබූ ගුරුවරුන් සිටිනවා. හැදිනීමේ පෙරෙට්ටුවේදී හඳුනා ගන්නට බැරි වූ අවස්ථාත් තිබෙනවා. ඒ අවස්ථාවල පවා, වෙනත් පෞද්ගලික හේතූන් උඩ පළි ගැනීමේ අදහසින් සාක්ෂි දුන් උදවියගේ බොරු සාක්ෂි පිළිගෙන ගුරුවරුන්ට දඬුවම් කර තිබෙනවා.

ඊට වඩා දරුණුයි, ග්‍රාම සේවකයන් ගැන ක්‍රියා කරගෙන යන ආකාරය. ග්‍රාම සේවකයන් ස්ථිර කළ යුතුව තිබුණා.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)
ඒ අය හොඳ හොඳ සෙල්ලම් කර තිබෙනවා.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
තමුන්නාන්සේ කලබල වන්නේ මොකද? තමුන්නාන්සේගේ සෙල්ලම් ගැන කියන්නට වුවමනාවක් නැහැ.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)
තමුන්නාන්සේගේ සෙල්ලම් ගැන මා කථා කළේ නැහැ. මා කීවේ, ග්‍රාම සේවකයන්ගේ සෙල්ලම් ගැනයි. [බාධා කිරීම්]

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
පාර්ලිමේන්තු ලේකම්තුමාගේ සම්පූර්ණ ඉතිහාසය ගැන මෙතැන අප කථා කරන්නට වුවමනාවක් නැහැ.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)
ඇයි?

අ. භා. 3.45

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඒ තරම් අලංකාරයි.

ග්‍රාම සේවකයන් සම්බන්ධ ප්‍රශ්නය ගැන ගරු ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී සඳහන් කෙරෙනවා ඇති. මා කියන්නේ මෙපමණයි: යම් කාල සීමාවකින් පසු ඒ අය ස්ථිර කිරීමට යුතුකමක් තිබුණා. එසේ නොකොට, රක්ෂාව පිළිබඳ ස්ථිරත්වයක් නොමැති අය හැටියට කාලයක් තිස්සේ ඔවුන් තබාගෙන, ඊට පස්සේ සුළු චෝදනා උඩ—චෝදනා ඔප්පු කිරීමක් නැතිව, විභාගයක් නැතිව, ඒ අයට පිළිතුරු දීමට අවස්ථාවක්වත් නොදී,—ඉදිරිපත් කළ සාක්ෂි විග්‍රහ කර තමන් නිදෙස් යැයි ඔප්පු කිරීමට අවකාශයක් නොදී, ඔවුන් අස් කර තිබෙනවා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
පැමිණිලි කළා විතරයි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்ணாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
පැමිණිලි කළා විතරයි? නැහැ අස් කළා; එහෙම නැත්නම් මාරු කළා. මේ රජයේ සේවකයන් හැම දෙනකුම අයත් වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටයි. ආඥාදායක ක්‍රම ව්‍යවස්ථාව යටතේ බලය පැවරී තිබෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

සභාවටයි. තමන්ගේ යුතුකම් හා බලතල අත්හැර වෙනත් අයගේ අණ පිට රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියා කරනවාද, එසේ නැත්නම් තමන්ට අයත් කටයුත්ත හරිහැකාරව ඉෂ්ට කරන්නට ලෑස්තිද කියා මේ මහත්වරුන් තුන් දෙනාගෙන් අප දැන ගන්නට කැමතියි.

ඒ, එක පැත්තක්. අනෙක් පැත්ත මෙයයි: සමහර තැන්වල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින්——

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

කාගෙන්ද, ඔය ප්‍රශ්න අහන්නේ? ඒ මහත්වරුන් තුන් දෙනාගෙන්?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The three musketeers are not here but D' Artagnan is here.

ගරු සභාපතිතුමනි, අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව පොදු සේවා කොමිෂන් සභාව පිළිබඳව වගකීමක් ඇති ගරු ඇමතිවරයෙක් මෙතන නොමැති බව මා දන්නවා. එමෙන්ම පොදු සේවා කොමිෂන් සභාව පත් වන්නේ කොහොමද කියන එකත් අප කවුරුත් දන්නවා. ඒ දැන ගැනීමේ පදනම උඩයි මා මේ කරුණු ඉදිරිපත් කරන්නේ. එක අතකින් වුවමනා නැතිව දේශපාලන බලපෑම්වලට අවනත වීමේ තත්ත්වයක් තිබෙනවාය කියා චෝදනා කරනවා. අනික් පැත්තෙන් නුවුවමනා පරිදි දෙපාර්තමේන්තුවලට අත ගහනවාය කියා චෝදනා කරන අතරම දෙපාර්තමේන්තු නිලධාරීනුත් අණ නොපිළිපදින තත්ත්වයක් ඇති වී තිබෙනවා. දුම්රිය සේවය පිළිබඳව පොදු සේවා කොමිෂන් සභාවෙන් දුන් අණ නොපිළිපදින නිලධාරීන් පිළිබඳවත් ක්‍රියා කරන්නට අදහසක් නැති බවයි පෙනෙන්නේ. ඒවා හරිගස්සන්නේ නැත්නම් පොදු සේවා කොමිෂන් සභාව කෙරෙහි කිසිම විශ්වාසයක් රජයේ සේවකයින් තුළ නැතෙයි කියන කරුණ මතු වන අතරම, මේ විධියට ක්‍රියා කරන මණ්ඩලයක් පිළිබඳව විරුද්ධ පක්ෂයේ සිටින අපටත් කුමන පියවරක් ගන්නට සිදු වේද කියන කරුණ ගැනත් සලකන්නට සිදු වේය කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்ஹ)
(Mr. Subasinghe)

ගරු සභාපතිතුමනි, මටත් තිබෙන්නේ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කී කරුණු වැනිම වූ කරුණු කිපයක් ඉදිරිපත් කරන්නටයි. ඒවා එකින් එක විස්තර කරන්නට ගියොත් හුඟ වේලාවක් ගනීවි. අද ලංකාවේ රජයේ සේවකයින්ගේ විනය පිළිබඳව ක්‍රියා කරන ආකාරය ඉතාම කණගාටුදායකයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ ගරු සභාවේදී විවේචනය කිරීම අමාරුයි. එමෙන්ම මේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඇති කළ මණ්ඩලයක් නිසා ඒ සඳහා වගකීම මේ ඇමතිවරුන් බාරගන්නේ නැත කියනවා. මේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් අම්බලන් ගොඩ තිබෙන රුකඩ නැටුමක් වගෙයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සිටින තුන්දෙනා තමයි රුකඩ. ලනුව අදින රුකඩ බාස් මේ ගරු සභාවේ සිටිනවා. කුමන ආණ්ඩුවක වුණත් මටකමක් නැහැ.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

මට පුරුදු නැහැ ලනු අදින්නට.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்ஹ)
(Mr. Subasinghe)

අගමැතිතුමාගේ වරද නම් එතුමා සමහර විට අල්ලා ගන්නේ දිරිච්ච ලනු වීමයි.

ගරු සභාපතිතුමනි, එංගලන්තය වැනි එක්තරා සමාජයීය සථිර පදනමක් ඇති රටවල ඇති කරගත් යම් යම් ආයතන හා මණ්ඩල අප විසින් එහෙමපිටින්ම ගෙන මේ රටෙත් පැළ කර තිබෙනවා. රටේ තත්ත්වය හෝ පසුබිම කුමක්ද කියා කල්පනා නොකර ඒ ආයතන ඒ ආකාරයෙන්ම මෙහි යොදා තිබෙනවා. එහෙත් ඒවා ක්‍රියාත්මක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නට යන විට අපේ සමාජයේ තිබෙන දුර්වලකම් පරස්පර විරෝධිකම් ආදී සියල්ලක්ම මෙයට මැදි වී අවසාන යේදී ලැබෙන ප්‍රතිඵලය බොහොම අයුක්ති සහගත වෙනවා.

මම එක්තරා සිද්ධීන් දෙකක් පෙන් වන්නම්. මා දන්න එක්තරා ප්‍රධානාචාර්ය වරයෙක් හිටියා. මැතිවරණයේදී එක්තරා පැත්තක් අරගෙන එක්තරා ඡන්දා පේක්ෂකයකුට වැඩ කළාය කියන චෝදනා වක් උඩ මේ ගුරුවරයාට විරුද්ධව කටයුතු කර එම චොදනාව ඔප්පු කරන්නට බැරි වුණා. අවසානයේදී ඒ ගුරුවරයාට කළේ මොකක්ද? ඒ පාසැලේ ළමයින්ගේ සමුපකාර සමිතියක් තිබුණා. ඒ සමිතියේ බඩු බාහිරාදිය "ස්ටොක්" කර තැබීමට කාමරයක් ඒ පාඨශාලාවටම යා කර තනා දීමට ගුරුදෙගුරු සමිතිය බාරගත්තා. ගුරු දෙගුරු සමිතිය ඒ කටයුත්ත කරගෙන යන විට මුදල් මදි වූ නිසා සමුපකාර සමිතියේ කාරක සභාවේ අනුමැතිය ඇතිව රුපියල් හයසිය ගණනක් ඒ සඳහා අර සමුපකාර සමිතියෙන් ගත්තා. අවසාන යේදී මේ ගුරුවරයාට විරුද්ධව නැගුණු චෝදනාව මොකක්ද? සමුපකාර සමිතියේ මුදල් වංචා කළායයි මෙම ගුරුවරයාගේ වැඩ තහනම් කළා. එහෙත් සමුපකාර දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකු විසින් කිසිම විභාගයක් පවත්වා හෝ මෙම ගුරුවරයාට චෝදනා පත්‍රයක් ඉදිරි පත් කර හෝ නැහැ. වංචාවක් කළාය යන චෝදනාවක් උඩ වැඩ තහනම් කරනු ලැබූ නිසා මේ ගුරුවරයාට අද කිසිම වේතනයක් ලැබෙන්නේ නැහැ. මීට අදාළ ලියකියවිලි එක්තරා දිස්ත්‍රික්කයක සහ කාර අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබා ගන්නා ලෙස මෙම ගුරුවරයාට දන්වා තිබෙනවා. ඔහු ඒවා ලබා ගැනීමට එකී සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයට ගිය නමුත් එම ලියවිලි එහි නැහැ. එහෙත්, ප්‍රධාන කාර්යාලයෙන් මේ ගුරුවරයාට ලියා යවා තිබෙන්නේ අසුවල් සමුපකාර සමිතියේ මුදල් වංචා කළ නිසා නුඹේ වැඩ තහනම් කර තිබෙනවාය, යන්නයි. අද මේ ගුරුවරයාට කිසිම පඩි යක් ලැබෙන්නෙත් නැහැ. මේ පිළිබඳව කිසිම විභාගයක් පවත්වලාත් නැහැ. ඔහු සහනයක් ලබා ගන්නේ කොහොමද?

මෙවැනි ප්‍රශ්න ගැන පොදු සේවා කොමිෂන් සභාව ක්‍රියා කරන්නේ මොන පිළිවෙළකටදැයි මා දන්නේ නැහැ. අද බොහෝ දෙපාර්තමේන්තුවල නිලධාරීන් ඇමතිවරුන්ගේ දේශපාලන අදහස් උද හස් උඩ ක්‍රියා කරන බව පෙනෙනවා. ඒකත් එක් පිළිවෙළකට කෙරෙනවා නම් කමක් නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා එතුමා යටතේ තිබෙන දෙපාර්තමේන්තු සම්බන්ධ යෙන් අනුගමනය කරන්නේ එක් ප්‍රතිපත්තියක්. රජයේ මුද්‍රණාලයේ වැඩ වර්ජනය කිරීම නිසා දඩුවම් ලැබූ සේවකයින් සියලු දෙනාම ආපසු සේවයට ගත් බව එතුමා මෙහිදීම ප්‍රකාශ කළා. එතුමා රූකඩ බාස් කෙනෙකැයි මා කීවේ ඒ නිසායි. සේවක යින්ට දඩුවම් පැමිණවීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය ගෙනයන්නේ ඊට වෙනස් ප්‍රතිපත්තියක්. ආණ්ඩුවේ සේවකයන්ගේ වැරදි සෙවීමේදීත් ඔවුන්ට දඩුවම් පැමිණි වීමේදීත් සෑම දෙපාර්තමේන්තුවක්ම එකම ප්‍රතිපත්තියක් අනුව කටයුතු කරන්නට ඕනෑ.

රජයේ සේවකයින්ට දේශපාලන අයිති වාසිකම් දෙන බවට ගරු අගමැතිතුමා පළමුවන රාජාසන කථාවෙනුත් දෙවැනි රාජාසන කථාවෙනුත් පොරොන්දුවක් දුන්නා. දැන් ඒ පොරොන්දුව ගැන වචනයක්වත් මතක් නොකර, සමහර මන්ත්‍රීවරුන්ට ඕනෑ පිළිවෙළටත් එක් සත් ජාතික පක්ෂයේ ශාඛා ලේකම් වරුන්ට හා වෙනත් කේලාම් කාරයින්ට ඕනෑ පිළිවෙළටත් අහිංසක රජයේ සේවකයින්ගෙන් පිළිගන්නවා. මේවාට වග කියන්නේ කවුද? ඇමතිවරුන්ද? පොදු සේවා කොමිෂන් සභාවද? පොදු සේවා කොමිෂන් සභාව දේශපාලන සෑඩ පහරවලින් ඈත් වුණු අපක්ෂපාත මණ්ඩලයක්යයි අද යම් කෙනකු කල්පනා කරතොත්, එය මෝඩකමක්. රජයේ සේවයෙහි යෙදී සිටින උදවියට සාධාරණය යුක්තිය ඉෂ්ට කර ගැනීම සඳහා වෙනත් ක්‍රමයක් පිළිබඳව අපගේ කල්පනාව යොමු කිරීම හොඳයයි මා අදහස් කරනවා. මේවා ගැන වග කිවයුත්තේ කවුරුදැයි මා නොදන්නා නිසා මා ගරු අගමැතිතුමා ගෙන් විශෙෂ ඉල්ලීමක් කරනවා.

රජයේ සේවකයින්ට දේශපාලන අයිතිවාසිකම් දෙන බවට පොරොන්දුවක් ගරු අගමැතිතුමා මේ ගරු සභාවටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

රටටත් රජයේ සේවකයින්ටත් දුන්නා. එවැනි පොරොන්දුවක් දී අවුරුදු දෙකහ මාරක් ගත වුණාට පසු තවමත් ඒ ගැන නිශ්ශබ්දව නොසිට, වැඩ තහනම් කිරීම් ආදියෙන් අද රජයේ සේවකයන්ට සිදු වන අසාධාරණයන් නතර කිරීමට වහාම ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Order, please. The Sitting is suspended for half an hour.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 4.30 ට නැවත පවත්වන ලදි.

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 4.30 P.M. *and then resumed.*

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)

ගරු සභාපතිතුමනි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන වචනයක් දෙකක් කියන්ට මා අදහස් කරනවා. දේශපාලන බලපෑම් නිසා මින් පෙර කිසි කලෙක නොතිබුණු අන්දමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව අපකීර්තියට පත්ව තිබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව පක්ෂ භේද වාදයෙන් තොර වූවක් යයි මා කියන්නේ නැහැ. ඒක නිකම් තිරයක් පමණයි. වැඩි වශයෙන් රාජ්‍ය සේවා කොමිසමට කරන්නෙ දේශපාලන පත්වීම්. සමහරවිට කාලය ඉක්මවා නොගිය තමන්ට පක්ෂපාත නැතැයි හැඟෙන කෙනෙක් සිටිනවා නම් ඔහුගේ කණට කොදුරල කියනවා, තමුන්නාන්සේ අස්වෙලා යන්න කියා. තමන්ට පක්ෂපාත නම් ඔහුගේ කාලය දික් කරනවා. නීතියෙන් කොයි අන්දමට විධිවිධාන සලසා තිබුණත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කර තිබෙන්නේ දේශපාලන පත්වීම් බව පෙනී යනවා.

හුගක් දුරට රජ්‍ය සේවා කොමිෂන් සභාවේ වැඩ කටයුතු දේශපාලන බලපෑම් වලට යටත්ව සිදු වෙන්නෙ කාරණා දෙකක් නිසයි. ගරු අගමැතිතුමා කියා සිටියේ, දේශපාලන බලපෑම් නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හුගක් දුරට අපකීර්තියට භාජන වී තිබෙන බවයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්වාධීන මණ්ඩලයක් වශයෙන් අපි කොයි තරම් හඳුන්වා දුන්නත් ඒක ස්වාධීන මණ්ඩලයක් නොවෙයි. ඒ වගේම, ඒ තත්ත්වය මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව ඇති වුණු තත්ත්වයක් නොවෙයි. අපි අවංකව විමසා බැලුවාම අපට පෙනී යනවා, එක එක ආණ්ඩුවට වුවමනා උදවිය ඒ මණ්ඩලයට පත් කරන බව. මා කලින් කිව්ව වගේ, සමහර විට අහෝසි වී ගිය ආණ්ඩුවකින් පත් කරන ලද කෙනෙක් ඒ කොමිෂන් සභාවේ සිටිනව නම්, ඔහුගේ කණට කොදුරල කියනව, තමුන්නාන්සේ අස්වෙන්න කියා. පක්ෂපාත කෙනෙකු සිටිනව නම් ඔහුගේ කාලය දික් කරනව. මේ ක්‍රමයේ හැටියට ඒ තත්ත්වය ගැන අපට දොස් කියන්ට බැහැ. කටුගම්පොල ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) කිව්ව වගේ, මේ අන්දමේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තිබෙන තුරු එක්තරා අන්දමක රූකඩ නැටුමක් තමයි, මේ මණ්ඩලයේ සිද්ධ වෙන්නෙ.

අද මේ කොමිසමට වැඩි වශයෙන්ම දේශපාලන බලපෑම්වලට යටත් වන්ට සිදු වී තිබෙන්නෙ කාරණා දෙකක් නිසයි. මහ මැතිවරණයට පෙර දේශපාලන පක්ෂ සියල්ලක්ම වගේ කියා සිටියා, ආණ්ඩුවේ සේවකයින්ට දේශපාලන අයිතිවාසිකම් ලබා දෙනවා කියා. එම නිසා කිසි භයක් හෝ සැකක් නැතුව රජයේ සේවකයින් තමන් කැමති පක්ෂවලට ආධාර කළා. මොන පක්ෂය බලයට ආවත් දේශපාලන අයිතිවාසිකම් ලැබෙන නිසා දේශපාලන කටයුතුවල යෙදෙන්ට භය වන්ට වුවමනාවක් නැහැ කියා ඒ උදවිය කල්පනා කළා. එහෙත් මැතිවරණයෙන් පසුව අලුත් ආණ්ඩුවක් ඇති වුණු නමුත් මේ දක්වා රජයේ සේවකයින්ට දේශපාලන අයිතිවාසිකම් ලැබී නැහැ. ඒ වෙනුවට සිදු වුණේ පසුගිය මැතිවරණයේදී විරුද්ධ පාර්ශ්වයේ අපේක්ෂකයින්ට පක්ෂව වැඩ කළ උදවියට දූසමාන ආරංචි උඩ නොයෙක් චෝදනා නහා ඔවුන්ගෙන් සංමහරුන්ගේ වැඩ තහනම් කිරීමත්, සමහරුන් සේවයෙන් අස් කිරීමත් පමණයි. අවංකව අපක්ෂපාතව කල්පනා කර බැලුවාම

Digitized By Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාටත් වැටහෙනවා, මෙවැනි දඬුවම් දී තිබෙන්නෙ පක්ෂග්‍රාහීව බව. ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයින්ට පක්ෂව වැඩ කළ උදවියට දඬුවම් කළේ නැහැ. එවැනි සමහර උදවියට උසස් තනතුරු පවා දුන්න. එවැනි උදවියට සාමදාන විනිශ්චයකාර පදවි පවා දුන් අවස්ථා ගැන අපි දන්නවා. එහෙත් විපක්ෂයට පක්ෂපාතව දේශ පාලන කටයුතුවල යෙදුණු උදවියට දඬුවම් දුන්න. මේ තත්ත්වයට වග කියයුත්තේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි. එහෙත් ඒ කෙමිෂන් සභාවට අපක්ෂපාතව කට යුතු කරන්ට බැරි වී තිබෙන්නේ ඒ උදවියට ලැබී තිබෙන්නෙ දේශපාලන පත්වීම් නිසා දේශපාලන බලපෑම්වලට යටත්ව කටයුතු කරන්ට සිදු වී තිබෙන නිසයි. බොහෝ විට එවැනි දඬුවමක් ලත් කෙනෙක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කෙනෙකුගෙන් ලියුමක් රැගෙන ගියොත් සමාව දීල ඔහුට ආපසු රක්ෂාව දෙනවා. ගුරුවරුන් කීප දෙනකුට ඒ අන්දමට රක්ෂා දී තිබෙනවා. මැතිවරණ කාලයේ විරුද්ධ පාර්ශ්වයේ අපේක්ෂකයන්ට ආධාර කළ නිසා වැඩ තහනම් කර සිටින කෙනෙක් පළාතේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකුගෙන් ලියුමක් ගෙනාවොත් ඔහුට නැවත රක්ෂාව දෙනවා.

ග්‍රාම සේවකවරුන් ගැනත් එවැනිම තත්ත්වයක් තිබෙන්නෙ. ඇමතිතුමා නිතරම කියන්නේ පළාතේ මන්ත්‍රීතුමාගෙන් ලියමනක් අරගෙන ආවොත් බලන්නම් කියායි. එසේ කියා තිබෙන අවස්ථාත්, ඒ අනුව ආපසු සේවයට ගත් ග්‍රාම සේවකයි නුත් ගැන අප දන්නවා. මේ අනුව, මැතිවරණවලදී යම්කිසි දේශපාලන පක්ෂයකට පක්ෂපාතීව වැඩ කළාය කියන ඒ වරද එල්ලකර ක්‍රියා කරන්නෙ සෑම අවස්ථාවකදීම ආණ්ඩුවට වාසි වන ආකාරයටයි. එම නිසා පොදු සේවා කොමිෂන් සභාවටත් අපක්ෂපාතීව වැඩ කරන්නට නොහැකි වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂ බලතල දුන් දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ටත් තම කටයුතු ස්වාධීනව කරගෙන යන්නට නොහැකි වී තිබෙනවා. ජනවාරි 8 වන්දා සිද්ධිය ඒන් සභාවෙනුයි. රජයේ යම් සේවකයකු ගැන බලමු. සමහර දෙපාර්තමේන්තුවල අයට රක්ෂා දී තිබෙනවාය, සමහර දෙපාර්තමේන්තුවල අයට දඬුවම් කර තිබෙනවාය, කියා මට ප්‍රථමයෙන් කථා කළ දකුණු කොළඹ මන්ත්‍රීතුමාත් (බර්නාඩ් සොයිසා මයා.) කියන්නට යෙදුණා. එකම දින, එකම වේලාවක සංකේත වැඩ වර්ජනයකට මේ සේවකයින් සහභාගි වුණා නම්, ඇයි මේ දෙවිධියකට සංග්‍රහ කරන්නෙ? ඒ සංකේත වැඩ වර්ජනයට සහභාගි වීම බරපතළ වරදක්ය කියා ඊට දඬුවම් දිය යුතුය කියා කැබිනට් තීරණයක් ගත්තා නම්, ඒ අනුව ක්‍රියා කරන්නටය කියා පොදු සේවා කොමිෂන් සභාවටත් කියාපෑවා නම් දඬුවම් කරන පිළිවෙලෙත් සාධාරණත්වයක් තියෙන්නට ඕනෑ. කැබිනට් මණ්ඩලය ඒ විධියෙ තීරණයක් අරගෙන ඒ අනුව ක්‍රියා කරන්නටය කියා පොදු සේවා කොමිෂන් සභාවටත් කියාපෑවා නම් එය හරිය කියා මා කියන්නේ නැහැ. එහෙත් කරුණු එසේ සිද්ධ වූ බව අප දන්නවා. එසේ නම් සියලු දෙනාටම එක විධියේ දඬුවමක් දීම, එකම විධියකට සංග්‍රහ කිරීම ආණ්ඩුවේ යුතුකමක්.

ගරු සභාපතිතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලයේ සමහර අයට රක්ෂා දී තිබෙනවා. සමහර අයට රක්ෂා දී නැහැ. බලයේ තිබෙන පක්ෂයේ කෙනෙකුගෙන් ලියමනක් අරන් ආවොත් ඒ අයට රක්ෂා දෙනවා. එවැනි අවස්ථා ගැන අපට දැනගන්නට ලැබී තිබෙනවා. ආපසු රක්ෂාව ලබා ගන්නට නම් එක්කෝ බලයේ සිටින පක්ෂයේ කෙනෙකුගෙන් හෝ බලතල තිබෙන කෙනෙකුගෙන් ලියමනක් අරන් යන්නට ඕනෑ. එහෙම නැත්නම් ඒ අයගෙ වෘත්තීය සංගමයට බැඳෙන්නට ඕනෑ. කුමන ආණ්ඩුවක් යටතේ වුවත් එය සතුටුදායක තත්ත්වයක් නොවෙයි. එවැනි තත්ත්වයක් තිබෙනවා නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වුවත් අපක්ෂපාතී අන්දමින් කටයුතු කරගෙන යන්නට බැහැ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරා තිබෙන්නේ ඉතාම දුෂ්කර වැඩක් බව අප දන්නවා. ඒ කෙසේ වෙතත්, දඬුවම් ලැබූ රජයේ සේවකයකු පිළිබඳව පරීක්ෂණයක් කළාම අවසන් වරට තීරණයක් ලබා ගන්නට තිබෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙනුයි. රජයේ යම් සේවකයකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ඒ අන්දමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළාය කියා සිතමු. රාජ්‍ය සේවා කොමිෂන් සභාව එය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට යවනවා. දෙපාර්තමේන්තු ප්‍රධානියා එය ඊළඟ උප ප්‍රධානියාට යවනවා. උප ප්‍රධානියා ඊළඟ නිලධාරියාට යවනවා. ඔහොම ගිහින් අන්තිමේදී ඒ අභියාචනය අර වරද කළාය කියන නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා ළඟට යනවා. අවසානයේදී ඒ නිලධාරියා තමයි වාර්තාව පිළියෙල කරන්නෙ. ඒ වාර්තාව අර මා සඳහන් කළ විධියටම රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලැබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියා කරන්නේ ඒ වාර්තාව අනුවයි. ඉතින් ඒ අභියාචනය පිළිබඳව කිසිවක් කරන්නට නොහැකිය, දඬුවම වෙනස් කරන්නට පිළිවෙළක් නැත, කියා ලිපියක් එවීම පුදුමයක් නොවෙයි. අපේ කාලයේ සර්වසම්පූර්ණ ක්‍රමයක් තිබුණාය කියා මා කියන්නේ නැහැ. අප කවුරුත් ඉගෙන ගන්නවා. පසුගිය කාලයේ තිබුණු වැරදි හා අත්දැකීම් අනුවයි අපට කථා කරන්නට සිද්ධ වී තිබෙන්නෙ. රජයේ සේවකයින් ඉදිරිපත් කරන අභියාචනා සම්බන්ධව මේ අවස්ථාවේදී මා ගරු අගමැතිතුමාගෙනුත් ගරු මුදල් ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. මේ අභියාචනා ගැන පරීක්ෂණ පවත්වන්නට වෙනම ස්වාධීන අභියාචනා මණ්ඩලයක් පත් කරන්න. පොදු සේවා කොමිෂන් සභාවේ බලතල වෙනස් කරන්නට බැරි නම්, ඒ බලතල එහෙමම තිබියදී ස්වාධීන අභියාචනා මණ්ඩලයක් පත් කරන්න.

ඊළඟට විශේෂයෙන්ම පහළ ශ්‍රේණිවලට අයත් සේවකයින්ගේ උසස් කිරීම් ගැනත් මා වචනයක් සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන්ම ලිපිකරු මහත්වරුන්ගේ උසස්කිරීම් පිළිබඳව නියම ප්‍රතිපත්තියක් නැහැ. උසස්කිරීම් පිළිබඳව අභියාචනා හා දුක්ගැනවිලි විශාල වශයෙන් ගරු මුදල් ඇමතිතුමාට ලැබෙනවා ඇති. අපේ කාලයේත් එවැනි තත්ත්වයක් තිබුණා. අද සිද්ධ වෙන්නෙ කුමක්ද? ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ රෙකමදාරුව උඩයි උසස්වීම් කෙරෙන්නේ. යම් සේවකයකු ටිකක් වැඩ ගත්—ඒ කියන්නෙ ටිකක් බලවත්—නිලධාරියකු යටතේ සිටිනවා නම්, අනිත් අයට වඩා ඉක්මණින් ඔහුට උසස් වීමේ අවස්ථාවක් ලැබෙනවා. සමහර විට භාණ්ඩාගාරය කිට්ටුවෙන් ආශ්‍රය කරන නිලධාරියකු යටතේ සිටිනවා නම් උසස් වීමේ අවස්ථාවක් ලබා ගන්නට පුළුවනි. එවැනි තත්ත්වයක් තිබෙන්නෙ. එම නිසා මේ උසස්කිරීම් පිළිබඳව පොදු ප්‍රතිපත්තියක්, පොදු වැඩ පිළිවෙළක්, අවශ්‍යයි. විශේෂයෙන්ම පහළ ශ්‍රේණිවල සේවකයින්ගේ උසස්කිරීම් පොදු ප්‍රතිපත්තියක් උඩ කරනවා නම් සාධාරණ අන්දමට ඒ කටයුතු කරනවාය කියා පිළිගන්නට පුළුවන් වෙනවා. මේ අවස්ථාවේදී එපමණයි මා මතක් කරන්නෙ.

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)

(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகல வத்தை)

(Dr. Colvin R. de Silva—Agalawatta)

ගරු සභාපතිතුමනි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව කරුණු දෙකක් මතක් කිරීමටයි, මා නැගිට සිටියේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ක්‍රියා කලාපය ගැන රට පුරා විශාල කලකිරීමක් ඇති වී තිබෙන බව මා මුලින්ම ප්‍රසිද්ධියේ කියන්නට කැමතියි. එය කවුරුත් නොදන්නා දෙයක් නොවෙයි. එයට හේතූන් අද පැවැත්වුණු තවත් කථාවලින් තරමක් දුරට ඉදිරිපත් වුණු නිසා මා ඒ ගැන වැඩි දුර විස්තර කරන්නට බලාපොරොත්තු වන්නෙ නැහැ. එහෙත් අපේ දකුණු කොළඹ මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) විසින් මතක් කරන ලද එක කාරණාවක් වෙනත් විධියකට මතක් කළොත් එය වරදක් නොවේය කියා මා කල්පනා කරනවා.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සිටින් නාවූ එක් සාමාජිකයකුගේ බිරිඳ 1965 මාර්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් පැල්මඩුල්ල ආසනයට ඉදිරිපත් වුණු බව කවුරුත් දන්නා දෙයක්. ඒ නෝනා මහත්මිය එසේ කිරීම ගැන මගේ කිසි විරුද්ධත්වයක් නැහැ. ඒ ගැන වරදක් කියන්නට මා උත්සාහ කරන්නේ නැහැ. එසේ දේශපාලනයට බැසීමට අයිතියක් ඒ මහත්මියට තියෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ. එහෙත් ඒ සම්බන්ධව එක්තරා කාරණයක් සහ එයින් මතු වන තත්ත්වය මා මතක් කළ යුතුයි. ඒ මහත්මයාගේ මැතිණිය ඒ අන්දමට ක්‍රියාත්මක අන්දමින් දේශපාලන යෙහි යෙදෙන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සිටින්නාවූ ඒ මහතාගේ ක්‍රියා කලාපය ගැන පිටස්තර අයට විශ්වාසයක් තබන්නට පුළුවන් වන්නේ කෙසේද? එය වඩා තදින් නොකියා මේ විධියට මතක් කරන්නට මා කැමතියි.

එක්තරා කාලයකදි මා වගකීමක් ඇතිව ප්‍රසිද්ධියේ කියා සිටියා, අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා සිය තනතුරෙන් අස් වුණායින් පසුව වුණත් පක්ෂ දේශපාලනයට බැසීමෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තත්ත්වයට සහ ඒ සම්බන්ධව රටේ තිබෙන පිළිගැනීමට පහරක් වදින බව. මා එය අවංකව විශ්වාස කරන නිසයි, ඒ කාලයේ කීප වරක්ම එය ප්‍රසිද්ධියේ කියා සිටියේ. එම ප්‍රතිපත්තිය ම මේ ප්‍රශ්නයටත් අදාළ වන බව අවංකව විශ්වාස කරන නිසයි, මා මේ අවස්ථාවේදි මේ කාරණය මතු කළේ. මගේ විශ්වාසයේ හැටියට නම් ඒ තත්ත්වය අනුව ඒ මහත්මයාට යුතුකමක් තියෙනවා, අපේ රටේ ප්‍රසිද්ධ කටයුතුවල පිරිසිදුකම ආරක්ෂා කිරීම පිණිස තම තනතුරෙන් ඉල්ලා අස් වීමට.

අ. භා. 4.45

ඒ සමගම, පොදු සේවා කොමිෂන් සභාවේ ක්‍රියා කලාපයට වෙනින් පැත්තකින් සම්බන්ධවන කාරණයක් ගැන මතක් කරනවා. එනම්, එක්තරා වෘත්තීය සමිතියක නිලධාරියකුගෙ ප්‍රශ්නය මගින් ඊට වඩා පුළුල් ප්‍රශ්නයක් ගැන කරුණු දැක් වීමට මා අදහස් කරනවා. ගරු සභාපතිතුමනි, රත්මලානේ දුම්රිය වැඩ පොලේ ප්‍රධාන වෘත්තීය සමිතියේ—ප්‍රධාන වෘත්තීය සමිතිය බවට කිසිම අනුමානයක් නැහැ—සභාපතිතුමා මෑතකදී රක්ෂා වෙන් අස්කර දමා තිබෙනවා, පොදු සේවා කොමිෂන් සභාවෙ අනුමැතියද ඇතුව. මෙසේ අස් කළේ ජනවාරි 8 වනදා සිද්ධිය නමින් හැඳින්වෙන්නාවූ සිද්ධියට ඔහුගේ ඇති සම්බන්ධකමක් උඩය කියා මා දන්නවා. එපමණක් නොවෙයි, ඔහුට විරුද්ධව ඉදිරිපත් කර ඇති චෝදනා මොනවාද කියාත් මා දන්නවා. නමුත් මෙතැනදි මා මතු කරන්න යන්නෙ ඒ පුද්ගලයාට පමණක් සීමා නොවන වැදගත් ප්‍රශ්නයක්.

මෙම වෘත්තීය සමිතියේ සභාපතිතුමා එක්තරා පත්‍රිකාවක්, එක්තරා ඉල්ලීමක් අඩංගු පත්‍රිකාවක් විසුරුවා හැරියාය කියන චෝදනාව උඩයි වැරදිකාරයා හැටියට තීරණය කළේ. නමුත් ඔහු එසේ කළේ ඔහුගේ සමිතියේ නියමය සහ තීන්දුව අනුව බවට කිසිම අනුමානයක් නැහැ. එය ආණ්ඩුවත් පිළිගන්නවා. එසේ තිබිය දීයි ඔහු සේවයෙන් අස් කළේ. සභාපතිවරයා වශයෙන් එම සමිතියේ වැඩ කටයුතුවල යෙදෙන්න ආණ්ඩුවෙන්ම අවසර දී තිබුණා පමණක් නොවෙයි, තම රාජකාරියෙන් වෙන්වී, ඒ වායේ යෙදෙන්නේ නැතුව, ඒ වායින් තොරව, වෘත්තීය සමිති නිලධාරියකු වශයෙන් ක්‍රියා කරන්න ඉඩ දී තිබුණා. ඔහුගේ පඩියෙන් කොටසක් ගෙවීම, ආණ්ඩුවෙන්ම වෘත්තීය සමිතියට බාර කළා පමණක් නොවෙයි, එසේ ගෙවීමට සමිතිය භාර ගත්තා. ඒ අනුව සමිතිය විසින් ගෙවීම කරගෙන ගියා. පොදු සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතුව, ආණ්ඩුවේ අවසරය ඇතුව, වෘත්තීය සමිතියේ පඩිකාරයකු වශයෙන් එම තනතුර දරාගෙන සිටියා. එවැනි තනතුරක් ආණ්ඩුවේ අවසරය ඇතුව දරාගෙන සිටි කෙනෙකුට එම වෘත්තීය සමිතියේ තීන්දු සහ නියමයන් පිළිපදින්න සිදු වන බව එසේ අවසර දුන්නාවූ එම පොදු සේවා කොමිෂන් සභාවත් ආණ්ඩුවත්, දෙපාර්තමේන්තුවත් මුල සිටම දැනගෙන සිටි කාරණයක්. ඔහු දරා සිටින තත්ත්වය අනුව යම්කිසි ක්‍රියාවක් කරන්න සිදු වුණි නම්—ඔහුගේ ක්‍රියාව ගැන ආණ්ඩුව විරුද්ධ වුණු බව, කෝපයට පත් වුණු බව ඇත්ත—ඔහු සමිතියෙන් කළ නියමයන් අනුව එම ක්‍රියාවෙහි යෙදුණා නම්, එවැනි ක්‍රියාවක් කළාය කියා තමන් දරන රජයේ තනතුරෙන් අස්කර දැමීම ඉතාමත් අයුක්ති සහගත ක්‍රියාවක් බව මෙහිදී කියන්න සිදු වී තිබෙනවා. මේ අන්දමට. ආණ්ඩුවේ කැමැත්ත සහ එකඟත්වය ඇතුව ඔහු සමිතියේ නියමයන් සහ තීන්දු ක්‍රියාත්මක කළ බව මා ඉතා ඕනෑ කමින් ගරු අගමැතිතුමාට මතක් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

දෙන්න කැමතියි. ඇත්ත වශයෙන්ම, පොදු සේවා කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති අනුව නම් කාටවත් ඇඟිලි ගසන්න පුළුවන් කමක් නැහැ. ඒ වුණාට ක්‍රියාව අනුව නම් ඇඟිලි ගැසෙන බව මුළු ලෝකයම දන්නවා.

ඒක පැත්තකින් තබමු. ගරු අග්‍රාමාත්‍ය තුමාටත් මෙතන භාර වන කටයුත්තක්, කර්තව්‍යයක් තිබෙනවා. නිසි තැන, නිසි විධියට, මිත්‍රත්වයෙන්, ඒ ගැන එතුමාගෙන් වචනයක් කියා වුණොත් මෙවැනි වැරදිවත් ටිකක් හරිගස්සා ගන්නට පුළුවන් වෙතැයි මා විශ්වාස කරනවා. මේ විධියට, ආණ්ඩුවේ යම්කිසි පිළිගත් ප්‍රතිපත්තියක් සහ වැඩ පිළිවෙළක් අනුව ආණ්ඩුවේ සේවකයන්ගේ නොයෙක් වෘත්තීය සමිතිවල ආණ්ඩුවේ අවසරය ඇතිව ඒ වෘත්තීය සමිතියේ පඬිකාරයින් වශයෙන් තමන්ගේ පඬියෙන් කොටසක් ආණ්ඩුව විසින් නොගෙවාම තනතුරු දරණ වැදගත් පිරිසක් සිටිනවා. ඒ විධියට නිදහස් කිරීමේ ප්‍රමාණයටම ආණ්ඩුව විසින්ම පිළිගන්නාවූ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් හැටියට ඒ වෘත්තීය සමිති ව්‍යාපාරයේ මුළු කාලය යොදා ආණ්ඩුවේ සේවකයන්ට වැඩ කිරීමට වෙනත් විධියක් නැති බව පිළිගන්නට ඕනෑ. නොයෙක් පත්‍රවලිනුත්, වෙනත් නොයෙක් පැතිවලිනුත් අපට කියනවා, වෘත්තීය සමිතිවලට කියනවා, ඒ වෘත්තියේ වැඩ කරන්නාවූ අය ගෙන් පිටස්තර අය වෘත්තීය සමිතිවලට —ඒවායේ වැඩවලට—ඇතුළුවීම වැරදිය, නුසුදුසුය, අයෝග්‍යය, නරකය යනාදි වශයෙන්. එහෙත් මෙහිදී එකක් මතක් කරන්නට කැමතියි. ඕනෑම සමිතියක යම් කිසි කෙනකු යටතේ වැඩ නොකරන කෙනකුට තනතුරක් දරන්නට පුළුවන් නම්, ඒ සමිතියටත් විශාල ආරක්ෂාවක් එයින් ලැබෙනවා. අද ලංකාවේ නොයෙක් ප්‍රබල සමිති තිබෙනවා. ඒ විධියට, ඒ වෘත්තියට අයිති නැති අය සිටින නිසා තමයි ඒ සමිතිවලට එවැනි ශක්තිමත් තැනකට එන්නට පුළුවන් වුණේ. කාටවත් ඒ නිලධාරියාගෙන් පළිගන්නට බැරි නිසා තමයි එවැනි ශක්තිමත් තැනකට එන්නට පුළුවන් වුණේ. දැන්, මෙතන, ආණ්ඩුවේ සේවකයන් නොයෙක් නීතිරීති වලින් බැඳී සිටින නිසා තමයි මේ ප්‍රතිපත්තිය, මේ ක්‍රියා පිළිවෙළ ආණ්ඩුව විසින් පිළිගෙන තිබෙන්නේ. කෙනකු ඒ ප්‍රමාණයට තාවකාලිකව ආණ්ඩුවේ සේවයෙන් නිදහස් කරන බවයි නීත්‍යනුකූලව කල් පනා කර බලනවා නම් පෙනී යන්නේ. ඒ නිසා එවැනි තත්ත්වයක් යටතේ ක්‍රියා කළ කෙනකු, තමා කළ ඒ ක්‍රියාව නිසා සම්පූර්ණයෙන්ම සිය රක්ෂාවෙන් අස් කර දමනු ලැබීම වැරදි බව සාධාරණ යුක්තිය ගරු කරන කවුරුනුත් පිළිගනු ඇතැයි මා විශ්වාස කරනවා. ඒ මගේ විශ්වාසයයි.

තුන්වැනි කාරණය මෙයයි: අපේ ගරු අගමැතිතුමා විසින්ම ගිය අවුරුද්දේදී කරන ලද ප්‍රකාශයකින්ම මා එය ඉදිරිපත් කරන්නට ඕනෑ. එතුමා කළ ප්‍රකාශයකින්ම මේ අයවැය ලේඛනයේ කාරකසභා අවස්ථාව පටන් ගන්නට කැමතියි. පසුගිය වාරයේ—පසුගිය අවුරුද්දේ—අගෝස්තු මාසයේ 19 වැනිදා ගරු අගමැතිතුමා කියා සිටි ආකාරය **හැන්සාඩ්** නිල වාර්තාවේ 222 වැනි තීරයේ සඳහන් වෙලා තිබෙන්නේ මෙසේයි:

"රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන දැන් තිබෙන තත්ත්වය අසතුටුදායක බව හුඟ දෙනෙක් පිළිගනු ඇතැයි මා හිතනවා."

මෙය වැරදි ලෙස තෝරන්නට මා උත්සාහ කරනවා නොවෙයි. යම් කාරණයක් මතු කරන්නට එතැනින්ම පටන් ගත්තොත් මට ලෙහෙසියි.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Is the hon. Member going to speak for a long time more ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

No, Sir. I believe the time the Question will be put to the Vote is 5 P.M. Maybe, I will overshoot it by a couple of minutes, but this is a matter of some importance and I wish to deal with it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු අගමැතිතුමා විසින්ම මතු කරන ලද ප්‍රශ්නය අනුව පොදු සේවා කොමිෂන් සභාව මෙම ගරු සභාවට හෝ වෙනත් කොතැනකට හෝ කිසි වගකීමක් නැති බව මට මෙතැනින් ඔප්පු වෙනවා; මා විශ්වාස කරනවා. අප මෙතැන සිට පොදු සේවා කොමිෂන් සභාවේ වැඩ කටයුතු ගැන කොතරම් සාකච්ඡා කළත් ඒ සාකච්ඡා නැසෙන්නා සේ වැඩ කටයුතු කරගෙන යන්නට එයට බලය තිබෙනවා. ඇත්ත ඒකයි. ගරු අගමැතිතුමා ගිය වාර යේදී කී අන්දමට අප කවුරුනුත් පොදු සේවා කොමිෂන් සභාවේ ඇති දුර්වලකම් ගැන දන්නවා නම්, ඒ දුර්වලකම් පිළිගන්නවා නම්, එය සංශෝධනය කිරීම පිණිස අවකාශයක් හා ඉඩ ප්‍රස්තාවක් ලැබෙන්නට ඉඩ තිබෙන අර විශේෂ කාරක සභාවෙහි හෙවත් "සිලෙක්ට් කොමිටි" එකෙහි වැඩ කරන්නට විරුද්ධ පාර්ශ්වය එකඟ නොවන්නේ මන්දැයි ප්‍රශ්නයක් ඉදිරිපත් වන්නට පුළුවනි. ඒ ගැන වචනයක් කීමට මා කල්පනා කරනවා. මුලින්ම මතක් කළ යුතු දෙයක් තිබෙනවා. දැන් මතක් කිරීමේ පුරුද්ද අත්හැර දමාගෙන යන නිසයි, මා ඒ ගැන අමුතුවෙන් කීවේ. මගේ විශ්වාසයත්, මා අයත් පක්ෂයේ විශ්වාසයත් මුළු විරුද්ධ පාර්ශ්වයේ විශ්වාසයත් වන්නේ මෙම පොදු සේවා කොමිෂන් සභාව කියන්නා වූ ව්‍යවස්ථානුකූලව ඇති කර තිබෙන මණ්ඩලය සම්පූර්ණයෙන්ම නැති භංග කිරීම අවශ්‍ය බවයි. සම්පූර්ණ විස්තරයක් නොදී මම ඊට වැදගත් හේතුවක් ඉදිරිපත් කරන්නම්.

මේ රටේ රජයේ පාලන යන්ත්‍රයට ඕනෑම පුද්ගලයකු ඇතුළු වෙනවා නම් පත් කර ගන්නවා නම් ඒ ඇතුළු වීම හෝ පත් කර ගැනීම පිළිබඳව මෙම ගරු සභාවට වගකිව යුත්තකු සිටිය යුතුයි. එසේ නැත්නම් මෙම ගරු සභාව මගින් මේ රටේ ජනතාවට එය පාලනය කිරීමේ අයිතිවාසිකම් නැති වෙනවා. අගමැතිවරයාට හෝ වෙන ඇමතිවරයකුට හෝ ඒ පිළිබඳව නීතියෙන් යම් යම් සීමාවල් ඇති කළහොත් ඔහුට මෙතැනදී ඒ ගැන වග කියන්නට පුළුවනි. ඒ පිළිබඳව වග කියන්නට පුළුවන් ඇමතිවරයකු මෙතැන සිටිය යුතුයි. අපට වුවමනා කරන්නේ අන්න ඒ වගේ ව්‍යවස්ථාවක්. පොදු සේවා කොමිෂන් සභාව ඇති කරන ලද්දේ අප යටත් විජිතයක් වශයෙන් පවතිද්දී බව අපි මතක තබා ගනිමු. අපේ රටේ පළමුවැනි පාර්ලිමේන්තුවේ අගමැතිවරයා වශයෙන් සිටි ඩී. එස්. සේනානායක මහතා සහ ඔහුගේ කණ්ඩායමත් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීනුත් අතරේ සෝල්බරි ව්‍යවස්ථාව ඇති කර ගැනීම සඳහා පැවැත්වුණු සාකච්ඡාවලදී ඇති කර ගන්නා ලද එක ගනුදෙනුවක් තමි මෙම පොදු සේවා කොමිෂන් සභාවයි. ඒ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් ගනුදෙනු ඇති වූ බව මුළු රටම දන්නවා; මුළු ලොවම දන්නවා. මිලිටරි ප්‍රශ්නය ගැන, විදේශික ප්‍රශ්නය ගැන තව එවැනි නොයෙක් නොයෙක් ප්‍රශ්න ගැන නොයෙක් නොයෙක් ගනුදෙනු ඇති වුණා. ඒ වාගේම බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ආණ්ඩුව යටතේ මේ රට යටත් විජිතයක් වශයෙන් පාලනය කිරීමට ඒ විදේශික ආණ්ඩුව විසින් ඇති කරන ලද පාලන යන්ත්‍රයේ තිබුණු විශේෂ අයිතිවාසිකම් ආරක්ෂා කරගෙන ඒවා නිදහස් යුගයටත් දික්ගැස්සීම සඳහා ඇති වූ ගනුදෙනුවක එක ප්‍රතිඵලයක් මෙය බව අප කල්පනා කරන්නට ඕනෑ. අප දැන් මෙය ඉතිහාසයෙන් හොඳාකාර දන්නවා. මෙය නිදහස් රටක් නම් සර්වජන ඡන්ද බලය පාවිච්චි කරමින් මේ රටේ ඡන්දදායකයන් විසින් පත් කරනු ලබන ආණ්ඩුවකින් ඒ ජනතාව ආරක්ෂා කිරීම පිණිස විශේෂ ආරක්ෂාවක් ඒ අනෙක් ආණ්ඩුවකින් තිබෙන්නට ඕනෑ යයි මට නම් කිසිසේත්ම පිළිගන්නට බැහැ.

අ. භා. 5

එය මට නම් කිසිසේත් පිළිගන්නට බැරි තර්කයක්. නොයෙකුත් විධියේ සංවර්ධන කටයුතු කිරීම උදෙසා අළුත් විධියේ පාලන යන්ත්‍රයක් සහ අළුත් ආකාරයේ ගතිගුණ හා අළුත් විධියේ ස්වභාවයන් ඇති නිලධාරී පිරිසක් අවශ්‍ය කරන මේ කාලයේ නිසි වේලාවට නිසි විදියට මේ ගරු සභාවට පමණක් වග කීමක් ඇතුව, එමගින් රටට වගකීමක් ඇතුව, තමන්ගේ රටට වුවමනා කරන නිසි නිලධාරීන් සොයා ගන්නටත්, නොනිසි නිලධාරීන් අයින් කරන්නටත්, නිසි නිලධාරීන් නිසියාකාරයෙන් එහා මෙහා කරන්නටත් මෙම ගරු සභාවටත් ආණ්ඩුවලින් බලය තියෙන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා]

ගරු අගමැතිතුමාගේ එදා තර්කය වූයේ මෙයයි: "සිලෙක්ට් කොමිටියට ඇවිල්ලා මේවා ගැන සාකච්ඡා කර තෝරා බේරා ගෙන සංශෝධනය කරන්නට පුළුවන් නේද? තමුන්නාන්සෙලායි, මේකට අපට ඉඩ නොදෙන්නේ." තර්කයට තර්කයක් ඉදිරිපත් කළ යුතු නිසයි, එතුමාගේ එම ප්‍රකාශය මා සඳහන් කළේ. අද මේ රටේ පවත්නා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ඒ ඒ අංශ එකින් එක වෙන් කරගෙන තනි තනිව කල්පනා කර විසඳන්නට බැහැ. එය, අන්‍යොන්‍ය සම්බන්ධකම් ඇති අංශ කීපයක්. එක්තරා රාමුවක් තුළ ඇති කරන ලද ව්‍යවස්ථාවක්. එම රාමුවෙහි එක් කොණක් පමණක් සංශෝධනය කළාට මොකද, එම කොටසවත් නිසියාකාර ක්‍රියාවේ යොදවන්නට බැහැ. ඊට හේතුව, එහි අනෙක් කොටස් එම කොටසට බල පාන නිසයි. නිදහස් රටකට අවශ්‍ය ව්‍යවස්ථාවක් වශයෙන් මෙය මුල සිටම සංශෝධනය කිරීමෙන් නොව, අළුතින් සකස් කිරීමෙන් නිසියාකාර ව්‍යවස්ථාවක් ඇති කළ යුතුය යන්නයි, අපේ විශ්වාසය.

noolaham.org | aavanaham.org

[ගරු ඩඩ්ලි සේනානායක]

Auditor-General, and answerable only to this House. Therefore, it would be desirable if hon. Members make their suggestions direct to the Commissioner of Parliamentary Elections, as they have done.

In regard to some of the other matters hon. Members have commented on, I too would like to say a few words.

I think the hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) spoke about the instructions issued to gramasevakas. The law, I think, contemplates a person who is "ordinarily resident". Clear directions are given as to what is meant by "ordinarily resident". I have myself had many complaints from various Members that the manner in which this term is interpreted by the gramasevakas would result in many people losing their vote. I understand that in some places persons who do not reside there for two or three nights are left out.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

On the date of the enumeration.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

There was one case where on the date of the enumeration he was not there.

ආර්. ජේ. ජී. ද මැල් මයා. (දෙවිනුවර)
(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)
(Mr. R. J. G. de Mel—Devinuwara)

If on the date the gramasevaka physically goes there a person is not there he is left out.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

I personally think the easiest way to rectify this would be to fix a day, as we do in the case of the census. On the day we take the census we see that everybody is in his residence. Make it a holiday, if you want.

එස්. කේ. කේ. සූරියාරච්චි මයා. (මහර)
(திரு. எஸ். கே. கே. சூரியாரச்சி—மகற)
(Mr. S. K. K. Suriarachchi—Mahara)

That is the present law.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

As in the case of a census, if a day is declared a holiday and everybody is present at the place where he is ordinarily resident, the problem will be solved. We might think about that suggestion. There is a Select Committee that is going into the matter and they will consider this point, too.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

May I bring to the notice of the Hon. Prime Minister one specific point? At the moment, revision is taking place. That is the list for 1967. Now, according to the law, a person who has lived continuously at a given place before 1st June 1967 should automatically have his name in the list. But do you know how the gramasevakas are doing it ? They are taking into account the fact that the person is employed somewhere else and comes home only for the week-end. This is having a destructive effect.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

That has happened. That is the complaint. Many people who have found jobs outside have been left completely out.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

This is a new interpretation, because in the past the same law applied and we did not have these difficulties. We did not have this problem in the past. This is a new interpretation and it is causing tremendous confusion all over the country.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"12 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය සඳහා රු. 8,90,854ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

12 වන ශීර්ෂයෙහි 1 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"12 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம், ரூ. 8,90,854 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினை விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

12 ஆம் தலைப்பு, 1 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 890,854 for Head 12, Vote No. 1, be inserted in the Schedule", put, and agreed to.

Head 12, Vote 1, ordered to stand part of the Schedule.

2 වන සම්මතය.—පාලන ගාස්තු—පුනරාවර්තන වියදම්, රු. 21,18,501

வாக்குப்பணம் இல. 2.—பரிபாலனச் செலவுகள்—மீண்டுவரும் செலவு, ரூ. 21,18,501

Vote No. 2.—Administration Charges—Recurrent expenditure, Rs. 2,118,501

"12 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය සඳහා රු. 21,18,501ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

12 වන ශීර්ෂයෙහි 2 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"12 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் ரூ. 21,18,501 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினை விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

12 ஆம் தலைப்பு, 2 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 2,118,501 for Head 12, Vote No. 2, be inserted in the Schedule", put, and agreed to.

Head 12, Vote 2, ordered to stand part of the Schedule.

3 වන සම්මතය.—පාලන ගාස්තු—මූලධන වියදම්, රු. 40,000

வாக்குப்பணம் இல. 3.—பரிபாலனச் செலவுகள்—ஆக்கப்பொருட் செலவு, ரூ. 40,000

Vote No. 3.—Administration Charges—Capital expenditure, Rs. 40,000

"12 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය සඳහා රු. 40,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

12 වන ශීර්ෂයෙහි 3 වන සම්මතය උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

"12 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் ரூ. 40,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினை விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

12 ஆம் தலைப்பு, 3 ஆம் வாக்குப்பணம் அட்டவணையில் இணையப் பணிக்கப்பட்டது.

Question, "That the sum of Rs. 40,000 for Head 12, Vote No. 3, be inserted in the Schedule", put, and agreed to.

Head 12, Vote 3, ordered to stand part of the Schedule.

අ. භා. 6

14 වන ශීර්ෂය.—රාජාරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා

1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩි කඩ සහ අනිකුත් දීමනා, රු. 4,08,51,757

14 ஆம் தலைப்பு.—பாதுகாப்பு, வெளிநாட்டலுவல்கள் அமைச்சர்

வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூ. 4,08,51,757

HEAD 14.—MINISTER OF DEFENCE AND EXTERNAL AFFAIRS

Vote No. 1.—Personal emoluments and other allowances of staff, Rs. 40,851,757

ආචාර්ය එන්. එම්. පෙරේරා

(கலாநிதி என். எம். பெரேரா)

(Dr. N. M. Perera)

I move,

"That the Vote be reduced by Rs. 10."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රත්නායක මයා.
(திரு. ரத்னயக்க)
(Mr. Ratnayake)

ගරු සභාපතිතුමනි, අගමැතිතුමා යටතේ තිබෙන මෙම වැය ශීර්ෂ යටතේ එන අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ වැය ශීර්ෂය ගැන වචනයක් දෙකක් මතක් කරන්නට කැමතියි.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

There is a separate Head for it.

රත්නායක මයා.
(திரு. ரத்னயக்க)
(Mr. Ratnayake)

It comes under Head 14, Vote No. 5, I think.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is a matter that we may have to discuss. I do not know whether it is not wiser for us to do so now. Under the Head, "Minister of Defence and External Affairs", we have got a large number of items. They relate to the Army, the Navy and the Air Force, the Department of External Affairs Abroad, and also to this question of the Anuradhapura Preservation Board. It is better for us to have a full discussion on all these items and then let the Prime Minister reply to the points that we have raised.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

It that agreed ?

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)

Yes.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Shall we discuss the Votes under the Ministry of Defence and External Affairs ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

He is taking—

පොන්නම්බලම් මයා.
(திரு. பொன்னம்பலம்)
(Mr. Ponnambalam)

And at the end of it we never get answers to the questions raised. In fairness to everybody concerned may I suggest three broad heads: Defence, External Affairs, and the Anuradhapura Preservation. They can be disposed of separately. Then there will be some kind of coherence.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

If there is any question that is not answered any Member can raise it again.

පොන්නම්බලම් මයා.
(திரு. பொன்னம்பலம்)
(Mr. Ponnambalam)

I think it is more satisfactory to confine ourselves to the Defence and External Affairs Ministry.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

There is another advantage that the hon. Member does not realize. We have got a limited time and each Member would like to say something when he gets a chance of doing so, and then the Hon. Prime Minister can reply. Otherwise, one particular item will get all the time. Supposing you start discussing the External Affairs Ministry, and the question of the Anuradhapura Preservation Board gets knocked off altogether ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

If there is any point that has not been answered it can be repeated and the Prime Minister can reply.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

So prominent a Member of the Government should have faith enough that the Prime Minister will reply to his questions.

පොන්නම්බලම් මයා.
(திரு. பொன்னம்பலம்)
(Mr. Ponnambalam)

I am afraid I am not going to be baited so easily. It is not a question of faith. It is physically just impossible to keep track of a whole lot of questions on various matters with no connection between one and the other. May I raise this question of allocation to the Army ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We have already started.

රත්නායක මයා.
(திரு. ரத்னயக்க)
(Mr. Ratnayake)

I stopped because you wanted—

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Before we proceed, is the House agreed that we discuss all these items together and thereafter let the Hon. Prime Minister reply ?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

What are the items ? I want to be clear on that point.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We take up External Affairs, then Defence—it includes Army, Navy and the Air Force—and pass on to Police, Immigration and Emigration, and the Anuradhapura Preservation Board——

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)

What about planning ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We have got time allocated for that.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Shall take up Heads 14 to 17 ?

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Head 17 also.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Then shall we take up all the Heads from 14 to 18 ?

ගරු මන්ත්‍රීවරු
(கௌரவ அங்கத்தவர்கள்)
(Hon. Members)

Yes.

අ. භා. 6

රත්නායක මයා.
(திரு. ரத்னயக்க)
(Mr. Ratnayake)

ගරු සභාපතිතුමනි, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ගැන වචනයක් දෙකක් මතක් කරන්ට තිබෙනවා. 1961 දී එකට තිබුණු ආණ්ඩුව මේ මණ්ඩලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

පිහිටෙව්වෙ යම්කිසි කාලසීමාවක් ඇතුළත මේ පූජනීය නගරය සංරක්ෂණය කරන ගමන්ම නව නගරයත් සාදා අවසාන වීමෙන් පසුව මණ්ඩලය විසුරුවා හැර නැවතත් මහජනයාගේ අයිතිවාසිකම් ලැබෙන පරිදි නගර සභාවක් ඇති කිරීමේ බලාපොරොත්තුව උඩයි. ඒ අනුව 1961 සිට 1964 දක්වා කාලය තුළ මේ සංරක්ෂණ මණ්ඩලය මගින් විශාල වැඩ කොටසක් ඉටු කර තිබෙන බව අප කවුරුත් අවිවාදයෙන් පිළිගන්නවා. එහෙත් ගත වූ අවුරුදු 2½ තුළ මේ සංරක්ෂණ මණ්ඩලයේ කටයුතු ගැන අපගේ කණගාටුව ප්‍රකාශ කරනවා. මේ කාලය තුළ ගරු අගමැතිතුමා කීප වරක් අනුරාධපුරයට ගියත් සංරක්ෂණ මණ්ඩලයේ වැඩ කටයුතු පිළිබඳව කිසියම් අවබෝධයක් ලබා ගන්ට එතුමාට වෙලාවක් නොතිබෙන්න ඇති. පූජනීය පෙදෙසින් මහජනයා නව නගරයට ඉවත් කිරීමේ වැඩ පිළිවෙළ තවමත් ඒ විධියටම තිබෙනවා. පූජනීය නගරයෙන් ඉවත් කරන පුද්ගලයින් නව නගරයේ පදිංචි කරවීම සඳහා නිවාස සහ කඩ සාප්පු සෑදීමේ වැඩ පිළිවෙලක් 1964 දෙසැම්බර් මාසයේ යම් තරමකට නිම වී තිබුණ නම් තවමත් ඒ වැඩ පිළිවෙළ ඒ තත්ත්වයේමයි පවතින්නෙ.

ගරු සභාපතිතුමනි, සංරක්ෂණ මණ්ඩලයේ සේවය කරන නිලධාරීන්ගේ වැටුප් ගෙවීම සඳහා මාසයකට රුපියල් 80,000 කට වැඩි මුදලක් රජයට වියදම් වෙනවා. දවසකට පැය 2 ක් විතර වැඩ කරන අපේ සභාපතිතුමා මේ ගණයට ඇතුළත් වෙන්නෙ නැහැ. මා උන් නැහේට දොස් කියන්නෙ නැහැ. උන්නැහේ වෘත්තියෙන් පෙරකදෝරු මහත්මයෙක්. උන්නැහේ වැඩි කාලයක් උසාවියේ ගත කරන අතර සංරක්ෂණ මණ්ඩලයේ කටයුතු සඳහා ගත කරන්නෙ පැය 2 ක විතර සුළු කාලයක්. ඒ වෙනුවෙන් එතුමාට මාසයකට රුපියල් 750 ක් ගෙවනවා. ගමන් වියදම් හැටියට තවත් රුපියල් 250 ක් ගෙවනවා. මට ආරංචියි මෑතක සිට උන්නැහේට "එන්ටර්ටේන් මන්ට් ඇලවන්ස්" හෙවත් මහජනයාට සංග්‍රහ කිරීමේ වියදම් දීමනාවකුත් ගෙවන බව. මේ ගැන මා රජයට දොස් කියන්නෙ නැහැ. මා කියන්නෙ ඒ වේතනය ලබන ගමන් යම්කිසි සෑහෙන වැඩ කොටසකුත් ඒ වෙනුවෙන් එතුමාගෙන් ඉටු විය යුතුයි කියන එකයි. 1964 වන විට එවකට තිබුණු රජයෙන් පූජනීය පෙදෙසෙන් ඉවත් කරන ජනතාව සඳහා නිවාස එකසිය ගණනකුත් කඩ සාප්පු හැත්තෑ ගණනකුත් සාදා තිබුණා. පූජනීය පෙදෙසින් ඉවත් කර නව නගරයේ පදිංචි කරවන්නවුන් සඳහාමයි ඒවා තැනුවෙ. එහෙත්, මා මීට කලිනුත් මතක් කර තිබෙනවා වගේම ඒ නිවාස හා කඩ කාමර වැඩි කොටසක් පූජනීය පෙදෙසින් ඉවත් කර නව නගරයේ පදිංචි කරවන අයට නොවෙයි, ඒවා ලැබීමට සුදුසුකම් නැති උදවියටයි දී තිබෙන්නෙ. සුදුසුකම් නැති උදවිය මේ නිවාස හා කඩ කාමර ලබාගෙන මොකද කරන්නෙ? සමහර අය සංරක්ෂණ මණ්ඩලයෙන් රුපියල් 25 ක නැත්නම් 30 ක කුලියකට මේවා ලබාගෙන පිටස්තර උදවියට රුපියල් 50, 60 ගණනේ කුලියට දී තිබෙනවා. යම් විධියකින් සංරක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් පරීක්ෂා කරන්නට එනවා නම් අර මුල් බදුකාරයා මහ රෑ ඇවිත් පදිංචි වෙනවා. එම නිසා නියම බදුකරු ස්ථිර වශයෙන්ම ඒවායේ පදිංචිව සිටිනවාද නැද්ද කියා සොයා ගැනීමත් ටිකක් අමාරු වී තිබෙනවා. කඩ දීමේදී සංරක්ෂණ මණ්ඩලය ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නේ නැහැ. විශේෂයෙන්ම මේ කඩ සෑදුවේ පූජනීය පෙදෙසින් ඉවත් කර නව නගරයේ පදිංචි කරවන අයටයි.

ඊළඟට ඒ සමගම මා තවත් සිද්ධියක් ගැන මතක් කරන්නට සතුටුයි. මගේ කොට්ඨාශයේ එක්සත් ජාතික පක්ෂයට ලැදි, හිතවත්, එක්සත් ජාතික පක්ෂයට හැකි තරම් වැඩ කරන එක්තරා මුදලාලි කෙනෙකු සිටිනවා. අනුරාධපුරයට සැතපුම් 15 ක් පමණ ඈත ස්ථානයකයි මේ මුදලාලි වාසය කරන්නෙ. හාල් සේරුවක් කැපූ හැටියෙම මේ මුදලාලි, මේ මෝල්කරු එයින් ලාභයක් ලබා ගන්නට ඕනෑය කියා කල්පනා කළා. ඔහු නව නගරයේ කාටත් අයිති කඩයක හාල් කඩයක් දැම්මා. මාසයක් පමණ එතැන වෙළඳාම කළා. ඊට පසු අර පූජනීය ප්‍රදේශයෙන් ඉවත් කරන අයට තැනූ නව නගරයේ කඩ කාමරයක් මේ පුද්ගලයා ලබා ගත්තා. ඔය විධියේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

කරුණු රාශියක් ගැන මට ගරු අගමැති තුමාගේ අවධානය යොමු කරවන්නට පුළුවනි. අද මෙවැනි තත්ත්වයක් පවතින නිසා තව අවුරුදු දහයක් පහළොවක් ගියත් සංරක්ෂණ මණ්ඩලයේ වැඩ කටයුතු අවසානයක් කරන්නට නොහැකිය කියා මා ප්‍රකාශ කරනවා.

තවත් කාරණයක් තිබෙනවා. ළඟදී සංරක්ෂණ මණ්ඩලය එක්තරා කටයුත්තක් සඳහා ටෙන්ඩර් කැඳවීමක් කර තිබෙන බව මා පත්‍රවලින් දුටුවා. සංරක්ෂණ මණ්ඩලය පූජනීය පෙදෙසින් ඉවත් කරන ජනතාවගේ අත්‍යවශ්‍ය දේවල් කරන්නේත් නැතිව, 1963 සිට නව නගරයේ පදිංචිව සිටින ජනතාවගේ ජල විදුලි ප්‍රශ්නය විසඳන්නේත් නැතිව එක්තරා වැඩක් කරන්නට ටෙන්ඩර් කැඳවා තිබුණා. පූජනීය පෙදෙසේ උද්‍යාන ශාලා නැත්නම් "සමර් හවුසස්" තනවන්නට ටෙන්ඩර් කැඳවා තිබුණා. They want to construct summer houses. ගරු සභාපතිතුමනි, පූජනීය පෙදෙසට එන වන්දනාකරුවන්ට ඕනෑ තරම් නවාතැන් ශාලා තිබෙනවා. එමනිසා පූජනීය පෙදෙසට මේ උද්‍යාන ශාලා අවශ්‍යය කියා මා කල්පනා කරන්නේ නැහැ. අවශ්‍ය වුණත් ඒවා පසුව කරන්නට පුළුවනි. මගේ චෝදනාව මේකයි. පූජනීය පෙදෙසින් ඉවත් කර නව නගරයේ පදිංචි කරවූ ජනතාවට අත්‍යවශ්‍ය සේවාවන් රාශියක් ඉෂ්ට කරන්නට තිබෙනවා. ඒවා නොකර මෙවැනි විහිළු වැඩ කිරීම ගැනයි අපේ කණගාටුව. මේ ගැන සොයා බලන මෙන් මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, 1963 වර්ෂයේ සිටම, පූජනීය පෙදෙසින් ඉවත් කර නව නගරයේ පදිංචි කරවූ ජනතාවගේ ගෙවල්වලට, විශේෂයෙන්ම නව නගරයේ දෙවන පියවරේ පදිංචි කරවූ ජනතාවගේ ගෙවල්වලට මේ දක්වා විදුලි බලය සපයා දී නැහැ. ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් සෑදූ ගෙවල් 195ක් පමණ තිබෙනවා. ඒවාගේම පෞද්ගලිකව තැනූ ගෙවල් සියයකටත් වැඩියෙන් තිබෙනවා. මේ ගෙවල් එකකට වත් තවම විදුලි බලය සපයා නැහැ. එහෙත් පුදුමයට කාරණයක් තිබෙනවා. ශ්‍රී මහා බෝධියේ සිට රුවන්වැලිසෑය දක්වා වූ පාරේ දිග යාරවලින් කියනවා නම් යාර 1,000ක් නැත්නම් 1,200ක් තරම ඇති. මෑතකදී මේ පාරට හොඳට විදුලි ආලෝකය සපයා තිබෙනවා. ගමනාගමන ඇමතිතුමාසි එය විවෘත කළේ. මට දැනගන්නට ලැබී තිබෙන විධියට එසේ විදුලි ආලෝකය සැපයීමට සිටුවා තිබෙන කණුවකට රුපියල් 1,000ක් පමණ වැය වුණාලු. අඩි අසූවෙන් අසූවට එවැනි කණු 39ක් සිටුවා තිබෙනවා. මේ වැඩ පිළිවෙලෙන් ශ්‍රී මහා බෝධියේ සිට රුවන්වැලිසෑය දක්වා වූ මාර්ගය අවහිර කර තිබෙනවා පමණක් නොවෙයි සංරක්ෂණ මණ්ඩලය අපරාදේ විශාල වියදමකුත් දරා තිබෙනවා. මේ ස්ථාන දෙක අතරේ විශාල පිට්ටනියක් තියෙනවා. ඒ පිට්ටනියෙන් මේ වගේ ලයිට් කණු 36ක් ඉදි කර තිබෙනවා. මේ තරම් වියදම් කර කණු සිටවා ලයිට් දැම්මෙන් කර තිබෙන්නේ අපරාධයක් බවයි, මගේ හැඟීම. මේ පිළිවෙළට විදුලි ආලෝකය සැපයීම අවශ්‍ය නම් එය පසුවට කල් තබන්නට පුළුවන්. දැන් තිබෙන විදුලි ආලෝකය ප්‍රමාණවත්. එය ප්‍රමාණවත් නැත්නම් පාර දෙපැත්තේ කණු සිටවා පාර ආලෝක කිරීමට පුළුවන්කම තිබුණා. එසේ නොකර කණුවකට රුපියල් 2,000 බැගින් වියදම් කර අඩි 80න් 80ට කණු සිටුවා විදුලි ආලෝකය සැපයීමෙන් කර තිබෙන්නේ මුදල් නාස්ති කිරීමක්. ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ නිවාස 195ක් තියෙනවා. ඒවායේ මිනිසුන් පදිංචි කෙරෙව්වේ 1963 දිසි. ඒවාට තවම විදුලි ආලෝකය නැහැ. රුපියල් 30,000, 40,000 වියදම් කර සෑදූ පෞද්ගලික නිවාස තියෙනවා. ඒවාටත් විදුලි ආලෝකය නැහැ. අනුරාධපුරයේ එන්ජින්වල බලය මදි නිසා විදුලි ආලෝකය දෙන්නට බැරි බවයි, කියන්නේ. ඒ නිවාසවලට විදුලි ආලෝකය සපයන්නෙ නැතිව පැරණි නගරය මේ අන්දමට ආලෝක කිරීමට මුදල් අපතේ වියදම් කිරීම ගැන අපේ කණගාටුව ප්‍රකාශ කරන්නට ඕනෑ.

විදුලි ආලෝකය සැපයීම සම්බන්ධයෙන් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය අපේ පැරණි නගර සභාවත් සමග කොන්දේසි අත්සන් කළා, යුනිට් එකට ශත 6 බැගින් අය කිරීමට. එහෙත් අයබදු ගෙවන්නන් ගෙන් අහන්නෙ බලන්නෙ නැතිව සංරක්ෂණ මණ්ඩලය විදුලි බල යුනිට් එකක මිල ශත 10 දක්වා වැඩි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

තිබෙනවා. එය නීති විරෝධී වැඩක් බවයි, මගේ අදහස. යුනිට් එකට ශත 6 බැගින් අය කිරීමට කොන්දේසි අත්සන් කළා නම් දැන් අය බදු ගෙවන්නන්ගෙන් යුනිට් එකට ශත 10 බැගින් අය කිරීම වැරදියි.

ගරු සභාපතිතුමනි, අනුරාධපුරයට ඉතාම අවශ්‍ය දෙයක් තමයි වතුර. ගරු අගමැතිතුමාගේ ආහාර වගා කිරීමේ ව්‍යාපාරයට ජලය සැපයීමත් වාරි මාර්ග දෙපාර්තමේන්තුවට බලවත් හිසරදයක් වෙලා තියෙනවා. එසේම අනුරාධපුර ජනතාවටත් වතුර නැතිකමින් විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. 1964 අවුරුද්ද වන විට නව නගරයට වතුර සැපයීම සඳහාම පසුගිය ආණ්ඩුව විශේෂයෙන්ම එක්තරා ඇළක් කැපුවා. යෝධ ඇලේ සිට නාච්චිදූවට වතුර ගෙනැවිත් නුවර වැව පිරවීමටයි, ඒ ඇළ කැපුවේ. ඒ ඇළ හැතැප්ම 4 3/4 ක් දිගයි. 1964 දෙසැම්බර් වන විට ඒ ඇළ හැතැප්ම 4 ක් දිගට කපා තිබුණා. පසුගිය අවුරුදු දෙකහමාර ඇතුළත තවම ඒ ඉතිරි හැතැප්ම 3/4 කපන්නට බැරි වුණා. ඒ සඳහා ගෙනැවිත් තිබුණු මැෂින් අරගෙන ගිහින්. දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටියේදි මේ ගැන ඉඩම් ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළාම කිව්වේ උඩ වලවේ ව්‍යාපාරයේ සහ වෙනත් තැන්වල වැඩ තියෙන නිසා ඒ මැෂින් අරගෙන ගොස් තිබෙන බවයි. ශීඝ්‍රයෙන් දියුණු වේගෙන එන නව නගරයට ජලය සැපයීම සඳහා නුවර වැව පිරවීමට ඒ ජල මාර්ගය ඉතාමත් අවශ්‍යයි. වාරි මාර්ග ප්‍රශ්නය මේ වැය ශීර්ෂයට අයිති නැති වුණත් නව නගරයට ජලය සැපයීමේ ප්‍රශ්නය ඉතා වැදගත් එකක් වී තිබෙන බව මතක් නොකර බැහැ. ජල සම්පාදන දෙපාර්තමේන්තුවෙන් සෑදූ විශාල වතුර ටැන්කි දෙකක් එහි තියෙනවා. ගැලුම් 1,25,000 ක් අල්ලන එක ටැන්කියක් නව නගරයේ තියෙනවා. ගැලුම් 56,000 ක් අල්ලන තවත් ටැන්කියක් ළඟදී හදුවා. ඒ ගැලුම් 56,000 අල්ලන ටැන්කිය පුරවන්න තියෙන්නෙත් ගැලුම් 1,25,000 අල්ලන ටැන්කියේ වතුර වලින්මයි. ඔය විධියට කටයුතු කර කවදාවත් නව නගරයේ ජල ප්‍රශ්නය විසඳන්නට බැහැ. ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් සෑදූ නිවාස 195 ක් නව නගරයේ තියෙනවා. ඒ අතර පෞද්ගලික ගෙවල් සිය ගණනකුත් තියෙනවා. රුපියල් තිස් හතළිස් දාහ වියදම් කර, සංරක්ෂණ මණ්ඩලය විසින් අනුමත කරන ලද සැලැස්මවල් අනුව, නවීන ක්‍රමයේ වැසිකිළි ආදිය ඇතිවයි, ඒ ගෙවල් සෑදා තිබෙන්නේ. ඒ ගෙවලට වතුර නැති නිසා සමහර විට හය මාසය, අවුරුද්ද බලා සිටින්නට සිදු වෙනවා, ඒවායේ පදිංචියට යාමට. වතුර නැති නිසා ඒ වැසිකිළි පාවිච්චි කරන්නට බැහැ. ජල සම්පාදන දෙපාර්තමේන්තුව මේ වැඩ කටයුතු සම්බන්ධව දක්වන උනන්දුව ඉතාමත් මදි බව කියන්නට ඕනෑ. පුදුම වැඩක් මේ සම්බන්ධයෙන් සිදු වන්නේ. එහි අනික් දෙපාර්තමේන්තු සියල්ලක්ම වැඩ කරන්නේ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය යටතෙයි. එහෙත් ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ වැඩ කෙරෙන්නේ රත්මලානේ ප්‍රධාන කාර්යාලයේ පාලනය යටතෙයි. සංරක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් සමග සාකච්ඡා කළාම ඒ අය කියන්නෙ මේ ප්‍රශ්නය ඒ අයට විසඳන්න බැරිය, රත්මලානේ ජලසම්පාදන දෙපාර්තමේන්තුවෙන් විසඳන්න ඕනෑ බවයි. මා එක්තරා ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීම නම්, යම්කිසි නිවාසයක් සාදා නිම කළාම, නිම කළ දවස කල්පනාවට ගෙන ප්‍රමුඛත්ව ලේඛනයක්—ප්‍රයෝරිටි ලිස්ට් එකක්—සූදානම් කර, ඒ අනුව ජලය සැපයීම කරන්නටය කියායි. නමුත් අද වනතුරු එහෙම කර නැහැ. සමහර විට පළමුවන පියවරේ ගෙවල් දෙකක් තුනක් නිම වී තිබෙද්දිත් දෙවන පියවරේ අවසන් වන නිවාසයකට වතුර දෙනවා. කිසිම සැලැස්මක් නැහැ; දෙපාර්තමේන්තුවේ කිසිම පිළිවෙළක් නැහැ. ඔය ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීමට මට අවස්ථාවක් දෙන්නටය කියා ගරු අගමැතිතුමාටත්, දෙපාර්තමේන්තුවටත් ලිපි යැව්වා. පසුගිය අප්‍රේල් මාසයේයි ලිපි යැව්වේ. කරුණු රාශියක්ම ඉදිරිපත් කරන්න තිබෙන බව මා සඳහන් කළා. නමුත් අද වනතුරුවත් ඊට අවසථාවක් සලසා දුන්නෙ නැහැ. එමනිසා, ජල සම්පාදන දෙපාර්තමේන්තුව සමග වැඩ කරන්නට ගියොත් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයට වැඩ කටයුතු කර ගන්න පුළුවන් වෙන්නෙ නැහැ. දැනට එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙන්නකු අනුරාධපුරයෙ ඉන්නවා. ඒ නිලධාරීන් දෙදෙනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයට ඇතුල් කර සංරක්ෂණ මණ්ඩලයෙන් කෙළින්ම නියෝග නිකුත් කර වැඩ කටයුතු කර ගෙන යන්න ලැබුණොත්, ඒ අන්දමට වැඩ පිළිවෙළක් සකස් කර ගන්න ලැබුණොත්, මෙයට වඩා කලින් මෙම ප්‍රශ්නය විසඳන්න පුළුවන්වේයයි මා විශ්වාස කරනවා.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය වෙනුවෙන්, ජාතික නිවාස දෙපාර්තමේන්තුව මගින් නිවාස එකසිය අනූ ගණනක් ඉදි කර තිබෙනවා. මේවාට ජල නල සවි කර, ගෙවල් පහකට සීමා වන විධියට ගැලුම් තුන් සියයක් අල්ලන සිලින්ඩරිකල් පයිප්ස් සවි කර තිබෙනවා. මට ආරංචි ලැබී ඇති හැටියට මේවා ඉදි කර ඇත්තේ ජලසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියද ඇතුවයි. නමුත් දැන් අවුරුදු දෙකක් පමණ ගතවී ඇතත් තවමත් ජලය සපයා නැහැ. ඒ ගැන ප්‍රශ්න කළාම ජල සම්පාදන දෙපාර්තමේන්තුව කියන්නෙ, අපට විශාල සැලැස්මක්—ස්කීම් එකක්—තිබෙනව, එය ක්‍රියාත්මක කරන තුරු මේ ප්‍රශ්නය විසඳන්න බැරි බවයි. නමුත් මේ අන්දමට ගියොත් සැලැස්ම කවදා ක්‍රියාත්මක වෙනවාද කියා කාටවත් කියන්න පුළුවන් වෙන්නෙ නැහැ.

අ. භා. 6.15

ගරු සභාපතිතුමනි, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ ඉඩම් අංශය ගැන සඳහන් කරන විට එහි වැඩ ඉතාමත් අසතුටුදායක බව කණගාටුවෙන් වුණත් කියන්න ඕනෑ. කිසිම ප්‍රතිපත්තියකට අනුව නොවෙයි ඉඩම් බෙදා දීම කරන්නෙ. ඒවා එකින් එක ගෙන අගමැතිතුමාට විස්තර කරන්න මා අදහස් කරන්නෙ නැතත්, බලවත් අසාධාරණයක් හැටියට සලකන කාරණා තුනක් ගැන පමණක් සඳහන් කරන්න කැමතියි. මේ ළඟදි, "යාපනය හන්දිය" කියන ස්ථානයේ හොඳ සිද්ධියක් ඇති වුණා. යාපනය හන්දිය කියන කොටස අයිති පැරණි නගරයටයි. මෙහි පැරණි නගර සභාවට අයත්, අක්කර කාලක පමණ බිම් කැබැල්ලක් තිබෙනවා. මෙහි පුල්ලෙයාර් කෝවිලක් තිබෙනවා. විශාල ගණනක් හින්දු භක්තිකයින් මෙන්ම බෞද්ධයින් ද පුල්ලෙයාර් නැතිනම් ගණදෙවි කෝවිල වශයෙන් හැඳින්වෙන මෙම කෝවිල පිහිටි අක්කර කාලක පමණ වූ භූමි භාගයට රුස් වෙනවා. අවුරුදු පතා මෙම ස්ථානයේ ආගමික උත්සව පවත්වනවා පමණක් නොවෙයි, ගිනි පෑගීමේ උත්සවය ද පවත්වනවා. අක්කර කාලක් පමණ වූ මෙම භූමි භාගය මෙතෙක් කාටවත් අයිතිව තිබුණේ නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ නොයෙකුත් උදවිය මෙම ඉඩම ඉල්ලා සිටි නමුත් එවකට තිබුණු ආණ්ඩුව මෙම ඉඩම් කැබැල්ල කාටවත් පවරා දුන්නේ නැහැ. පොදු යහපත සඳහා, පොදු ස්ථානයක් වශයෙන් පවත්වා ගෙන ආවා. මෙම භූමි භාගය, එක්සත් තරුණ සමිතියට වොලි බෝල් පිටියක් සාදා ගැනීමට තාවකාලික වශයෙන් පාවිච්චි කිරීමටත්, කෝවිලේ උත්සව කටයුතු පවත්වා ගැනීමටත් ඉඩ දී තිබුණා. එසේ වුණත් මෙවර මැතිවරණයෙන් පසුව පොන්නයියා නමැති පුද්ගලයකුට මෙම ඉඩම් කැබැල්ල බදු දී තිබෙනවා. පොන්නයියා නමැති මේ පුද්ගලයාට, යාපනය හන්දිය ප්‍රදේශයෙ ගෙවල් හත අටක් අයත්ව තිබෙනවා පමණක් නොවෙයි, කුඹුරු ඉඩම් අක්කර 50 ක් 60 ක්ද අයත්ව තිබෙනවා. එම නිසා අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයට මා දන්වා යැවිවා, මේක බලවත් අපරාධයක්, පොදු වැඩකට යොදා තිබෙන මෙම ඉඩම කාටවත් බදු දෙන්නට එපා, මේ තීරණය වෙනස් කරන්න කියා. එයට පිළිතුරු වශයෙන් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයෙන් මට දන්වා එවා තිබෙන්නෙ, අනුරාධපුර නව නගරයෙ මිනිහාට අයත්ව තිබුණු ඉඩ කඩම් අත්පත් කර ගත් නිසා, මේ ඉඩම් කැබැල්ල දුන්නාය කියායි. මේ ප්‍රශ්නය උඩ මා අගමැතිතුමා සමග තර්ක කරන්න යන්නෙ නැහැ. එතුමා මේ සිද්ධීන් ගැන දන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම ඒ මනුෂ්‍යයාට අයත් ඉඩකඩම් තිබුණෙ යාපනය හන්දියේ පමණයි. ආණ්ඩුවෙන් එම ඉඩකඩම් කවර අවස්ථාවකවත් අත්පත් කර ගත්තේ නැහැ. යම්කිසි විධියකින් ඒ මනුෂ්‍යයාට ඉඩමක් දෙන්න ඕනෑකම තිබුණා නම් අනුරාධපුර නව නගරයෙන්ම දුන්නා නම් කිසිම තර්කයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

එපමණක් නොවෙයි, ඒ පුද්ගලයා ඉඩම පවරා ගෙන දැන් එම ස්ථානයේ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි කරගෙන යනවා. මෙය විශාල ආන්දෝලනයක් ඇති වී තිබෙන ප්‍රශ්නයක්. හින්දු භක්තිකයින් මෙන්ම බෞද්ධ භක්තිකයින් විශාල වශයෙන් මෙම පුල්ලෙයාර් කෝවිලට පැමිණෙන නිසා එක්කෝ පොන්නයියාට දුන් ඉඩම අවලංගු කළ යුතුයි නැතිනම් පුල්ලෙයාර් කෝවිල උස්සාගෙන ගිහින් වෙනත් තැනකින් තැබිය යුතුයි. එවැනි තත්ත්වයක් දැන් උදා වී තිබෙනවා.

අනික් කාරණය, ගරු සභාපතිතුමනි, අවුරුදු පණහක් පමණ වයසැති මුතුවේලු නමැති පුද්ගලයෙක්, බදු ඔප්පුවක් පිට යම්කිසි බදු ඉඩමක පදිංචිව සිටියා. එම ඉඩමේ කොටසක, මෙයට අවුරුදු තුනකට පමණ පෙර එක්තරා ස්ත්‍රියක් ගිහින් බලහත්කාරයෙන් පදිංචි වී සිටිනවා. මුතුවේලු කියන මේ තැනැත්තා රජයේ සේවකයෙකු වශයෙන් සිට දැන් විශ්‍රාම වැටුප් ලබනවා. ඒ පුද්ගලයා සංරක්ෂණ මණ්ඩලයට කියා සිටියා, මෙන්න මේ වාගේ කරදරයක් ඇති වී තිබෙනවය, කරුණා කරල මේ තැනැත්තිව එතැනින් ඉවත් කර දෙන්නටය කියා. අවුරුදු 2ක් පමණ ලියුම් ගනුදෙනු කළාට පස්සෙ සංරක්ෂණ මණ්ඩලය පිළිතුරු යවනව, ඔබට ඔප්පුවක් තිබෙන නිසා මෙය නීති මාර්ගයෙන් බේරුම් කර ගන්නටය කියා. මේ කාරණය සම්බන්ධයෙන් මුත්තුවේලු උසාවියට ගියා. උසාවියෙන් නඩුව විභාග කිරීමෙන් පසු තීන්දුව ලැබුණේ මූත්තු වේලුට පක්ෂවයි. අන්තිමේදී පිස්කල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇවිත් අර ගැහැණිය දොට්ට දැම්මා. මේ ප්‍රශ්න යේදී අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ගත් පියවර කුමක්ද? මුලින් මුත්තුවේලුට දී තිබුණු ඔප්පුව අවලංගු කර දමා ඉඩමෙන් එක් කැබැල්ලක් අර ගැහැණියටත් අනෙක් කැබැල්ල මුත්තුවේලුටත් බෙදා දුන්නා. මේ ගැන වහාම අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයෙන් විමසුවා. මේ අයට ඉඩමක් දිය යුතුය යනුවෙන් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය තීරණය කරනවා නම් කරුණා කර එය වෙන තැනකින් දෙන්නැයි කියා සිටියා. ඒ වාගේම ඔප්පුව අවලංගු කරන්නට බලාපොරොත්තු වෙනවා නම් නිකරුකේ රුපියල් දහස් ගණන් වියදම් කරන්නට මග පෑදෙන හැටියට ඒ උදවියට උසාවියට යන්නට සැලැස්සුවේ මන්දැයි මා ඇහුවා.

පුරාවිද්‍යා කොමසාරිස්තුමාට අයිති ඉඩම් රාශියක් අනුරාධපුරයේ තිබෙනවා. අනුරාධපුර ඇප්‍රෝච් රෝඩ් කියා පාරක් තිබෙනවා. දුම්රියපොළ අසළයි එය තිබෙන්නේ. පූජනීය වස්තූත් ගල් කණු ආදියත් තිබෙන ප්‍රදේශවල ඉඩම් රාශියක් පුරාවිද්‍යා කොමසාරිස්තුමා භාරයේ තිබෙනවා. එතුමා ඒවා කාටවත් අල්ලන්නට ඉඩ දෙන්නෙ නැහැ. නිවත්ත චේතිය පාඨශාලාවේ විශාල තදබදයක් තිබෙනවා. ඒ පාඨශාලාවේ ඉගෙනීම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව බොහෝම විශාලයි. ඒ ඉස්කෝලේ ළමයින් 986 දෙනෙක් ඉන්නවා. ඒ වුණාට මේ පාඨශාලාවට අයිති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර භාගයකටත් අඩුයි. මුළු ඉඩම් සම්පූර්ණයෙන්ම වාගේ ගෙඩානැගිලිවලින් පිරිලා. ඉගෙනීම ලබන ළමයින්ගේ ප්‍රයෝජනයට තව තවත් ගොඩනැගිලි ආදිය ඉදි කළ යුතුව තිබෙනවා. ඒ නිසා අවුරුදු ගණනාවක් තිස්සේ පුරාවිද්‍යා කොමසාරිස්තුමා ගෙන් එතුමට අයිති ඉඩම්වලින් තාවකාලික වශයෙන් හෝ ගොඩනැගිල්ලක් හදන්නට ඉඩමක් දෙන්නැයි ඉල්ලුවා. කොයි තරම් ඉල්ලුවත් පුරාවිද්‍යා කොමසාරිස්තුමා කියන්නේ ඉඩම් දෙන්නට බැහැ කියන කතාවමයි. ඒ කොයි හැටි වෙතත් සිදු වී තිබෙන දේ ගැන මතක් කළොත් තමුන්නාන්සේ පුදුම වේවි. ඉස්කෝලයක් හදන්න, ඉස්කෝලයට අවශ්‍ය ගොඩනැගිල්ලක් හදන්න, ඉඩම් කැබැල්ලක් දෙන්නට බැරිය කියන පුරාවිද්‍යා කොමසාරිස්තුමා ඔය කියන ඉස්කෝලයට යාබද ඉඩමක් යම් පුද්ගලයන් තුන්දෙනකුට බෙදා දෙන්නට යනවා. ඒ ගැන අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයට ලියා යැව්වා. මා ලියා යැවූ ලියවිල්ලට පිළිතුරක් ලැබුණා. ඔය ඉස්කෝලයට ඉඩමක් දෙන්නට බැරිය කියන නමුත් වෙනත් පුද්ගලයින්ට ඉඩම් දෙන්නට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පුළුවනි. පුරාවිද්‍යා කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව ඔය පුද්ගලයින්ට ඉඩම් දී තිබෙනවා. එසේ ඉඩම් බෙදාදීම නිසා මේ සම්බන්ධයෙන් ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් තිබෙන බව ගරු අගමැති තුමාට මතක් කරන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවත් බැරෑරුම් ප්‍රශ්නයක් ගැන සඳහන් කරන්නට සිදු වී තිබෙනවා. ඒ කාරණය සමහර විට නීති මාර්ගයටත් යන්නට පුළුවනි. ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ලබා ගැනීමට උසාවියට යන්නටත් සිද්ධ වේවි. සුමිත්‍ර ආරච්චි යන නම ඇති කෙනෙක් අනුරාධපුර නව නගරයේ සොල්දර තට්ටු ගෙයක් හැදුවා. 1960 දී ලැබුණු බලපත්‍රයක් උඩයි ඔහු එය හැදුවේ. එහි හෝටලයක් විවෘත කර පසුගිය අවුරුද්දක ඔහු තමන්ගේ ජීවිකාව කර ගෙන යන්නට පටන් ගත්තා. මේ ආණ්ඩුව ඇතිවීමෙන් පසු අලුත් සංරක්ෂණ මණ්ඩලයක් ඇති වුණා. මේ තැනැත්තාට එතැන හෝටලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය බලපත්‍රයක් දෙන්නට බැරියයි අලුතින් පත් වූ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය කියා සිටියා. අලුතින් සෑදූ ගෙය, තමන්ගේ පදිංචිය සඳහා වුවමනා කරනවා නම් පමණක් බලපත්‍රයක් දෙන්නට පුළුවනැයි ඔහුට දැනුම් දුන්නා. ඔහුට බලපත්‍රයක් දුන්නේ නැහැ, හෝටලය කරගෙන යාමට. හෝටලය පවත්වා ගෙන යාමෙන් තමන්ගේ නඩත්තුවට මුදල් උපයාගත් ඒ තැනැත්තාට ඒ මාර්ගය නැති වී ගියා. බලපත්‍රය සම්පූර්ණයෙන් කැන්සල් කළා, අවලංගු කළා. අන්තිමේ දී හෝටලය වැහුවා. ඔහුට අසනීප වුණා, ඇක්සිඩන්ට් එකක් වෙලා ඉස්පිරිතාලේ සිටියා. බණ්ඩාර කියන මනුෂ්‍යයකුට මේ ගෙය බදු දුන්නා. ඔහු ශාස්ත්‍රකාරයෙක්. සුමාන දෙකක් යන්නට ඉස්සරවෙලා, ගෙය අයිතිකාරයා පැත්තක සිටිද්දී, බණ්ඩාරට ලයිසන්ස් එකක් දුන්නා. මොනවටද ලයිසන්ස් එකක් දුන්නේ? බණ්ඩාරට බලපත්‍රයක් දුන්නේ අච්චු කන්තෝරුවක් සහ ටියුටරියකුත් දමන්නටයි.

මේ නීතිය මොකක්දැයි කියන්නට මා නම් දන්නේ නැහැ. ඔවැනි ක්‍රියා මාර්ග යක් අනුගමනය කරන්නට වුවමනා කළා නම් ගෙය අයිතිකාරයාගෙන් අහන්නට තරම් යුතුකමක් තිබුණේ නැද්ද? ඒ වුණාට ඔහුගෙන් ඒ ගැන ඇහුවේ නැහැ. ගරු අගමැතිතුමා මේ කාරණය සම්බන්ධ ලිපිගොනු ආදිය ගෙන්වාගෙන බැලුවොත් හොඳ හොඳ සෙල්ලම් දකින්නට පුළුවන් වේවි. ඒ නිසා මා ඉතා කරුණාවෙන් සහ ගෞරවයෙන් ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ හැකි තාක් ඉක්මනින් මේ ගැන පරීක්ෂණයක් පවත්වන ලෙසයි. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ ක්‍රියා ගැන කරුණු සොයා බැලීම හොඳ බව ගරු අගමැතිතුමාට මතක් කරන්නට කැමතියි. මෙවැනි දේවල් සිදු වීමට තිබෙන ප්‍රධාන හේතුවලින් ඉතාමත් වැදගත් හේතුවක් නම් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා නිතරම සංරක්ෂණ මණ්ඩලයෙහි වැඩ නොකිරීමයි. එය මා චෝදනාවක් හැටියට ඉදිරිපත් කරනවා. සභාපතිතුමා නීතිඥයෙක්. පෙරකදෝරු මහත්මයෙක්. නීතිඥයකු වශයෙන් කටයුතු කරන එතුමා අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති හැටියටත් කටයුතු කළ යුතුව තිබෙනවා. මිනිසුන්ට සිද්ධවෙලා තිබෙන්නේ අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති බණ්ඩාර මහත්මයා හම්බවෙන්ට ඉස්සරවෙලා පෙරකදෝරු බණ්ඩාර මහත්මයා හම්බ වෙන්ටයි. ඒ විධියේ කථාවක් තමයි ඒ ප්‍රදේශයේ මිනිසුන් කියන්නේ. ඒ නිසා ඒ මහත්මයාගේ හොඳ නම ආරක්ෂා කර ගැනීමටත් සංරක්ෂණ මණ්ඩලයෙන් කෙරෙන්නට තිබෙන වැඩ කටයුතු ඉක්මනින් කෙරෙන්නටත් පුළුවන් වැඩ පිළිවෙලක් ඇති කිරීම අවශ්‍ය වී තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ සකස් කළ හැක්කේ සම්පූර්ණ කාලය යොදා වැඩ කරන්නට පුළුවන්කමක් තිබෙන සභාපති වරයකු පත් කිරීමෙන් බවයි මා කල්පනා කරන්නේ. ඒ නිසා සම්පූර්ණ කාලය යොදා වැඩ කරන්නට පුළුවන් සභාපති වරයකු අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයට පත් කිරීම යෝග්‍ය බව ගරු අගමැතිතුමාට මතක් කරන්නට කැමතියි.

අවසාන වශයෙන් තවත් එක් කරුණක් කෙරෙහි ගරු අගමැතිතුමාගේ අවධානය යොමු කරන්නට තිබෙනවා. පසුගිය මහා මැතිවරණයේදී, එවකට බලයේ සිටි ආණ්ඩුවට විරුද්ධව එල්ල කළ ලොකුම චෝදනාවක් තමයි එදා අනුරාධපුර නගර වාසීන්ගේ අයිතිවාසිකම් නැති කර දමමින් ඒ ආණ්ඩුව අනුරාධපුර නගර සභාව වහලා දැම්මාය යන්න. එවකට පැවති ආණ්ඩුවට විරුද්ධව එවැනි චෝදනාවක් එල්ල කරමින්, තමන් බලයට පත් වුණොත් වැඩි කාලයක් යන්නට

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[රත්නායක මයා.]

මත්තෙන් නැවත නගර සභාවක් අනුරාධපුර ජනතාවට දෙනවාය කිව්වා. මේ ආණ්ඩුව බලයට පැමිණ දැනටමත් අවුරුදු දෙකහමාරක් පමණ ගතවී තිබෙනවා. එහෙත් තවමත් අනුරාධපුරයට ඇත්තෙන්ම නගර සභාවක් නම් ලැබී නැහැ. ළඟදී අනුරාධපුරයට නගර සභාවක් දෙන්නට යන බවට අපට ආරංචියක් ලැබී තිබෙනවා. ඒ ගැන සන්තෝෂ වෙනවා. ඒ සමගම, අපට ලැබී තිබෙන ආරංචිය අනුව අපට කනගාටුවටත් හේතුවක් තිබෙනවා. මොකක්ද ඒ හේතුව? එක් පැත්තකට නගර සභාවක් දෙන අතර අනෙක් පැත්තට සංරක්ෂණ මණ්ඩලය යටතේ පාලනයක් ඇති කර දෙන බවයි අපට දැන ගන්නට තිබෙන්නේ. නගර සභාවක්, වෝඩ් හතරක් පහක් සහිතව ඇති කරන්නටත්; ඉතිරි කොටසෙ පාලන කටයුතු කිරීමට සංරක්ෂණ මණ්ඩලයක් තබා ගන්නට යනවාලු. එහෙම වුණොත් එයින් විශාල මතභේදයක් ඇති වෙනවා. නගරයට නායකයන් දෙදෙනෙකු ඇති වෙනවා. නගර සභාවේ සභාපතිතුමා එක් පැත්තක නායකයා වෙන්නටත්, සංරක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා අනෙක් පැත්තේ නායකයා වෙන්නටත් පුළුවනි. ඉක්මනින් නගර සභාවක් දෙනවා නම් හොඳයි. ඊට කලින් අවශ්‍ය නිලධාරීන් හා මුදල් දෙන්න. සංරක්ෂණ මණ්ඩලය නැතිකොට මහජනයාගේ අයිතිවාසිකම් දෙන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මෛත්‍රීපාල සේනානායක මයා. (මැදවච්චිය)

(திரு. மைத்திரிபால சேனநாயக்க—மத வாச்சி)

(Mr. Maithripala Senanayake—Medawachchiya)

ගරු සභාපතිතුමනි, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ගැන වෙනත් කෙනකු කථා කරනැයි මා හිතන්නේ නැහැ. ඒ නිසා මේ අවස්ථාවේදී මා ඒ ගැන කරුණු දෙකක් තුනක් පමණ ඉදිරිපත් කර නැවත අවස්ථාවකදී පොලීසිය සම්බන්ධයෙන් කරුණු කීපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ඇති කරන්නට පෙර, මේ මේ විධියට නව නගරය ඉදි කළයුතු යයි පෙන්වමින් නගර නිර්මාණ ශිල්පියා විසින් අඳන ලද සැලැස්ම වෙනස් කළ නොහැකි යයි මා කියන්නේ නැහැ. මා ඉදිරිපත් කරන තර්කය ඒක නොවෙයි. සැලැස්මක් තිබෙනවා නම් අවස්ථානුකූලව එය වෙනස් කරන්නට බලය තිබෙනවා. එහෙත් දැන් වෙනස් කරගෙන යන පිළිවෙළ අනුව අනාගතයේදී යම්කිසි බාධාවක් ඇති වන්නට ඉඩ තිබෙන බව පෙන්වා දෙන්නට කැමතියි. නුවරවැවේ වාන උස්සා නුවර වැව ජලාශය ලොකු කිරීමට රජය යම් දවසක අදහස් කළහොත් දැනට සැලැස්ම වෙනස් කරමින් සාදා තිබෙන ගෙවල් යම් දවසක යට වන්නට ඉඩ තිබෙනවා. මුල් සැලැස්මෙහි ඉඩම් වෙන් කර තිබුණේ නුවරවැව ඉස්මත්තේ හරිස්චන්ද්‍ර මාවත ප්‍රදේශයේ එක ගෙවල් පේළියක් පමණක් සෑදීමටයි. අප ඒ ප්‍රදේශයේ ඉඩම් ගන්නා අවස්ථාවේදී "මෙතැනින් එහාට ගෙවල් හදන්නේ නැහැ, මෙතැනින් එහාට පාරවල් නැහැ" යි නගර නිර්මාණ ශිල්පියා කී බව මට මතකයි. ඒ විධියට තීරණයක් ගෙන තිබුණේ වැවේ ආරක්ෂාව සඳහායි. එහි "high flood level area, full supply level area" යනුවෙන් ප්‍රදේශයක් සීමා කර ගස් සිටුවා "green belt" නමින් හඳුන්වා එම පෙදෙස ආරක්ෂා කිරීමට ඔලිවර් වීරසිංහ මහතා සිය සැලැස්ම සාදන විට අදහස් කළා. එහෙත් අද සිදුවී තිබෙන්නේ මොකක්ද? වැව් ඉස්මත්තේ පාරවල දමා ගෙවල් සෑදීමට දැන් නැවතත් සැලැස්ම වෙනස් කර ගෙන යනවා.

මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් යෝධ ඇළෙන් නාච්චදූව වැවටත් නාච්චදූව වැවෙන් නුවරවැවටත් වතුර ගෙන යෑමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වන්නේ පියවර තුනකටයි. දැනට අවසාන වී තිබෙන්නේ පළමුවන පියවර පමණයි. මෙම පියවරවල් තුනම සම්පූර්ණ වන විට වතුර ජලාශය ලොකු කරන්නට සිදු වන බව අමුතුවෙන් කිව යුතු නැහැ. එසේ සිදු වුණොත් දැනට සංරක්ෂණ මණ්ඩලය කරගෙන යන වැඩ පිළිවෙළ නිසා ලොකු කරදරයක් ඇති වන්නට පුළුවනි. වෙනත් විධියකට කියතොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කවදා හෝ දැනට ඇති කර තිබෙන, ඇති කරන්නට යන පාරවල් සහ ගෙවල් යට වන්නට පුළුවනි. මගේ තර්කය අන්න ඒකයි. ඒ නිසා ඒ ගැන පමණක් සොයා බලන්න. අනෙක් තැන්වල සැලැස්ම වෙනස් කළාට මගේ විරුද්ධතාවක් නැහැ. සැලැස්මක් හදන්නට පුළුවන් නම් වෙනස් කරන්නටත් පුළුවනි. නුවරවැව නව නගරයේ මූලික ජලාශය වශයෙන් පාවිච්චි කරන්නට බලාපොරොත්තු වන නිසා ඒ වැවේ වතුර මට්ටම වැඩි කිරීම සඳහා බැම්ම උස්සන්නට සිදු වෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනටම කලා වැවේ යෝධ ඇලේ සිට නාච්චදූවවැවට හා නාච්චදූවවැවේ සිට නුවරවැවටත් ඇළක් කපාගෙන යනවා. මේ නිසා දැනට වැවේ තිබෙන ජල මට්ටම උස් කරන්නට සිදු වෙනවා. ඒ නිසා මා ගරු අගමැතිතුමා ඉගන් ඉල්ලා සිටින්නේ මේ සැලැස්ම වෙනස් කරනවා නම් හේතු යුක්ති සලකා බලා එසේ කරන ලෙසටයි.

අ. භා. 6.30

මට මතකයි, ගරු ඉඩම් ඇමතිතුමා එහි ගිය අවස්ථාවේදී මා එතුමාට ඔය ප්‍රශ්නය ඉදිරිපත් කළ බව. මේ වෙනස් කිරීමේදී ඒ පිළිබඳව කල්පනා කර බැලුවාදැයි මා විසින් මෙම මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි තුමාගෙන් ද ප්‍රශ්න කරන්නට යෙදුණ. මුළු නගරයටම ජලය ලබා දීම සඳහා යම් දිනෙක මෙම ජලාශය විශාල කරන්නට සිදු වන හෙයින් මේ ගැන තමුන්නාන්සේලා කල්පනාකර බැලුවාදැයි මවිසින් අසන ලද ප්‍රශ්නයට ලැබුණු පිළිතුර වූයේ, "අප ඒ අදහස ඇති කර ගත්තේ නැහැ" යන්නයි. එම නිසා මෙම කාරණය ගැන සොයා බලන ලෙස ගරු අගමැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ඔලිවර් වීරසිංහ මහතා මේ පිළිබඳ මූලික සැලැස්ම අඳින අවස්ථාවේදී අක්කර ගණනේ දෙන ප්‍රදේශ, අක්කර තුන් කාල ගණනේ දෙන ප්‍රදේශ, අක්කර බාගය සහ කාල ගණනේ දෙන ප්‍රදේශ යනාදි වශයෙන් ඒ ඒ ප්‍රදේශ වෙන් කර තිබුණා. පැරණි නගරයේ ස්ථිර පදිංචි කරුවන්ගේ ඉඩම් රජයට ගන්නා අවස්ථාවේදී කොපමණ මුදලක් වියදම් කර තම තමන් ගෙවල් සාදන්නට බලාපොරොත්තු වෙනවාදැයි ප්‍රශ්න කරන්නට යෙදුණා. ඊට දුන් පිළිතුරු අනුවයි, ඉඩම් ලැබුණේ. රුපියල් 45,000 ක් වියදම් කරනවා නම් අක්කරයකුත්, ඊට අඩුනම්, අක්කර තුන් කාලකුත්, ඊට අඩු නම් අක්කර බාගයකුත් එසේ නැතිනම් කාලකුත් යනාදී වශයෙන් මේ ඉඩම් ලබා දීමේ යම්කිසි වැඩ පිළිවෙළක් තිබුණා. එහෙත් දැන් කර ගෙන යන්නේ අක්කරය බැගින් දුන් ප්‍රදේශ පවා කඩා ගෙන යාමයි. එදා නගර නිර්මාණ ශිල්පයට අනුව ශාස්ත්‍රානුකූලව එම කටයුත්ත කළා යැයි මා විශ්වාස කරනවා. එක එක්කෙනා ගේ වත්කම් අනුව අක්කරයක්, අක්කර තුන් කාලක්, අක්කර බාගයක් යනාදි වශයෙන් දෙන ප්‍රදේශ, වෙළඳහෙළඳාම් සඳහා වෙනම ප්‍රදේශ, කර්මාන්ත ඉදි කිරීම සඳහා වෙනම ප්‍රදේශ යනාදී වශයෙන් සලකා බලා ශාස්ත්‍රානුකූලව අඳින ලද එම සැලැස්ම අද ඉතුමතයේ හැටියට කිසි කරුණක් නැතුව වෙනස් කර ගෙන යන බව පෙනෙනවා. අක්කරයේ කොටස් දෙකට කඩා යහළු මිත්‍රාදීන්ට බෙදා දීගෙන යනවා. මල්වතුඔය පැත්තේ වන්දනාමාන කරන අය සඳහා Camping ground වෙන් කළා. වන්දනා සමයේදී පැමිණෙන මහජනතාවට නවාතැන් ගැනීම පිණිස ධර්මශාලා සෑදීමාදියට වෙන්කර තිබුණු එම ප්‍රදේශයේ ඉඩම් අද එක් එක් පුද්ගලයන්ට ගෙවල් සෑදීම සඳහා බෙදා ගෙන යන බව පෙනෙනවා. අද අමෙරිකා වේ තානාපතිව සිටින ඔලිවර් වීරසිංහ මහතා ඒ කාලයේ ලංකාවට පැමිණි විශේෂඥයන්ගෙන් පවා අවවාදානුශාසනා දිය ලබාගෙන සකස් කරන ලද එම සැලැස්ම අද දවසේ කිසිදු වග විභාගයක් නැතුව වෙනස් කරගෙන යනවා. නගර නිර්මානය පිළිබඳ කිසිදු දැනුමක් නොමැති උදවිය අද එම වැඩ පිළිවෙළ කඩාකප්පල් කර ගෙන යනවා. මෙසේ සිදු වන විට මෙම ලස්සන නගරය අන්තිමේදී කුමන අන්දම කින් අවසානයකට පත් වේද කියන ප්‍රශ්නය මා මෙම අවස්ථාවේදී ගරු අගමැතිතුමාගෙන් අහනවා.

නගරය මැද බැංකුව ළඟ වට රවුමක් තනා තිබුණා. අපේ ජනසතු සේවා ඇමතිතුමා තව්වු දෙකේ බස් රථ එව්වාය කියා එම වට රවුම ලොකු වැඩියැයි තීරණය කොට එය මැදින් දෙකට කැපුවා. එවැන්නක් මුළු ලෝකයේම දැක නැහැ. වට රවුම වැඩිවූ බස් රථ යාමයි, සිරිත. නමුත් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

උදවිය ඒ මැදින් පාරක් කැපුවා. ඉන් පසු බස් රථවලින් කොටසක් වටෙන් යනවා. තවත් කොටසක් මැදින් යනවා. එම නිසා ඇක්සිඩන්ට් එකක් සිදු වුණා. ඊට පස්සේ එම වටරවුම එහෙමපිටින්ම ඉවත් කර දමා තිබෙනවා. දැන් දෙපැත්තෙන්ම වාහන යනවා. කිසිම වටරවුමක් නැහැ. තව ටික කලක් යන විට මොනවා වේවිද මන්දා. එහි හතර පැත්තට ලයිට් හතරක්වත් දමන්නටය කියා මා ඉල්ලා සිටිනවා. එතන බෙහෙවින් ජනයා ගැවසෙන ජනාකීර්ණ හන්දියක්. හරිස්චන්ද්‍ර මාවතේ ලංකා බැංකුව ලඟ තිබෙන ලොකුම හන්දිය එයයි. තට්ටු දෙකේ බස් රථ එතනින් හැරවීම අපහසු නම් පොඩි වටරවුමක් දමන ලෙස අප කියා සිටිනවා. ඒවාගේම එතැනට හතර පැත්තට ලයිට් හතරක් දමන්න. වාහනවලින් යන අයගේ ආරක්ෂාව සඳහා එසේ කිරීම අවශ්‍යයයි.

කුමන කරුණක් නිසාද දන්නේ නැහැ, එම වැඩ පිළිවෙළ සකස් කරන අවස්ථාවේදී මිහින්තලේ සිට කුවිටම්පොකුණටත් එහා ප්‍රදේශ රාශියක් ශුද්ධ නගර ප්‍රදේශය සඳහා ගැසට් කළා. එය වෙනස් කොට ඊට ඇතුළත් කර තිබෙන ප්‍රදේශ අඩු කළ යුතුය යන්න පසුගිය ආණ්ඩුවේද අදහස වුණා. දැනුදු ඒ අදහස අනුව එම අනවශ්‍ය ප්‍රදේශ වෙනස් කිරීම සඳහා කටයුතු කර ගෙන යන බව ආරංචියි. මෙය ටිකක් ප්‍රමාදවී තිබෙනවා. මගේ ඡන්ද කොට්ඨාශය පටන්ගන්නේ කුවිටම් පොකුණේ සිට එහාටයි. ඒ කියන්නේ පැරණි සුද්ධ නගරයේ සීමාවේ සිට උතුරටයි. පෙරමියන් කුලම, කටුකේලියාව, කරඹවැව, ගල්කඩවල කියන මායිම්වලින් එහාටයි මගේ ඡන්ද කොට්ඨාශය තිබෙන්නේ. ඒ අනුව දැන් ඒ ප්‍රදේශයට පාරක් හදා ගන්න ගියත්, ගම්කාර්ය සභාව කියනවා, ඒක අපට නැහැ, සංරක්ෂණ මණ්ඩලයටයි අයිති කියා. සංරක්ෂණ මණ්ඩලය කියනවා නැහැ, නැහැ, මේ ප්‍රදේශය පිටමං කරන්නයි අප සූදානම් කරගෙන ඉන්නේ, ඒ නිසා අපට වියදම් කරන්න බැහැ කියා. ඒ අනුව දෙගොල්ලගෙන්ම අපට සහනයක් නැහැ. මෙය තීරණය කර අවසාන නිසා අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ බලාපොරොත්තු වන පරිදි, අවශ්‍ය ප්‍රදේශ පමණක් ඉතුරු කර, අනවශ්‍ය ප්‍රදේශ පුළුවන් පමණ ඉක්මණින් ගැසට් කර පිටමං කර සහනයක් සලසා දෙන්නය කියා.

සංරක්ෂණ මණ්ඩලය පිළිබඳව ඔය කරුණු දෙක පමණයි මා දැන් ඉදිරිපත් කරන්නේ. පොලීසිය සම්බන්ධයෙන් කරුණු දෙක තුනක් පමණක් මට ඉදිරිපත් කරන්න තිබෙනවා. විවාදය නිසි විධියට යා යුතු නිසා විදේශ කටයුතු පිළිබඳව කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා කථා කළාට පසුව ඒ කරුණු ඉදිරිපත් කිරීම සුදුසුය කියා මා කල්පනා කරනවා.

ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

සභාපතිතුමනි, කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමාගේ අවසරය ඇතිව, ඒ මන්ත්‍රීතුමාට කලින් මා මිනිත්තු 7ක් කථා කිරීමට අවසර ඉල්ලනවා. එයට එතුමා එකඟ වී තිබෙනවා. විදේශ කටයුතුවලට අයිති වෙනම ප්‍රශ්නයක් මතු කිරීමටයි මා අදහස් කරන්නේ. මෙය ඉතාමත් බැරුරුම් ප්‍රශ්නයක්. ඒ මොකද? අප මේ මෑතදී මේ ගරු සභාවේ මුළු රැයක් තිස්සේ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාවට නැගීම් පිළිබඳව සාකච්ඡා කළ අවසථාවේදීත් මේ ප්‍රශ්නය මතු කළා. විරුඬ පක්ෂයේ අප ඉදිරිපත් කළ ප්‍රධාන තර්කය වුණේ මේ ආණ්ඩුව විසින් මේ ගිවිසුම් සම්බන්ධයෙන් කර ඇති ප්‍රධාන වෙනස්කම, මෙය ක්‍රියාවේ යෙදී මේදී ඇති වනවාය කියන බියක් අපේ හිතේ ඇති වන බවයි. ඒක වෙනස් කළ බව කීප වාරයක්ම මේ ගරු සභාවේදීම අගමැතිතුමාත් පිළිගෙන තිබෙනවා. ඒ කුමක්ද? ඉන්දියානුවන් නමින් සිටින රටවල් දෙකේම පුරවැසි බව නැති ඔය පිරිස අතුරෙන් 3,00,000ක් ලංකාව භාර ගනිමින් ලංකාවේ පුරවැසි භාවය දීම සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමට ඇඳා තිබුණේ ඉන්දියාව විසින් 5,25,000ක් ඉන්දියාවට ඇතුළු කර ගැනීම උඩයි. මෙහි තිබෙන වෙනස්කම මොකක්ද කියන එක අප නැවතත් මතක් කිරීමට සතුටුයි. පුරවැසි යන් නොවන අය අතුරෙන් 3,00,000කට පුරවැසිකම් දීම දැන් නීතියේ ඇඳා තිබෙන්නේ ඉන්දියාව විසින් අර 5,25,000ට ඉන්දියාවේ පුරවැසිභාවය දීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නයටයි. අගමැතිතුමාගේ ප්‍රකාශය සහ අගමැතිතුමා පිළිබඳ විශ්වාසය මෙහිදී මා අමතක කරන්නේ නැහැ. එය ඉෂ්ට වුණොත් මේ අය ආපසු ඉන්දියාවට ඇතුළු කිරීමේ ප්‍රශ්නය ඉබේම වාගේ විසඳේවිය කියා අගමැතිතුමාගේ ප්‍රකාශය අනුව අප කල්පනා කරනවා.

සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මේ ගරු සභාව මගින්, මා රටට මතක් කර දෙන්න කැමතියි, එම 5,25,000න් එක්කෙනෙකුටවත් ඉන්දියාවෙන් පුරවැසිකම් ලැබුණත්, ආපසු ඉන්දියාවට යෑමේ ප්‍රශ්නය ඉෂ්ට වෙන්නට නම් මුලින්ම ලංකාවේ ආන්ඩුවෙන් යම්කිසි කටයුතු සහ යුතුකම් ඉෂ්ට වෙන්න තිබෙන බව. එසින් ප්‍රධාන කටයුත්තක් වන්නේ ඔවුන්ට රුපියල් 4,000ක් දක්වා මුදලක් ඉන්දියාවට යන විට ගෙනයන්නට තිබෙන අයිතියයි. ඒ නිසා, මෙයින් එක් කෙනෙකුවත් ඉන්දියාවට පිටත් කිරීමේ ප්‍රශ්නය මතු කරනවා නම් ඒ මුදල් ගෙන යෑමට වුවමනා විදේශ විනිමය අපේ ආණ්ඩුව විසින් කල් ඇතිව වෙන් කර තිබිය යුතුයි. ඉන්දියාවට ගෙන යෑම සඳහා අවශ්‍ය විදේශ විනිමය මේ අයවැය ලේඛනයෙන් වෙන් කර නැත්නම්, එන අවුරුද්දේදී ඉන්දියාවේ පුරවැසි භාවය කී දෙනකුට ලැබුණත් ඒ එක්කෙනෙකුවත් මේ රටෙන් පිට නොවෙනවා ඇති. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) "බජට්ටුව" කියන වචනය පාවිච්චි කළා. සිංහල දන්නේ පණ්ඩිතයන් විතරක්යැයි ඔප්පු කරන්නට මේ රටේ බොහොම ලොකු උත්සාහයක් ගන්නවා. ඒ නිසා මා බොහොම භයයි, වචන පාවිච්චි කරන්නට. මගේ විශ්වාසයේ හැටියට, අපේ මවු භාෂාවෙන් අප දන්නා ප්‍රමාණයට කරුණු විමසීමට අප ඉදිරිපත් වෙනවා නම්, අපට වැඩියෙ ඉතාමත් හොඳට සිංහල දන්නා මේ ගරු සභාවේ ඉන්නා මන්ත්‍රීවරුන්ගෙන් අපට වචනයක් දෙකක් ඉගෙන ගෙන සිංහල භාෂාව පාවිච්චි කිරීමේ දියුණුවක් අපට ලබා ගන්නට පුළුවන්. මා එය සඳහන් කළේ අමතර වශයෙනුයි.

අපේ මුදල් ඇමතිතුමාගේ මහා බජට්ටුවත්, විදේශ විනිමය බජට්ටුවත් මා ඉතා ප්‍රවේශමින් බැලුවා. එසේම මේ ඇස්තමේන්තු පොත බැලුවා පමණක් නොව ඒ පිළිබඳ කොණපත බැලීමට දන්නා ලෝකයේ ඉන්නා විශේෂඥයන්ගෙන් කෙනකු වත, මගේ දකුණු අත පැත්තේ ඉන්නා යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගෙනුත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) මා ආධාර ලබා ගෙන තිබෙනවා, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව ඉන්දියාවේ පුරවැසි භාවය ලැබෙනවායැයි කියන එකම පුද්ගලයකුවත් ඉන්දියාවට යැවීම්ට මේ පොතේ කොයි මුල්ලකවත් තඹ සල්ලි භාගයක මුදලක්වත් වෙන් කර තිබෙනවාද කියා සොයා බැලීමට. ඒ සඳහා තඹ සල්ලි භාගයක්වත් වෙන් කර නැතැයි මා කියනවා. මේ කටයුත්ත වෙනුවෙන් දෙපාර්තමේන්තුවක් හැදීමට නම් මුදල් වෙන් කර තිබෙනවා. පොත් පත් සකස් කිරීමට නම් මුදල් වෙන් කර තිබෙනවා. "10,000 ක් ඉන්දියානු පුරවැසි භාවය ඉල්ලනවා, දැන් ලැබෙන්නට යනවා" ආදි වශයෙන් පත්තරවලින් නම් අපට කියනවා. ඒ නීතිය අනුව ඉන්දියානු පුරවැසි භාවය ලැබී ලංකාවේම ඒ අය හිටිනවාද නැද්දැයි අප ප්‍රශ්නයක් මතු කර තිබුණා. මේ කටයුත්ත සම්බන්ධයෙන් තඹ සල්ලි භාගයකවත් මුදලක් මේ අයවැය ලේඛනයෙන් වෙන් කර නැති බව මා ඉතා බලවත් ලෙස කියනවා. එසේ නම්, ඒ 5,25,000න් කී දෙනකුට ලබන මුදල් වර්ෂය තුළදී ඉන්දියාවේ පුරවැසි භාවය ලැබෙනවාද, ඒ අනුව කී දෙනකුට ලංකාවේ පුරවැසි භාවය ලැබෙනවාද යන්න පැහැදිලි කරනවාද? ඒ ගණන්-හිලව් කොපමණ වුණත්, ඒ 5,25,000 න් එක් කෙනකුවත් ඉන්දියාවට යැවීමට මුදල් වෙන් කිරීමේ අදහසක් මේ අයවැය ලේඛනයෙන් පෙනෙන්නේ නැහැ.

අ. භා. 6.45

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

What is your point? Is it your point that the Government must provide—[*Interruption*].

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

The foreign exchange.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Is it not for them to get the foreign exchange ?

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

No, Sir. Excuse me, Sir. Now that you are talking in English I will talk in English.

The point at issue, may I explain in answer to your question—[*Interruption*]. That question is appropriate and must be dealt with. Length is the right of the Opposition ; the Government's task is to reply. It is we—[*Interruption*].

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මා හෙට අනිද්දා දඹදිව වන්දනාවේ යන්නට අදහස් කරගෙන සිටිනවා. ඒක ටත් මීදල් වෙන් කරලා නැහැ මේ අය වැය ලේඛනයෙන්.

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

වන්දනාවේ ගොස්, තමන් කළ වැරදිවල සාපයෙන් බේරෙන්නට බාරයක් ඔප්පු කරලා ඕන නම් පඩුරකුත් බැඳලා එනවා නම් හොඳයයි මා විශ්වාස කරනවා. මිනිසුන්ගෙන් පළිගත් සාපයෙන් බේරෙන්නට කොහේ වන්දනාවේ ගියත් පුළුවන් වන්නේ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේ උසාවියෙ කතා කරලා එල්ලන්න නියම වුණු මිනිසුන්ගේ සාපය .....[බාධා කිරීම්]

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

ඔව්, අප කතා කරලා මිනිසුන් එල්ලා තිබෙනවා. කවදාහරි තමුන්නාන්සේ උසාවියකට ගෙන යන්නේ නැතිව මහ ජනයා ඉදිරිපිට එල්ලනවා. තමුසේ කර තිබෙන ලජ්ජා නැති පළි ගැනීම්වල හැටියට.....[බාධා කිරීම්]

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කැළණි ගඟෙන් නාල එන්න ඕනෑ ඒවට.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Will the hon. Member please address the Chair ?—[*Interruption*]

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Sir, I am addressing that rogue through the Chair.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)

Order, please ! That word—[*Interruption*]

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Withdraw that word. You are the bloodiest rogue—[*Interruption*]

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

It is only a scoundrel who will dare to refer to a man's profession in that caddish way.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

Don't play that game with me.—[*Interruption*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Did the hon. Member use the word "rogue"?

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
Yes, Sir, I did.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
He is a bloody rogue.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Will the Hon. Minister please sit down? Both Members must withdraw that word.

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
Sir, I withdraw that.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Will you also withdraw it?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
I withdraw it.

සභාපති
(அக்கிராசனர்)
(The Chairman)
Let us proceed with the Debate without these things.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
I followed your argument. I shall reply. I am going out for a cigarette.

ආචාර්‍ය කොල්වින් ආර්. ද සිල්වා
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)
If you have the reply I shall be glad to have it, but I am answering the Chairman now.

Let us get this clear. According to the law that has been passed in this House, the sending abroad of anybody under the Sirima-Shastri Pact depends upon his right to take away cash up to Rs. 4,000. That is part of the pact. I raised that question during the Debate when the Bill was discussed, and the Hon. Prime Minister himself admitted that certainly the people who will have to go back in terms of the law will be entitled to those rights under the pact in respect of the taking away of money. Therefore, Sir, there is no question of anybody going back unless there is provision of foreign exchange by this Government which enables the taking away of the money by that person. In this Estimates Book or in the Foreign Exchange Budget or in any other part of the Budget, the Minister of Finance will agree, there is not a cent put aside from the foreign exchange for the financing of the departure of the persons who will receive Indian citizenship under this pact. There is money put aside for the creation of a department and all that business. That is the technical and administrative side at this end. But so far as that Debate was concerned, one of the central questions, in fact the central question, was that, namely, whether by hitching your granting of Ceylon citizenship not to the question of repatriation as was arranged in the Sirima-Shastri Pact but to the question of India giving citizenship to the 525,000 people independently of the question whether they are repatriated or not, you are ensuring the possibility of the continuance of that group here indefinitely by the simple device that you do not provide the money. It may be that you do not have the money but that is the point that arises as a result of the non-provision of that money.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

In this Budget—in any part of it, whether in the Estimates book or elsewhere—there is not a cent appropriated in foreign exchange for this task. Therefore, one is entitled to draw the conclusion that, as far as the Government is concerned, since the Budget is what gives flesh and blood to policy, it is not contemplated that a single person will be repatriated in the coming year. Thus you can get Ceylon citizens in proportion to the number of Indian citizens that will be created in Ceylon—the very danger against which the Opposition spoke during the Debate—by reason of your failure to make provision. That is my point and I am sorry I have had to have perhaps a totally undesirable exchange with the Hon. Minister of Education.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

ගරු සභාපතිතුමනි, ගරු අගමැතිතුමා ගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති අංශයේත් වැය ශීර්ෂ ගැන කල්පනා කරන විට, හුඟ කලක සිට මට වැටහී තිබුණු කරුණක් තවත් ස්ථිර වන බව මට අවබෝධ වෙනවා. මේ රටේ අගමැති ධුරයට ඇඳා තිබෙන වගකීම් දෙස බැලූ යාපනේ ගරු මන්ත්‍රීතුමා (ජී. ජී. පොන්නම්බලම් මයා.) මෙම සාකච්ඡාවේදී සමහර විට යම් යම් ප්‍රශ්නවලට උත්තර නොලැබෙන්නට පුළුවන් යයි කිව්වා. එතුමා එසේ කිව්වේ එකිනෙකට කිසිම සම්බන්ධකමක් නැති කරුණු රාශියක් එකට ඇඳා තිබෙන නිසයි. මට පෙනෙන හැටියට, ඒ තත්ත්වය නිසා සමහර ප්‍රශ්නවලට උත්තර නොලැබෙනවා පමණක් නොව, අගමැතිතුමා වෙත පැවරී තිබෙන වගකීම් ක්‍රියාත්මක කිරීමේදී යම් යම් කරුණු අතපසු වන්නටත් ඉඩ තිබෙනවා. රටේ ආරක්ෂක කටයුතු පිළිබඳ වගකීමත් විදේශ කටයුතු පිළිබඳ වගකීමත් අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය පිළිබඳ වගකීමත් අගමැතිවරයකු විසින් එකට සම්බන්ධ කරන්නේ කෙසේද යන වග මට නම් තේරෙන්නේ නැහැ. සෑම දෙයක්ම බණ්ඩාර මහත්මයා අතට ගොස් තිබෙන එක පුදුමයක්ද? සාර්ලිමේන්තු ලේකම්වරයකු වශයෙනුත් තානාපතිවරයකු වශයෙනුත් ඇතුළතිනුත් පිටතිනුත් මාත් විදේශ කටයුතුවලටත් ආරක්ෂක කටයුතුවලටත් සම්බන්ධව සිටි කෙනෙක්. 1958 අවුරුද්ද මට මතකයි. හදිසි අවස්ථා එමට ඇති වුණා. දැන් හදිසි අවස්ථා නතර කරන්නට පුළුවන්කම තිබියදීත් එසේ නොකර එය තව දුරට පවත්වා ගෙන යනවා.

අද අගමැතිතුමා ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන් එතුමාගේ වගකීම් ක්‍රියාත්මක කරන අන්දම ගැන බලන විටත්, ඒ වාගේම එතුමා යටතේ සේවය කරන නිත්‍ය ලේකම්තුමා එතුමාගේ වගකීම් ක්‍රියාත්මක කරන ආකාරය දෙස බලන විටත්, ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට වැඩි කාලයක් යොදන්නට සිදු වන බව අපට පෙනෙනවා. ඒ නිසා, එපමණම වැදගත්කමක් ඇති වෙනත් කරුණු සඳහා යොදන්නට පුළුවන් වන්නේ සුළු කාලයකුයි. මේ වගකීම් බෙදී ඇති අන්දම ගැන කල්පනාව යොමු කරන විට, ගරු අගමැතිතුමාටත් එතුමා සමග කිට්ටුවෙන් කටයුතු කරන විශෙෂ වගකීම් ඇති නීලඩාරීන්ටත් ඒ ඒ වගකීම් ගැන අවශ්‍ය තරම් කාලය යොදා ක්‍රියා කරන්නට පුළුවන්කම තිබෙනවාද යන්න ගැන අප තුළ සැකයක් ඇති වෙනවා. සැලසුම් පිළියෙළ කිරීමේ අංශයත් මීටම ඇදී තිබෙනවා. එයත් ඉතාමත් වැදගත් අංශයක්. මෙවැනි වැදගත් අංශ සම්බන්ධව සාකච්ඡා කරන්නට අපට මේ ගරු සභාවෙහිදී පවා ලැබෙන්නේ ඉතා සුළු කාලයක් පමණයි. එම නිසා අගමැති අංශයත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති අංශයත් සම්බන්ධ සෑම කරුණක්ම දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන්නට මා අදහස් කරන්නේ නැහැ. එහෙත් එක් අංශයක් ගැන පමණක් මා විශේෂයෙන් කරුණු දක්වන්නට බලා පොරොත්තු වෙනවා.

අපේ ආරක්ෂක ඇමති අංශය යටතේ හමුදා 3 ක් තිබෙනවා. එනම්: යුද්ධ හමුදාව, නාවික හමුදාව හා අහස් හමුදාවයි. ලංකාව වැනි කුඩා රටක අභ්‍යන්තර ආරක්ෂාව හා සාමය සඳහා යුද්ධ හමුදාවක් අවශ්‍ය බව අපට පිළිගන්නට පුළුවනි. එහෙත්, නාවික හමුදාවත් අහස් හමුදාවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙරෙහි පැවති නිබෙන වගකීම් මොනවාද යන්න පිළිබඳව අපට පැහැදිලි අවබෝධයක් නැහැ. අපේ රටට පිටතින් හොර රහසේ එන විදේශිකයින්—සාමාන්‍යයෙන් භාවිතා වන වචනයකින් කියනොත් කල්ලතෝනීන්—නතර කිරීම සඳහා නාවික හමුදාවත් පාවිච්චි කරන්නට පුළුවනි. එහෙත් නාවුක හමුදාවටත්, ගුවන් හමුදාවටත් වැය කරන මුදල අවුරුද්දෙන් අවුරුද්ද එන්ට එන්ටම වැඩි වන බව අපට පෙනී යනවා. නාවුක හමුදාවේ ප්‍රතිසංවිධානයක් ඇති කර මෙය රටට ප්‍රයෝජනවත් වන ආකාරයට හැඩ ගස්වා ගන්ට බැරිද? මට පෙනෙන හැටියට නම් නාවුක හමුදාවක් හැටියට මේ රටට විශාල හමුදාවක් පවත්වාගෙන යන්ට ශක්තියක් නැහැ. එම නිසා මුහුදේ ජීවිතාරක්ෂක කටයුතු සඳහාත් අපේ රටේ අද නැත්නම් අනාගතයේදී හෝ අවශ්‍ය වන්නාවූ වෙළඳ නාවුක සේවයකට මූලික ආරම්භක කටයුත්තක් වශයෙනුත් මෙම නාවික හමුදාව සංවර්ධනය කර පවත්වාගෙන යාම වැදගත් යයි මා කල්පනා කරනවා. විශාල රටවල තිබෙන නාවුක හමුදාවල තත්ත්වයට අපේ නාවුක හමුදාව දියුණු කරන්ට අපට පුළුවන්කමක් තිබෙනවා යයි මා විශ්වාස කරන්නෙ නැහැ. එහෙත් විශේෂයෙන්ම අනාගතයේදී අපට අවශ්‍ය වන්නා වූ වෙළඳ නාවුක සේවයකට ප්‍රයෝජනවත් වන පරිදි මේ මාගීයෙන් යම්කිසි වැඩ පිළිවෙලක් සකස් කර ගන්ට පුළුවන් යයි මා කල්පනා කරනවා. ඒ සම්බන්ධයෙන් මා කියන්නෙ එපමණයි.

ගරු සභාපතිතුමනි, චීන නානාපති කාර්යාලය මගින්—මගේ හිතේ කිසිම සැකයක් නැහැ. චීන මහජන සමූහාණ්ඩුවේ අනුදැනුම ඇතිව වෙන්ට ඕනෑ—කොළඹ වරායේ නැවක ඇතිවුණු ඒද්ධියක් සම්බන්ධයෙන් අපේ ආණ්ඩුවට යම්කිසි සන්දේශයක් භාර දී තිබෙන බව ඊයේ-පෙරේදා පත්‍ර මාගීයෙන් අපට දකින්ට ලැබුණා. අද සහ ඊයේ පත්‍රවල පළ කළ පිළිතුර විනා අපට මේ පිළිබඳව ආණ්ඩුවෙන් පැහැදිලි විස්තරයක් තවම ලැබී නැහැ. මේ සම්බන්ධයෙන් ආණ්ඩු තත්ත්වය විස්තර සහිතව පැහැදිලි කර නවා ඇතැ යි අප කවුරුත් බලාපොරොත්තු වෙනවා.

නව. එහෙත් මේ ඒද්ධියේ පසුබිම සම්බන්ධ කරගෙන මා වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්ට කැමතියි.

අ. භා. 7

ගරු සභාපතිතුමනි, මේ නැවේ සිදුවුණාය කියන ඒද්ධිය බරපතළ එකක්ද නැද්ද යි අපට පැහැදිලි නැහැ. අගමැතිතුමා අපට ඒ සම්බන්ධව විස්තරයක් කරාවි. එහෙත් සුළු වශයෙන් හෝ ඒ විධියේ වංචාවක් හෝ හොරකමක් නැවේ සිදු වුණත් වග කියයුතු ආණ්ඩුවක් එය විශාල දෙයක් හැටියට සලකා අපට ටිකක් බලවත් භාෂාවෙන් සන්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ කට මේ ආණ්ඩුවෙන් පිළිතුරක් දී තිබෙනවා. එහෙත් චීන සමූහාණ්ඩු රාජ්‍යයත් මේ රටත් අතර මෙවැනි තත්ත්වයක් ඇති වන්ට හේතුවූ පසුබිම ගැන අපි ටිකක් සොයා බලන්න ඕනෑ. මේ ආණ්ඩුවේ පිළිතුරේ සඳහන් වී තිබෙනවා, අපේ අභ්‍යන්තර කරුණු ගැන ඇඟිලි ගැසීමට අපි ඉඩ දෙන්නෙ නැහැ කියා. ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම පැහැදිලිසි. එය ඉතාම වැදගත්. චීන මහජන සමූහාණ්ඩුවෙන් පමණක් නොව වෙනත් සමාජවාදී ආණ්ඩුවකින් පමණක් නොව බටහිර ආණ්ඩුවකින් හෝ වෙනත් රටකින් හෝ මේ රටේ අභ්‍යන්තර කරුණුවලට ඇඟිලි ගැසීම ගැන විරුද්ධභාවය සිටින අප සෑම කෙනෙක්ම විරුද්ධ බව මේ අවස්ථාවේදී පැහැදිලිව ප්‍රකාශ කරනවා. එහෙත් අපි මේක කිව්වට මදි. එක රටක් හෝ රටවල් කීපයක් පමණක් මේ ඇඟිලි ගැසීම්වලට සීමා වෙනවද කියා සොයා බැලුවටත් මදි. අප විසින් ප්‍රතිපත්තියක් හැටියට සොයා බලන්න ඕනෑ, අපට පෙනෙන ආකාරයටත් අපට නොපෙනෙන ආකාරයටත් නොයෙක් රටවලින් එවැනි ඇඟිලි ගැසීම් ඇති වෙනවද කියා. එම නිසා මෑත කාලයක සිට මේ ඇඟිලි ගැසීම් ගැනත් සමහර විට මේ ඇඟිලි ගැසීම් ගැන ආණ්ඩුවේ නිලධාරීන් කිව්වාය කියන දේවලුත් පත්‍ර මාගීයෙන් කියවන විට අප තුළ සැකයක් ඇති වී තිබෙනවා. සමහරකුට ඇඟිලි ගසන්නට නොයෙක් ඉඩකඩ සලසා දී තිබෙන අතර, සමහරකුගේ ඇඟිලිගැසීම සම්බන්ධව විශේෂ පරීක්ෂණ පවත්වනවාද කියා අප තුළ සැකයක් තිබෙනවා. විරුද්ධ පක්ෂයේ සිටින අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

සියලු දෙනාම මේ රටේ අභ්‍යන්තර කටයුතු වලට මොනම රටක්වත් ඇඟිලි ගසනවාට විරුද්ධයි. යම් රටක් ඒ විධියට ඇඟිලි ගසනවා නම් එය වහාම නැවැත්වීම අවශ්‍යයි. නමුත් යම් කොටසකට ඉඩ දී යම් කොටසක් වෙන් කරන ආකාරයට යම් පිරිසක් ක්‍රියා කරනවා නම්, නොයෙකුත් වැරදි හැඟීම් ඇති වෙන්නට පුළුවනි. එයින් අපේ මිත්‍ර රටවල් වැරදි හැඟීමක් ඇති කර ගන්නට පුළුවනි. එසේ වැරදි හැඟීමක් ඇති කර ගත්තොත් ඒ රටවලින් අපට ලැබෙන ලාභ ප්‍රයෝජනවලටත් ඒ රටවල් සමග ගෙන යන වෙළඳාමටත් පහරක් වදින්නට පුළුවනි.

ගරු සභාපතිතුමනි, චීන මහජන සමූහාණ්ඩුව පිළිබඳව 1957 සිටම, අප එක්සත් ජාතීන්ගේ මණ්ඩලයට ඇතුළත් වූ දා සිටම, එක්තරා ක්‍රියා මාර්ගයක් අර ගෙන තිබෙනවා. චීනය නියෝජනය කරන එකම ආණ්ඩුව චීන මහජන සමූහාණ්ඩුවය කියා අප පිළිඅරගෙන තිබෙනවා. එම ආණ්ඩුව පිළිගත යුතුය කියා සෑම ජාත්‍යන්තර මණ්ඩලයකදීම පමණක් නොවෙයි සෑම අවස්ථාවකදීම අප කියා තිබෙනවා. නමුත් මෑතක සිට ඒ ප්‍රතිපත්තිය සම්බන්ධව යම් පටලැවිලි සහගත හැඟීමක් මහජන තෑව තුළ ඇති වී තිබෙනවා. චීන මහජන ආණ්ඩුවත් තායිවානයත් අතර පවතින සම්බන්ධය නැත්නම් තත්ත්වය කුමක්ද කියා ගරු ඇමතිතුමා දන්නවා ඇති. නමුත් මෑතක සිට මේ රටේ යම් යම් සම්මේලනවලටත්, ඒ වාගේම තායිවානයේ යම් යම් සම්මේලනවලටත් අපේ නියෝජිත පිරිස්වලට, කණ්ඩායම්වලට සහභාගි වන්නට ඉඩ හැර තිබෙන බව අප පත්‍ර මාගීයෙන් දුටුවා. මෙයින් චීනය පිළිබඳව අප මෙපමණ කාලයක් තුළ අනුගමනය කළ ප්‍රතිපත්තිය, චීනය නියෝජනය කරන එකම ආණ්ඩුව චීන මහජන ආණ්ඩුවය කියන ඒ ප්‍රතිපත්තිය, දැන් අත්හැර තිබේනවාදෝ කියා හැඟීමක් ඇති වෙන්නට පුළුවනි. මේ තත්ත්වය පිළිබඳව මට දීර්ඝ වශයෙන් විස්තර සහිතව කරුණු ඉදිරිපත් කරන්නට පුළුවනි. එහෙත් එයින් මගේ කථාව දීර්ඝ වන නිසා විස්තර සහිතව කරුණු ඉදිරිපත් කරන්නට මා අදහස් කරන්නේ නැහැ. මෙවැනි කරුණු උඩ සමහර විට චීනය සමග මේ පමණ කාලයක් තුළ අප පවත්වාගෙන ආ මිත්‍ර සම්බන්ධතාවයටත්, ඒ වාගේම වෙළඳාමටත්, පහරක් වදින්නට ඉඩ තිබෙනවා. අපට විශාල පාඩුවක් ඇති වන තත්ත්වයක් පැන නගින්නට ඉඩ තිබෙනවා.

චීනය පිළිබඳව යම් ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා නම් මේ රටේ පත්‍ර විශාල උනන්දුවකින් ඒ ප්‍රශ්න තව තවත් දරුණු වන ආකාරයට, කලබලකාරී තත්ත්වයක් ඇති වන ආකාරයට, ක්‍රියා කරනවාද කියා අප තුළ සැකයක් ඇති වී තිබෙනවා. පසුගිය මැතිවරණ කාලයේදී ලංකාවත් චීනයත් අතර තිබෙන නාවුක ගිවිසුම ගැන මේ රටේ පත්‍ර ගෙන ගිය ප්‍රචාර ගැන මට මතකයි. ඒ ප්‍රචාරවලින් මහජනතාව තුළ යම් යම් වැරදි සහගත හැඟීම් ඇති වුණා. පසුගිය මහා මැතිවරණ කාලයේදී අගමැතිතුමාත් සෑහෙන ප්‍රමාණයකට එවැනි ප්‍රචාර ගෙන ගියා. නමුත් ඒ ගිවිසුමෙන් හානියක් නොවන බව ගරු අගමැතිතුමා දන් පිළිඅරගෙන තිබෙනවා. මේ දක්වා ඒ ගිවිසුම පිළිබඳව කිසිවක් කර නැහැ. එහෙත් මේ ගිවිසුම ගැන මේ රටේ පත්‍ර වගකීමක් නැතිව නොයෙකුත් ප්‍රචාරයන් ගෙන ගියා. දැන් නැවතත් චීන රට පිළිබඳ ප්‍රශ්නයක් මුල් කරගෙන මේ රටේ පත්‍ර විශාල ප්‍රචාරයක් ගෙන යනවා. එම නිසා මේ ආණ්ඩුව චීන මහජන ආණ්ඩුව පිළිබඳව දැනට ගෙන යන ප්‍රතිපත්තිය කුමක්ද, අනාගතයේදී ගෙන යන ප්‍රතිපත්තිය කුමක්ද, කියා අප අගමැතිතුමා ගෙන් ප්‍රශ්න කරනවා.

ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් ගැන සඳහන් කරන්නට කැමතියි. දැනට කලකට පෙර එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මහා ලේකම්තුමා මේ රටට පැමිණුනා. එතුමා මේ රටේ සිටි කාලයේදී අගමැතිතුමා සහ එතුමා අතර සාකච්ඡා පැවතුණා. ඒ සාකච්ඡාවලින් පසු අපට පත්‍ර මාර්ගයෙන් දැන ගන්නට ලැබුණා වියට්නාම් ප්‍රශ්නය සම්බන්ධව සම්පූර්ණ සාකච්ඡාවක් ඇති වුණු බවත්, ඒ ප්‍රශ්නය විසඳීමට අගමැතිතුමා යම් යම් මාගී පෙන්වා දුන් බවත්. ඊට පසු අපට පත්‍ර මාර්ගයෙන් දැන ගන්නට ලැබුණා, චීනයේ සිටින අපේ තානාපති තුමත්, අගමැතිතුමාගේ ඒ ක්‍රියා මාර්ගය ගැන සාකච්ඡා කිරීමට හැනෝයි නගරයට ගිය බව. පත්‍ර

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

මාර්ගයෙනුයි, එය අපට දැන ගන්නට ලැබුණේ. එය කෙතරම් දුරට සත්‍යද කියා අප දන්නෙ නැහැ. එසේම අගමැතිතුමා කැනඩාවට ගිය අවස්ථාවේදී කැනඩාවේ අගමැතිතුමා සමඟත් වියට්නාම් ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කළ බව අපට පත්‍ර මාඟී යෙන් දැන ගන්නට ලැබුණා. මා හිතන පිළිවෙළට මේ වියට්නාම් යුද්ධය අද මුළු ලෝකයටම විශාල තර්ජනයක් වී තිබෙන බව කව්රුත් පිළිගන්නවා. මේ තත්ත්වය ඇති වීමට හේතුව කුමක්ද යන්න අප කව්රුත් දන්නවා. මේ හේතූන් මොනවා ද යන්න ගැන සමහර උදවියගේ සිත් තුළ නොයෙක් නොයෙක් හැඟීම් තිබෙන වා. එහෙත් අද වියට්නාමයේ ගෙන යන සටන ඒ රටේ මහජනතාවට කොම්යුනිස්ට් වාදය බලයෙන් කැවීමට—ඒ රටේ බලහත්කාරයෙන් කොම්යුනිස්ට් වාදය බිහි කිරීමට —ගෙන යන එකක් නොව පසුගිය දෙවන ලෝක මහා සංග්‍රාමය කාලයේදීත්, ඊට පසුවත් ඒ රටේ ජනතාව ප්‍රංශ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව ගෙන ගිය සටන සම්පූර්ණ කිරීමේ ව්‍යාපාරයක් බව කාටත් පැහැදිලියි. ඒ ජනතාව ප්‍රංස අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව ගෙන ගිය සටන සම්පූර්ණයෙන් අවසාන වෙලා නැහැ. නොයෙක් නොයෙක් හේතූන් නිසා—රට දෙකොටසකට වෙන් වීම නිසා—ඒ සටන සම්පූර්ණයෙන් අවසාන වුණේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ ලෝකයේ ඉතාම බලසම්පන්න රටවල විදේශ ඇමති අංශවලට ලෝකයේ තත්ත්වය කුමක්ද යන්න ගැන සත්‍ය තොරතුරු දැන ගැනීමට යම් යම් ඉඩ පහසුකම් තිබෙනවා නම් එවැනිම ඉඩ පහසුකම්—සමහර විට ඊටත් වඩා ඉඩ පහසුකම්—ඒ සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මහා ලේකම්තුමාට තිබෙනවා. වියට්නාමයේ ජනතාවගේ නිදහස ආරක්ෂා කිරීමටත්, අමෙරිකන් ආණ්ඩුවේ මැදහත්වීම හේතුකොටගෙන එහි ඇති වී තිබෙන මනුෂ්‍ය ඝාතනය නැවැත්වීමටත් ලෝකය පුරාම සැරිසරා දරන්නට පුළුවන් සෑම මහන්සියක්ම දරා තිබෙන පුද්ගලයෙක් තමයි, එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ මහා ලේකම්තුමා. මේ ප්‍රශ්නය විසඳීමට එතුමා නොයෙක් යෝජනා ඉදිරිපත් කළා. ඒ එකක්වත් සාර්ථක වුණේ නැහැ. වියට්නාමයේ අද ගෙන යන සටන එහි මහ ජනයාට කොම්යුනිස්ට් ක්‍රමයක් බලයෙන් කැවීමට ගෙන යන එකක් නොව වියට්නාම් ජාතිකයන්ගේ නිදහස පිණිස ගෙන යන එකක් බව එක්සත් ජාතීන්ගේ මහා ලේකම්තුමා පැහැදිලිවම කියා තිබෙනවා. අද ලෝකයේ ඉතා ලොකු වගකීමක් දරන එවැනි පුද්ගලයකුත් මේ තරම් පැහැදිලි ලෙස ඒ බව කියා තිබෙද්දී, අවශේෂ ලෝකයාටත් ඒ බව පැහැදිලිවම පෙනෙද්දී, මේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් අපේ ආණ්ඩුව ගෙන යන ප්‍රතිපත්තිය අනුව යුද හමුදා ඉවත් කළ යුතුය කියන ඉල්ලීම කරන විට, දෙපැත්තේම ඇඟිලි ගැසීම් නැවැත්විය යුතුය කියා ගරු අගමැතිතුමා තවමත් කියනවාද? මෙම මනුෂ්‍ය ඝාතනය නොකඩවාම දිගටම කර ගෙන යාමට හේතු වී තිබෙන්නේත් ඒ වාගේම එසින් ලෝක සාමයට විශාල තර්ජනයක් වීමට හේතු වී තිබෙන්නේත් ලෝකයේ පොලිස් කාරයා හැටියට ක්‍රියා කිරීමේ වගකීම තමන් විසින්ම පවරා ගෙන ක්‍රියා කරන එක රටක් නිසාය කියා අප පැහැදිලිවම ප්‍රකාශ කළ යුතු අතරු, එක සමාන අදහස් දරන ආණ්ඩු එකට ඒක රාශි වී තරයේම ඉල්ලීමක් කරන්න බැරිද, එක සමාන ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්න බැරිද කියා ප්‍රශ්න කරන්න කැමතියි.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මිගමුව)
(திரு. என். டென்சில் பெர்ணாண்டோ—நீர் கொழும்பு)
(Mr. N. Denzil Fernando—Negombo)
ඇසි පිබැවයෙ?

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)
පිබැවය ගැන මිගමුවෙ ගරු මන්ත්‍රීතුමාට උගන්වන්න ගියොත් මට පැය ගණනක් ගත වේවි.

ගරු සභාපතිතුමනි, මේ වාගේම මුළු ලෝකයටම අද බලපාන ප්‍රශ්නයක් තමයි මැදපෙරදිග ප්‍රශ්නය. විශේෂයෙන්ම අපට මේ ප්‍රශ්නය බලපානවා. ඛනිජ තෙල් නීති ගත සංස්ථාවට ගෙන්වන තෙල් සඳහා, නැව් ගාස්තු වැඩි කර ඇතත්, වාසනාවකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

මෙන් ඒ පාඩුව ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටම දරන්නටයයි ආණ්ඩුවෙන් කියා තිබෙනවා. මා දන්නෙ නැහැ, කොපමණ කල් මේ පාඩුව එම සංස්ථාවට දරන්න පුළුවන්වේද කියා. මේ තත්ත්වය දිගින් දිගට පැවතුනොත් යම් කාලයක පෙට්‍රල් මිල, භූමිතෙල් මිල වැඩි වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ වාගේම යුරෝපයෙන් ගෙන්වන වෙනත් ද්‍රව්‍ය සඳහා නැව් ගාස්තු වැඩි වීමෙන් එයත් අපට බොහෝ දුරට බලපා ඇති බැව් අප දන්නවා. එම නිසා මෙය ලෝක සාමය පිළිබඳ හෝ එක්සත් අරාබි ජනරජයට හෝ අරාබි ජාතීන්ට පමණක් බලපාන ප්‍රශ්නයක් නොවෙයි; අපේ ජීවනාලියට ඉතාම කිට්ටුවට ඇති ප්‍රශ්නයක් බව අමතක කරන්න නරකයි. අද, සූවස් ඇල වසා දමා තිබෙනවා. නමුත් අද පවතින තත්ත්වය අනුව සූවස් ඇල නිකම් විවෘත කරාවිය කියා කිසිවකුට බලා පොරොත්තු වන්න බැහැ. යම් යම් හේතූන් උඩ, කිසිම බලාපොරොත්තුවක් නැතුව, කල්වේලා ඇතුව යොදා ගත් හොඳ සැලැස්මක් අනුව හදිසියේම ප්‍රහාරයක යෙදී එක්සත් අරාබි ජනරජය සතු කොටස් ඊශ්‍රායලය විසින් අද අත්පත් කරගෙන තිබෙනවා. මේ තත්ත්වය නිසා, ඊශ්‍රායලය මුළු ලෝකයටම තර්ජනයක් වී ඇති බව විස්තර නොකළාට අප කවුරුත් පිළිගන්නවා.

ගරු සභාපතිතුමනි, මෙම ආණ්ඩුවේ නියෝජිතයන් විසින් අගමැතිතුමාගෙ නියෝජිතයන් විසින්, එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේදී, ඊශ්‍රායලය විසින් අත්පත් කර ගත් ප්‍රදේශවලින් ඔවුන් ඉවත් විය යුතුය කියා ප්‍රකාශ කළ බව ඇත්ත. ඒ අදහස අපත් සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. නමුත් ඉන් එහාට කොහේද යන්නෙ? අප කිසි විටෙකත් කියන්නෙ නැහැ, යුද්ධයක මාර්ගයෙන් අත්පත් කර ගත් කොටස් නිදහස් කර ගත යුතුය කියා. පුළුවන් තරම් සාමකාමීව, එසේ අත්පත් කර ගත් කොටස් ආපසු එක්සත් අරාබි ජනරජයටත් අනිකුත් මැදපෙරදිග ජාතීන්ටත් ලබාගැනීමට ආධාර දීම අපේ ආරක්ෂාවටත්, වාසියටත් හේතුවනවා පමණක් නොවෙයි, අලුතෙන් නිදහස් වුණු රටක් හැටියටත්, ඒ වාගේම අලුතෙන් ලබාගත් නිදහස ආරක්ෂා කර ගෙන නවීන රාජ්‍යයක් වන්නට තැත් කරන රටක් හැටියටත්, ලංකාවත් එක්සත් අරාබි ජනරජයත් අතරේ දේශපාලන වශයෙන් ඇති කිට්ටු සම්බන්ධතාවය අනුව කල්පනා කර බලන විට අධිරාජ්‍යවාදී බල වේගයන්ගෙන් නිදහස් වී ප්‍රගතිශීලී මාර්ගයන් ඔස්සේ 'ගොස් තමන්ගේ නිදහසත් තමන්ගේ දියුණුවත් ලබා ගැනීමට තැත් කරන රටක් හැටියටත්, අපේ සම්බන්ධතාවය තහවුරු වන අන්දමට මෙම ප්‍රශ්නයේදී සහයෝගයෙන් ක්‍රියා කිරීම ඉතාමත් වැදගත් බව සඳහන් කරන්න කැමතියි.

අ. භා. 7.15

එපමණක් නොවෙයි, ගරු අගමැතිතුමා පවා පිළිගන්නවා ඇති, එක්සත් අරාබි ජනරජයත් ලංකාවත් අතරේ ඇති වෙළඳාම තව තවත් දියුණු කර ගැනීමේ හේතුවෙන් එදාට වඩා අද, එම රාජ්‍යයන් සමග ඇති සම්බන්ධතාවයෙහි විශේෂ තත්ත්වයක් ගන්නා බව. මේ රටවල් දෙක අතරේ බඩු ආදිය හුවමාරු කර ගැනීම දිගටම කර ගෙන යාමටත්, අපේ රටට විදින්නට සිදු වී තිබෙන ආර්ථික උවදුරුවලින් ටිකක් වත් අඩු කර ගෙන ඒ කරදරවලින් මිදීම වත්, ඒ වාගේම යුරෙපීය රටවලින් ලැබෙන බඩුබාහිරාදියේ මිල නැඟීම මඳ වශයෙන් වත් වළක්වා ගැනීම සඳහාත් මේ ප්‍රශ්නය ඉතාමත් ඉක්මනින් විසඳන්නට ඕනෑ. මේ ආණ්ඩුවට මෙය විසඳීමට තරම් ශක්තියක් ඇතැයි, බලයක් ඇතැයි, මා හිතන්නේ නැහැ. ඒ කොයි හැටි වෙතත්, මෙහිදී අපට එක්තරා යුතුකමක් තිබෙනවා. දැනට මේ ආණ්ඩුව කරගෙන යන ප්‍රමාණයට වඩා ඉදිරියට යන වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. අනෙක, ආසියාවෙත්, අප්‍රිකාවෙත්, යුරෝපයේත් රටවල් සමග දේශපාලන ක්‍රමයන් උඩ මොන මොන වාදභේද තිබුණත් මෙවැනි පොදු ප්‍රශ්නවලදී අප මොන ක්‍රියා මාර්ගයක් ගත යුතුද යන්න ගැන ආණ්ඩුවේ තීරණය කුමක්දැයි ගරු අගමැතිතුමා විසින් පැහැදිලි කර දිය යුතුව තිබෙනවා.

තවත් සුළු සුළු කාරණා දෙක තුනක් ගැන පමණක් සඳහන් කර මගේ කථාව අවසන් කරන්නටයි මා බලාපොරොත්තු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන්නේ. අපෙ විදෙශ ප්‍රතිපත්තියත් අපේ වෙළෙඳ ප්‍රතිපත්තියත් අතර කිට්ටු සම්බන්ධතාවක් තිබිය යුතුයයි මා කල්පනා කරනවා. එහෙත් අද වෙළෙඳ තත්වය කොපමණ බැස තිබුණත්, අපේ විදේශ ප්‍රතිපත්තියේ බලපෑමක් නිසාදෝ අපේ වෙළඳපොළට් දියුණු කර ගැනීමට මීට පෙර ආණ්ඩුව තිබියදී සමාජවාදී ආණ්ඩු තිබෙන රටවල් සමග අප ගෙන ගිය සම්බන්ධතාවන් දැන් එක්තරා ප්‍රමාණයකට අඩු වී තිබෙන බව කියන්නට සිදු වීම ගැන මා කනගාටු වෙනවා. විරුද්ධ පාර්ශ්වයේ සිටින අපේ විශ්වාසය වී තිබෙන්නේ, මේ ආණ්ඩුව් බලයට ආවාට පස්සේ බටහිර රටවලින් විශාල ලෙස ආධාර බලාපොරොත්තුවෙන් ක්‍රියා කිරීම නිසා ඒ අයට තමන්ගේ අවංකභාවය පෙන්වීමට හැකි වන ආකාරයට සමාජවාදී රටවල් සමග වැඩි ගෙන ආ වෙළෙඳ සම්බන්ධතාවන් ටිකක් දුර කල්පනා කර අඩු කළා දෝ යන සැකයයි. ආණ්ඩුවේ වෙළෙඳ ප්‍රතිපත්තිය ගැන මා කථා කරනවා නොවෙයි. මා පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ වර්තමාන ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තියෙහි එක්තරා ප්‍රමාණයක වෙනසක් ඇති වීම හේතුකොට ගෙන 1965න් පසු මේ ආණ්ඩුවේ වෙළෙඳ ප්‍රතිපත්තියටත් බලපෑම් ඇතිවේගන ගොස් කාලයක සිට දියුණුවේගන ආ වෙළෙඳ කටයුතු සෑහෙන ප්‍රමාණයකට අඩු වී තිබෙන බවයි.

තේ සම්බන්ධව කල්පනා කර බලමු. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) වෙළෙඳ ඇමතිවරයා හැටියට ගෙන ගිය ප්‍රතිපත්තිය උඩ අපට සෑහෙන දියුණුවක් ඇති වූ බව අප දන්නා කාරණයක්. මේ කාරණය ස්ථාපිත කිරීම සඳහා මේ අවස්ථාවේදී ඉලක්කම් ඔක්කොම පෙන්වන්නට යන්නේ නැහැ. වෙළෙඳ අංශයේ වැය ශීර්ෂය ආවාම පෙන්වන්නට පුළුවනි.

පසුගිය අවුරුදු දෙකහමාර ඇතුළත තවත් වෙනස්වීමක් ඇති වී තිබෙනවා. එක පැත්තකටම බර වෙලා යන්නැයි මා එක මොහොතකටවත් කියන්නේ නැහැ. ඒ කොයි හැටි වෙනත් මා කියන්නේ, මීට වඩා පැහැදිලි ක්‍රියා මාර්ගයක් මේ ආණ්ඩුව විසින් ගෙන යා යුතු බවයි. අපේ අනෙකුත් ආර්ථික සම්බන්ධතාවනුත් දියුණු කිරීම පිණිස, ආර්ථික අතින් ඕග්‍ර ලෙස දියුණු වන ලෝකයේ ඇතැම් රටවල් සමග —විශේෂයෙන්ම නැගෙනහිර යුරෝපය සමග— වැඩි වැඩියෙන් සම්බන්ධකම් ඇති කර ගත යුතුයි. එය කරන්නට පුළුවන් වන්නේ සෑම කෙනකු සමගම මිත්‍ර සම්බන්ධතාවන් ඇති කර ගන්නවාය කියන කියමනෙන් පමණක් නොව, ඒ කියමනත් සමග එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙනුයි. එහෙත් එවැනි ප්‍රතිපත්තියක් ගෙන යන ලකුණු අපට පෙනෙන්නට නැහැ.

මේ ඇස්තමේන්තු පරීක්ෂා කර බලන විට අපට පෙනී යන දෙයක් නම් තායිලන්තය මෙන්ම පිලිපයින් දූපත්ද වෙනුවෙන් අලුත් තානාපති කාර්යාල දෙකක් ඇති කරන්නට යන බවයි. තායිලන්තයේ ලංකා තානාපති කාර්යාලයක් සහ පිලිපයින්වල ලංකා කාලීන නියෝජ්‍ය තානාපති කාර්යාලයකුත් ආරම්භ කරන බවට කිසිම සැකයක් නැහැ. මෙවැනි කාර්යාල ආරම්භ කිරීම ඉතාමත් අවශ්‍යයි. හාල් ප්‍රශ්නය සම්බන්ධයෙන් හා වෙනත් කාරණා උඩ තායිලන්තයේ තානාපති සබඳකම් ඇති කර ගැනීම අප පිළිගත්තා. එහෙත් මා මුලින් පෙන්වා දුන් පරිදි අපේ හිතේ ඇති සැකය තව දුරටත් තහවුරු වන කාරණයක් හැටියටයි මට මේ කාරණය පෙනෙන්නේ. ලෝකයේ තවත් රටවල් තිබෙනවා. ජර්මන් රාජ්‍ය දෙකක් තිබෙන බව අද මුළු ලෝකයම පිළිගෙන ඉවරයි. නීතියෙන් පිළිගත්තත් නැතත් අද තත්වය ඒකයි. ඒ වගේම ඒ රාජ්‍ය දෙක සම්භම පසුගිය කාලයේදී වෙළෙඳාම් අතින් කිට්ටු සම්බන්ධතාවක් ඇති වී තිබෙනවා. අගමැතිතුමා නියෝජනය කරන කොට්ඨාශයේ ඉතාමත් ලොකු සංවර්ධන වැඩක් නැගෙනහිර ජර්මනිය භාරගෙන තිබෙනවා යයි මා හිතනවා. එතකොට ඒ රජය මේ රටේ "කොන්සුලේට්-ජනරල්" කන්තෝරුවක් පිහිටුවා තිබෙනවා. මෑතකදී අපේ ආණ්ඩුව බටහිර බර්ලිනයේ කොන්සල් කෙනකුගේ කන්තෝරුවක් විවෘත කළා. එසේ නම් තානාපති තත්වය කෙසේ වෙතත් නැගෙනහිර ජර්මනිය සමඟ අපේ වෙළෙඳ සම්බන්ධතා ඇති කර ගැනීමට සතුටු නම්, ආර්ථික සම්බන්ධතා ඇති කර ගැනීමට සතුටු නම්, ඒ වගේම ඒ අයගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

කන්තෝරුවක් මෙහි පිහිටුවා ගැනීමට අප ඉඩකඩ සලසා තිබෙනවා නම් ඒ රටත් මේ රටත් අතර සම්බන්ධතා දියුණු වන ආකාරය දෙස බලන විට ඒ සම්බන්ධතාව තව තවත් දියුණු වන පරිද්දෙන් තානාපති තේ මෙන් එහිත් අපේ කාර්යාලයක් විවෘත කිරීම ගැන කල්පනා කර බලන්නට බැරිද? බොරු ඔපේ සඳහා කාර්යාල විවෘත කරන්නැයි මා කියන්නේ නැහැ. යම් සේවයක් කරන්නට ඉඩකඩ තිබෙන නිසා බර්ලිනය වගේ තැනක කන්තෝරුවක් විවෘත කිරීම අවශ්‍යයි. බටහිර බර්ලිනය පවා අද චෙකෝස්ලෝවේකියාව රුමේනියාව වැනි රටවල් සමඟ සම්බන්ධකම් ඇති කර ගන්නට තැත් කරන වේලාවේදී—මෙපමණ කලක් නැතිව තිබුණු සම්බන්ධකම් ඇති කර ගන්නට තැත් කරන වේලාවේදී—අපේ මොන මොන දේශපාලන මත භේද තිබුණත් මොන මොන වෙනස්කම් තිබුණත් සමාජ ක්‍රමය උඩ ඇති ඒ මත භේද හා වෙනස්කම් පැත්තකින් තබා අපේ වාසිය, අපේ ප්‍රයෝජනය සලකාවත් ඒ රටෙහි අපේ කාර්යාලයක් පිහිටු වීම ගැන කල්පනා කර බලන්නට ඕනෑ.

මම තවත් කාරණයක් කියන්නම්. විදේශීය සේවයෙහි නියුක්තව සිටින පළපුරුද්දක් ඇති බොහෝ දෙනකු මා ඉදිරිපත් කරන මෙම අදහස අනුමත කරනවා ඇතැයි මා හිතනවා. අද සෝවියට් දේශයේ තිබෙන අපේ තානාපති කාර්යාලයට පෝලන්තය, චෙකෝස්ලෝවේකියාව—රුමේනියාවයි, බල්ගේරියාවයි සමඟ නම් තවම සම්බන්ධකම් නැහැ—වැනි රටවල් සමඟ කෙරෙන සියලුම කටයුතු කරන්නට සිදු වී තිබෙනවා. එය බොහොම අමාරු වැඩක්. ශීඝ්‍රයෙන් දියුණු වන රටවල අපේ කාර්යාල සඳහා ඉඩකඩ සලසා ගන්නවා නම් හොඳයි. අපේ තානාපති කාර්යාලවලින් වෙළෙඳ කටයුතු සම්බන්ධ වැඩ කෙරෙනවා මදි යයි බොහෝ වෙළෙඳුන් හා ව්‍යාපාරිකයන් කියනවා මා අසා තිබෙනවා. මා කල්පනා කරන හැටියට නම් ඒ රටවල් සමඟ තව තවත් කිට්ටු සම්බන්ධතාවක් ඇති කර ගැනීම අවශ්‍යයි. එසේ හෙයින් තානාපති තේ පිළිපසින් දූපත්වල අපේ කාර්යාල ඇති කළා වගේ එවැනි රටවල තව කාර්යාල කීපයක් ඇති කරන්නට කල්පනා කරන ලෙස මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා තවත් කාරණයක් මතක් කරන්නට කැමතියි. වෙන රටක් අපේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි නොගැසීම ගැන අප වගබලා ගන්නට ඕනෑ. අපේ රටේ ආරක්ෂාව සලසා ගැනීමේ වගකීම ඇත්තේ අපටයි. එහෙත් එයම මතු කර ගෙන එක රටකට එක විධියකටත් තව රටකට තව විධියකටත් සැලකීම සාධාරණ නැහැ. අපේ සුරක්ෂිතභාවය ඇති කර ගන්නට අප සංවිධාන යොදා ගන්නට ඕනෑ බව ඇත්තයි. එහෙත් අපේ සුරක්ෂිතභාවය රැක ගැනීමට යයි කියමින් අපේ රටේ නිදහසටත් අපේ ආත්ම ගෞරවයටත් හානි වන, කැළැල් වන ආකාරයට ආණ්ඩුවේ ආයතනයකින් ක්‍රියා කෙරෙනවා නම් එය ඉතාමත්ම බරපතල ප්‍රශ්නයක්. අපේ රටට නිදහස ලැබුණාට පසුව අපේ රටේ විදේශීය කටයුතු සම්බන්ධයෙන් කාර්යාල බිහි කිරීමට අපට ආධාර දුන්නේ බ්‍රිතාන්‍ය සංවිධායකයන් බව අප දන්නවා. ඒ කාලයේ අපට තානාපති සේවයක් තිබුණේ නැහැ. නිදහස ලැබූ අලුත් පිට අප එක පුරුද්දක් ඇති කර ගත්තා. යම්කිසි සමාජවාදී රටක පුරවැසියකු මෙරටට පැමිණෙනු පිණිස වීසා බල පත්‍රයක් ඉල්ලා සිටි විට ඒ රටේ තිබෙන බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයෙන් එම තැනැත්තා ගැන විමසා බැලීම ඒ කලයේ පැවති සිරිතයි. බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයට ඔහු ගැන යමක් කියන්නට නොහැකි නම් එම කාර්යාලය මගින් ලන්ඩන් නුවර පිහිටි සවදේශ කටයුතු භාර කාර්යාලයට දන්වා යවා ඔහු පිළිබඳව තිබෙන වාර්තා මොනවදැයි එහෙන් ඇසුවා. එසේ කරුණු දැනගෙන මෙම ආණ්ඩුව කියා එව්වායින් පසුවයි. බලපත්‍ර ය දීම හෝ නොදීම කළේ. ඒ කාලයේ එවනි රටකින් පැමිණෙන අයකුට වීසා බලපත්‍රයක් ලබා ගැනීම එතරම් අමාරු තත්ත්වයකටයි පත්ව තිබුණේ.

මගේ මතකයේ හැටියට 1956දී දිවංගත බණ්ඩාරනායක මැතිතුමා මේ රටේ අගමැති කම භාර ගත්තායින් පසු ඒ ක්‍රමය වෙනස් වුණා. ඒ ඒ රටවල් සමඟ අපේ තානාපති සම්බන්ධතාවන් ඇති වූවාට පසු ඒ ඒ රටවල පිහිටි තානාපති කාර්යාලවලට ලැබෙන වීසා බලපත්‍ර ඉල්ලුම්පත් මේ රටේ විදේශ කටයුතු භාර කාර්යාලයට එව්වා, අනුමත කර යැවීම පිණිස. අපේ රට ඒ ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටවල් සමග ඇති කරගෙන සිටින නොයෙකුත් වෙළඳ සම්බන්ධතාවන් සහ ආර්ථික සම්බන්ධතාවන් වැඩි වන්නට වැඩි වන්නට එසේ කිරීමත් ප්‍රමාද සහිත බව අපට පෙනී ගියා. මේ රටේ කාර්යාල යකට එවා එමගින් අනුමැතිය ලබා ගෙන වීසා බලපත්‍රයක් නිකුත් කිරීමට ඇතැම් විට මාසය දෙක ගත වුණා. වීසා බලපත්‍ර නිකුත් කිරීමේදී සිදු වන මෙවැනි ප්‍රමාදයන් නිසා වෙළඳ කටයුතුවලට සහ ආර්ථික සම්බන්ධතාවන්ට පහර වදින බව පෙනී ගියා. වානේ කම්හලේ වැඩ කටයුතු යනාදිය සඳහා මෙහි පැමිණි යම් යම් විශේෂඥයන්ට සහ නිලධාරීන්ට ඒ නිසා කරදර වනබව පෙනී ගියා. එසේ හෙයින් එම ආණ්ඩුවලත් තානාපති කාර්යාලවලත් ඉල්ලීම උඩ එම රටවල පිහිටි තානාපති කාර්යාලවලට බලතල දෙන්නට යෙදුණ, ඔවුන් පැමිණෙන කටයුත්තේ ස්වභාව ගැන කල්පනා කර බලා වීසා බලපත්‍ර නිකුත් කිරීම පිණිස.

මෙම ආණ්ඩුව පැමිණියායින් පසු ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කර තිබෙන බව පෙනෙනවා. මීට ප්‍රථමයෙනුත් මා විසින් මෙම ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙනවා. අද සෝවියට් දේශයෙන් හෝ වෙනත් සමාජවාදී රටකින් යමෙක් වීසා බලපත්‍රයක් ඉල්ලා සිටි විට පළමුවෙන්ම කළ යුත්තේ කිව්වුව තිබෙන බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය මගින් ඔහු ගැන සෝදිසි කර බැලීමයි. ඔහුගේ තරාතිරම පිළිබඳව සෝදිසි කර බලන්නේ ඒ අන්දමටයි. ඔහු පිළිබඳ තොරතුරු එහි නැතිනම් ලන්ඩන් නගරයට දන්වා යවා සොයා බලන්නට ඕනෑ. එදා අතහැර දැමූ වැඩ පිළිවෙළ මෙම ආණ්ඩුව විසින් නැවත වරක් ක්‍රියාත්මක කරගෙන යන බව ගරු අගමැතිතුමා දන්නවාද නැද්දැයි මා අහනවා.

අපේ රටට එන අයගෙන් අපට හානියක් සිදු වෙනවාද නැද්ද යන්න අපම සොයා බලා දැනගන්නට ඕනෑය කියන එක ඇත්තයි. එහෙත් ආත්ම ගෞරවයක් තිබෙන නිදහස් රටක් වශයෙන් අපේ රට ගැන සිතා බලන විට, වෙනත් රටකින් විමසා බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන එක හරිදැයි මා අහනවා. විශේෂ යෙන්ම වෙළඳාම අතින් සහ ආර්ථික අතින් අප රට සමග කිට්ටු සම්බන්ධතාවක් ඇති වෙනත් රටවල පුරවැසියන් මෙරටට එන්නට ඕනෑය කියන අවස්ථාවලදී එසේ ක්‍රියා කිරීමෙන් අපේ ආත්ම ගෞරවයටත්, මිත්‍ර සම්බන්ධතාවයටත්, වෙන වෙනත් ප්‍රයෝජනවලටත් හානියක් සිදු වෙනවා නොවේද?

අ. භා. 7.30

මගේ කතාව මීට වඩා දීර්ඝ කරන්නට මා කල්පනා කරන්නේ නැහැ. අවසාන වශයෙන් තව එක කාරණයක් මතක් කරන්නට තිබෙනවා. මාද කාලයක් තිස්සේ විදේශ සේවාවෙහි සිටි කෙනෙක්. එම සේවයෙහි යෙදුණු සථිර නිලධාරීන් අතර ඉතා දක්ෂ උදවිය සිටිනවා. අවුරුදු 14, 15 සේවය කළ උදවිය ඒ අය අතර සිටිනවා. තානාපති පදවිවලට පත් කර යවන විට පිටතින් උදවිය තෝරා පත් කළ යුතුය කියන විශ්වාසය තවමත් අප තුළ පවතිනවා. සමහර රටවලට තානාපති ධූර සඳහා යම් යම් අය පත් කර යවන විට දේශපාලන හේතූන් නිසා පිටින් අය තෝරා පත් කිරීම සභාවක්. මා සිතනවා, එය කුමන රටක වූවත් කරන වැඩකැයි කියා. අවුරුදු 15 ක් 16 ක් පැරණි විදේශ තානාපති සේවයක් දැන් අපට තිබෙන බව සිතන්නට ඕනෑ. මේ රටේ ප්‍රශ්න පිළිබඳව හොඳින් වැටහෙන, විදේශ සම්බන්ධතාවන් ගැන නිසි වැටහීමක් ඇති, හොඳ පළපුරුද්දක් තිබෙන ජාති හිතෛෂී නිලධාරීන් ඔවුන් අතර සිටිනවා. ඒ නිසා තානාපති සේවාවේ සිටින ඒ අයටත් උසස් තත්ත්වයන්ට පැමිණීමට ඉඩකඩ සැලසීමට දැන් කාලය පැමිණ තිබෙනවාය කියා ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்க)
(Dr. S. A. Wickremasinghe)

ගරු සභාපතිතුමනි, මේ රජයේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධව කටුගම්පොළ ගරු මන්ත්‍රීතුමා (සුබසිංහ මයා.) විසින් කරුණු ප්‍රකාශ කරන්නට යෙදුණා. වියට්නාමය සම්බන්ධවත් මැද පෙරදිග ඇති වී තිබෙන තත්ත්වය සම්බන්ධවත් අද ලෝකයේ ඇති වී තිබෙන අධිරාජ්‍ය විරෝධී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

නිදහස් සටන් ව්‍යාපාරය සම්බන්ධවත් මේ රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය ගැන පොදුවේ කල්පනා කරන විට පෙනී යන්නේ මෙයයි: මෑතදී නිදහස ලැබූ රට වල් ආර්ථික වශයෙන් හා දේශපාලන වශ යෙන් සම්පූර්ණයෙන්ම නිදහස ලබා ගැනීම සඳහා කරන සටන්වලදී මේ රජය ඒ රටවලට සහයෝගය දක්වනවා වෙනු වට අධිරාජ්‍යවාදීන්ගේ පැත්තට බර වී ඔවුන් සතුටු කරන්නට තමන්ගේ නියම යුතුකම ඉටු නොකිරීමේ ප්‍රතිපත්තියක් මේ රජය අනුගමනය කරන බව කණගාටු වෙන් මතක් කරන්නට ඕනෑ. වියට්නාමය සම්බන්ධව කටුගම්පොල මන්ත්‍රීතුමා පැහැ දිලිව කරුණු ප්‍රකාශ කළ නමුත් එතුමාට එක කරුණක් අමතක වුණා. ඒ මෙයයි: වියට්නාමය අද ගෙන යන සටනේදී උතුරු වියට්නාම් ආණ්ඩුවත් දකුණු වියට්නාමයේ වියට්කොං නමින් සිටින, ඒ රට 5 ට බෙදා හතරෙන් කොටසක් පාලනය කරන ජාතික විමුක්ති ආණ්ඩුවත් ප්‍රකාශ කර තිබෙනවා 1954 ජිනීවා ගිවිසුම ක්‍රියාවේ යෙදීමට ඒ ආණ්ඩු දෙකම කැමති වී සිටි නවාය කියා. එම ජිනීවා ගිවිසුම අන්තර් ජාතික ගිවිසුමක්. ඒ අන්දමට සාමයක් ඇතිකර ගැනීමට ඒ ආණ්ඩු දෙක කැමැත්ත දක්වා තිබෙනවා. එම ජිනීවා ගිවිසුමට පටහැණිව අද අමෙරි කන් ආණ්ඩුව ගෙන යන කඩාකප් පල්කාරී වැඩ පිළිවෙළ 1954 සිට අද වනතුරුමත් ගෙන යනවා. ඒ නිසා එයට විරුද්ධව ප්‍රකාශයක් කිරීම සිලාචාර වගකිවයුතු ආසියාවේ ආණ්ඩුවක් හැටි යටත් බෞද්ධ ප්‍රතිපත්ති අනුගමනය කරන රටක් හැටියටත් මේ රජයේ යුතු කමක්. කොන්දේසි නැතිව අවංකව එඩි තරව ඒ සම්බන්ධව ප්‍රකාශයක් කිරීම මේ රජයේ යුතුකමක්. සම්පූර්ණයෙන්ම අධි රාජ්‍ය විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කරන උතුරු වියට්නාම් ආණ්ඩුවත් දකුණු වියට්නාමයේ වියට්කොං නමින් ඇති ජාතික විමුක්ති ආණ්ඩුවත් යුක්තිසහ ගතයි කියා ප්‍රකාශ කිරීමට මේ ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා. එය ඉටු නොකිරීම නිදහස් ජාතීන්ටත් නිදහස වෙනුවෙන් සටන් කරන අයටත් විශේෂයෙන්ම යටත් විජිතවල අයටත් කරන විශාල ද්‍රෝහීකමක්ය කියා මා ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමනි, මැද පෙරදිග සටන සම්බන්ධව මා එක කරුණක් ප්‍රකාශ කරන්න ඕනෑ. හේතු හෝ කරුණු රහිතව ඊශ්‍රායලය විශාල වශයෙන් ආධාර දෙන රටක් හැටියට ආණ්ඩුවේ නිවේදනවලින් ප්‍රකාශ වී තිබෙනවා. ලංකාවේ භූජල සම්පත් සම්බන්ධව විශාල සේවයක් ඊශ්‍රායල යෙන් සිදු වනවාය ආදි වශයෙන් ප්‍රචාරය වී තිබෙනවා. වාරිමාර්ග කටයුතු ඇමති තුමාගේ ශිෂ්‍යත්ව ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී ඒ පිළිබඳව පැහැදිලි වශයෙන් කථා කිරීමට පුළුවන්. එහෙත් මේ අවස්ථා වේදී සාමාන්‍ය වශයෙන් එක් කාරණයක් මතක් කළ යුතුව තිබෙනවා. එවැනි ප්‍රකාශ සහ ප්‍රචාර කරන නමුත්, භූජල සම්පත් ලංකාවට විද්‍යාත්මකව ලබා ගැනීමට කිසිදු වැඩ පිළිවෙළක් නැතිව තිබියදී මේ අන් දමේ ප්‍රචාර ඇති කර තිබෙන්නේ සම් පූර්ණයෙන්ම ඊශ්‍රායලයත් ලංකාවත් අතර සම්බන්ධකම් පෙන්වා මැදපෙරදිග අරාබි රටවලුත් ලංකාවත් අතර විරුද්ධත්වයක් ඇති කිරීමේ වැඩපිළිවෙළකට හේතුදායක වන කරුණක් වශයෙන් බව මා මතක් කරන්න කැමතියි.

මෙහිදී මා ඒ කාරණය ගැන විශෙෂ වශ යෙන් සඳහන් කරන්නේ ඇයි? ලංකාවට විද්‍යාත්මකව භූජල සම්පත් ලබාගැනීම සඳහා පයෝජිෂණ පැවැත්වීම පිණිස, යන්ත්‍ර සූත්‍ර යොදවා ඒ කටයුතුකිරීම පිණිස, සෝවියට් ආණ්ඩුව මගින් යෝජනා කර තිබුණා. එහෙත් ලංකාණ්ඩුව ඒ ගැන සම්පූර්ණයෙන්ම අමතක කර දමා ඊශ්‍රායලය මේ කටයුතු කරනවාය කියා විශාල වශයෙන් ප්‍රචාරය කරන නමුත්, එවැනි ආධාරයක් ලැබුණ ලකුණක්වත් කොහෙත්ම පෙනෙන්න නැහැ. දේශ පාලන වශයෙන් අධිරාජ්‍ය ආණ්ඩු සතුටු කිරීමේ බලාපොරොත්තුවෙන් මෙය දේශ පාලන ප්‍රචාරයකට යොදවාගැනීම නිසා, ලංකාවේ ජනතාවට විශාල හානියක් සිදු වන පරිදි, අරාබි රටවල් සමග ඇති වෙළ හෙළදාම් බොහෝ සෙයින්ම අඩු වී යාමට මේ කාරණය හේතු වන බවත් මා සඳහන් කරන්න කැමතියි. ඒ අනුව අපට භූජල සම්පත් නොලැබෙන අන්දමේ වැඩපිළි වෙළක් මේ ආණ්ඩුව මගින් සිදු වෙනවා.

අපේ ආර්ථික කටයුතු සම්බන්ධව වැඩ කටයුතු කරන Economic Council නමැති මණ්ඩලයේ සෝවියට් ආණ්ඩුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනුවෙන් පෙනී සිටින නියෝජිත මහතෙකු සෝවියට් තානාපති කාර්යාලයේ සිටිනවා. ඇබිසීනියාවේ ජල සම්පත් ගැන සම්පූර්ණ වගකීමම ගෙන ඒ කටයුතු සංවිධානය කරන ලද්දේ පළපුරුදු විශෙෂඥයකු වන, අද අපේ වානේ කර්මාන්ත ශාලාව භාරව සෝවියට් ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින ඒ ප්‍රධාන නිලධාරී මහතායි. පළපුරුද්දක් ඇති, විශාල වගකීමකින් යුක්තව කටයුතු කළ, ලෝකයේ භූජල සම්පත් ගැන නම පැතිර තිබෙන—ඇබිසීනියන් ළිං නමින් පොළව යටින් ජල සම්පත් ලබාගන්නා වැඩපිළිවෙළ උඩ නම පවා පැතිර තිබෙන —එවැනි උදවියගේ උපදෙස් අවවාද ඇතිව ලංකාවෙහි ඒ ව්‍යාපාරය ඇරඹීමට යෝජනා කර තිබියදීත්, ඒ ගැන සම්පූර්ණයෙන්ම අමතක කර, කිසිම ප්‍රකාශයක් ප්‍රචාරයක් නැතිව කටයුතු කරගෙන යාම ගැන මා පසුව වාරිමාර්ග පිළිබඳ ශීර්ෂයේදී සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. මේ කාරණය මා විශෙෂයෙන් මතක් කෙළේ මේ ආණ්ඩුව මේ විධියේ ප්‍රයත්නයක් දරන්නේ අධිරාජ්‍යවාදී රටවල් සමග පමණක් සම්බන්ධකම් ඇති කරගෙන සමාජවාදී රටවල් සමග අහිතවත් කමින් සිටීමට බව මෙයින් හොඳ හැටි පෙනී යන නිසයි.

ලංකාවට ආර්ථික වශයෙන් විශාල ප්‍රයෝජන සැලසෙන විශාල කර්මාන්ත කීපයක් පසු ගිය කාලයේ පළමුවරට විවෘත කරන්නට යෙදුණා. ඒ කර්මාන්තවලින් එකක් වන වානේ කර්මාන්තය විවෘත කරන අවස්ථාවේදී අපේ අගමැතිතුමාට ඒ වැදගත් උත්සවයට සහභාගි වීමට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ වාගේම, ටයර් කර්මාන්ත ශාලාව විවෘත කිරීමේ උත්සවයට සහභාගි වන්නටත් අගමැතිතුමාට අවස්ථාවක් නොතිබුණු බවට කරුණු දැනගන්නට ලැබුණා. එහෙත් සමාජවාදී රටවල සම්බන්ධයක් ඇතිව පළමු වරට මේ තරම් විශාල කර්මාන්ත ශාලාවක් විවෘත කරන අවස්ථාවකදී, අන් කිසි ඇමතිවරයකුත් ඒ වැදගත් උත්සවයට සහභාගි වී ඒ කටයුත්ත ගැන සතුටු ප්‍රකාශ කිරීමට නැත්නම් කෘතෝපකාරය දැක්වීමට වුව මනාවක් නොදැක්වීමෙන් අපට පැහැදිලි වශයෙන් පෙනෙනවා; අපට ආධාර කරන සමාජවාදී රටවලට සහයෝගය දක්වන බව පෙන්නීමට මේ ආණ්ඩුව තුළ විශාල භීතියක් තිබෙන බව.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
නෑ, එහෙම එකක් නෑ.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
ලෝහ කර්මාන්ත ශාලාව විවෘත කිරීමේ උත්සවයට නම් අගමැතිතුමා සහභාගි වුණා. එහෙත් එතුමා එම උත්සවයට සහභාගි වීමේ කොන්දේසියක් වන්නට ඇති. එම කර්මාන්ත ශාලාව තැනීමට සම්පූර්ණ ආධාරය දුන් පෝලන්ත ආණ්ඩුව වෙනුවෙන් එරට තානාපතිවරයාට හෝ වෙනත් නියෝජිතයකුට හෝ ඒ අවස්ථාවේ වාර්තාවක් ඉදිරිපත් කරන්නට ඉඩ නොදීම. ගරු කර්මාන්ත ඇමතිතුමා ඒ උත්සවයේ ප්‍රධාන තැන ගෙන කටයුතු කළේ, එම කර්මාන්ත ශාලාව සෑදීම පෝලන්ත ආණ්ඩුවේ වැඩක් නොව රම්පාල මහත්මයාගේ වැඩක් හැටියට පිළිගෙනයි. එම කර්මාන්ත ශාලාව විවෘත කිරීමේ උත්සවය යක්කල පැවැත්වූයේ, පෝලන්ත ආණ්ඩුවට අපහාස වන අන්දමටයි. මේ ආණ්ඩුව අධිරාජ්‍යවාදීන්ගේ —විශේෂයෙන් අමෙරිකන්, බ්‍රිතාන්‍ය හා බටහිර ජර්මන් ආණ්ඩුවල—වහලකු වශයෙන්, ඔවුන්ට ලොකු භය පක්ෂකමක් දක්වමින්, සමාජවාදී රටවලින් දෙන ආධාර පවා පිළිගැනීමට බියක් හා සැකයක් පෙන්වමින්, ඒ අධිරාජ්‍යවාදීන් සතුටු කිරීමේ ප්‍රතිගාමී ප්‍රතිපත්තියක් ගෙන යන බව අපට එයින් හිතා ගන්නට පුළුවන්.

ඒ වාගේම අද මහා ලොකුවට පුරසාරම් දොඩනවා——

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)
චීනය ගැන?

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)
චීනය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා උත්තර දෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

අප උත්තර දෙනවා. තමුන්නාන්සේත් චීනය ගැන කියන්න.

අ. භා. 7.45

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ
(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)
(Dr. S. A. Wickremasinghe)

ආසියාවේ තිබෙන ලොකුම පේසකර්ම මධ්‍යස්ථානය ලංකාවේ පිහිටුවන්නට යන වායෙයි ආණ්ඩු පක්ෂයේ උදවිය නිතරම පුරසාරම් දොඩනවා. එහෙත් එම පේසකර්ම මධ්‍යස්ථානය පිහිටුවීමට සම්පූර්ණයෙන්ම ආධාර කරන, ඊට වුවමනා යන්ත්‍ර-සූත්‍ර ආදිය ඉතා පහසු කොන්දේසි උඩ ලබා දෙන, ඒ පිළිබඳ හොඳ සැලැස්මක් ඇතිව කටයුතු කරන නැගෙනහිර ජර්මනියට මේ ආණ්ඩුව දක්වන්නේ කෙබඳු සැලකිල්ලක්ද? සභා පතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වූ අවදියේදීම නැගෙනහිර ජර්මනියට මොන තරම් නින්දිත විධියට සැලකුවාදැයි තමුන්නාන්සේ දන්නවා ඇති. ලංකාවේ පේසකර්ම මධ්‍යස්ථානය ඇති කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට සිටි, ආසියාවේ විශාල තම පේසකර්ම මධ්‍යස්ථානය පිහිටුවීමට ආධාර දුන්, ඒ පෝලන්ත ආණ්ඩුවේ "කොන්සියුලේට්" නැත්නම් උප තානාපති කාර්යාලයේ හිටපු නිලධාරීන්ගෙන් තුන් දෙනකු හැරෙන්නට අනෙක් අය සතියක් තුළ මේ රටින් පිට විය යුතුයැයි ලංකාණ්ඩුව නියෝග කළා. බටහිර ජර්මන් ආණ්ඩුව සතුටු කිරීමේ අදහසින්, ඉතාමත් අයුක්ති සහගත අන්දමට, ඔවුන්ගේ ආත්ම ගරුත්වය කෙලෙසෙන විධියට මේ ආණ්ඩුව ක්‍රියා කර තිබීම ගැන අප කණගාටු වෙනවා.

අද අපේ විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙනුත් අපේ රටේ ආර්ථික තත්ත්වය සම්බන්ධයෙනුත් පිට රටවලට විකුණා මුදල් ලබා ගත හැකි අපේ මූලික ද්‍රව්‍ය සම්බන්ධයෙනුත් මේ තරම් භයානක තත්ත්වයකට මුහුණ පාන්නට අපට සිදු වීමේ ප්‍රධාන වරදකාරයා, සමාජවාදී රටවලට පිටුපා ඒවායින් ඈත්වී ඒවා කෙරෙහි කිසිම විශ්වාසයක් තබන්නේ නැතිව ලෝකයේ අධිරාජ්‍යවාදී බලවත් රටවල් සමග පමණක් සම්බන්ධකම් ඇති කරගෙන ඒවා ගැන සම්පූර්ණයෙන්ම විශ්වාසය තබා ගෙන කටයුතු කිරීමේ ප්‍රතිපත්තියක් ගෙන යන මේ ආණ්ඩුව බව මා මතක් කරන්නට කැමතියි.

"කොමෝඩිටි ඒඩ්" හෙවත් වෙළඳ භාණ්ඩ ආධාර ක්‍රමය යටතේ එංගලන්තය, අමෙරිකාව, කැනඩාව, ජපානය, බටහිර ජර්මනිය ආදී අධිරාජ්‍යවාදී රටවලින් අපට අවශ්‍ය ද්‍රව්‍ය හා ආධාර අඩු පොලියට හෝ පොලියක් නැතිව හෝ ලබා ගන්නට පුළුවන්යයි දැන් මේ ආණ්ඩුව විශාල වශයෙන් ප්‍රචාරයක් ගෙන යනවා. එහෙත්, වෙළෙඳ භාණ්ඩ ආධාර ක්‍රමය යටතේ ඒ අධිරාජ්‍යවාදී රටවල් විසින් නොදියුණු රටවලට දෙන භාණ්ඩ සඳහා ලෝක වෙළෙඳ පොළේ පවතින මිලට වඩා සියයට 30 ක 40 ක පමණ වැඩි මිලක් අය කරන බව මෙතෙක් ලෝකයේ නොදියුණු රටවලට දී තිබෙන ඒ ආධාරවලින් පැහැදිලි වශයෙන්ම අපට පෙනී ගොස් තිබෙනවා. ඒ අනුව අපේ රටට දී තිබෙන භාණ්ඩවල මිල ලෝක වෙළෙඳ පොළේ මිල සමග සසඳා බලන විට, ඒවා සඳහා අප ගෙවන පොලිය සියයට 20 ක් 25ක් පමණ වන බවත් ඒ අසාධාරණ අධික පොලිය නිසා අපේ රට ඒ අධිරාජ්‍යවාදී රටවලට ආර්ථික වශයෙන් වාල් වී තිබෙන බවත් මා මතක් කරන්නට කැමතියි. මෙය ලංකාවට පමණක් නොව පකිස්තානය, ඉන්දියාව, අප්‍රිකානු රටවල් ඇතුළු නොදියුණු රටවල් ගණනාවකටම මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්නයක් බව පසුගිය කාලය තුළ ඒ අධිරාජ්‍ය රටවලින් එකී නොදියුණු රටවලට දී තිබෙන භාණ්ඩ ආධාර ක්‍රමය පිළිබඳ වාර්තාවලින් පැහැදිලි වශයෙන් අවබෝධ වී තිබෙනවා. මේ අනුව අපේ රට ආර්ථික වශයෙනුත් දේශපාලන වශයෙනුත් අධිරාජ්‍යවාදී රටවලට වාල් වන අන්දමටත් අධිරාජ්‍යවාදී ක්‍රමය තව තවත් මෙහි තහවුරු වන අන්දමටත් මේ ආණ්ඩුව කටයුතු කරන බව මා මතක් කරන්නේ කණගාටුවෙන්.

ටිබෙට් රට ගැන චීනය ගැන කථා නොකරන්නේ මන්දැයි ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අහනවා. ඒවා අද බල පාන ප්‍රශ්න නොවෙයි. [බාධා කිරීම්] අද අපට බල පාන ප්‍රශ්නය වී තිබෙන්නේ අධිරාජ්‍යවාදී රටවල් ආර්ථික වශයෙනුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේශපාලන වශයෙනුත් අපේ රට වාල් කර ගන්නට උත්සාහ කිරීම නිසා ඒ ගැන පමණයි මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ.

ගරු සභාපතිතුමනි, මේ රටේ ආර්ථික තත්ත්වය ඉතා භයානක අඩියකට වැටී තිබෙන්නේ අපේ රටෙන් ඒ රටවලට යවන භාණ්ඩවලට ඉතාමත්ම අඩු මිලක් ගෙවන්නටත්, ඒ රටවලින් අප ලබා ගන්න බඩුවල ලෝක වෙළඳපොළේ මිළට වඩා සියයට 30 ක 40 ක තරම වැඩි මිළක් ලබා ගන්නටත් වැඩ පිළිවෙලක් යොදවා තිබෙන නිසයි. පසුගිය අවුරුදු 100 ක පමණ කාලය තුළ නොයෙක් රටවල පළකර තිබෙන සංඛ්‍යා ලේඛනවලින් මේ බව පැහැදිලිව ඔප්පු වී තිබෙනවා. අදත් මේ අසමාන ගනු දෙනු නිසා අපට ජාතික වස්තුවෙන් සියයට 30 ක පමණ අලාභයක් සිදු වන බව සත්‍යයක්. ආර්ථික වශයෙන් ලංකාවට පමණක් නොව සෑම නොදියුණු රටකටම මේ ප්‍රශ්නයට මුහුණපාන්ට සිදු වී තිබෙන බව විශේෂඥයින්ගේ පර්යේෂණවලින් පෙනී යනවා. අපේ රටවල් යටත් විජිත හැටියට පැවති කාලයේ මේ සූරාකෑම කෙළින්ම කරගෙන ගියා. අදත් ඔය විධියේ අසමාන වෙළඳ ගනු දෙනු මගින් ඒ සූරාකෑම කරගෙන යනවා. අපේ ද්‍රව්‍ය වලට මිළ නියම කිරීමට විශාල අධිරාජ්‍ය වාදී ආණ්ඩුවලට අද පුළුවන්කම තිබෙන නිසා අප මේ තත්ත්වයට පත් වී තිබෙන බව පැහැදිලියි. ඒ සම්බන්ධයෙන් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්ට මා බලාපොරොත්තු නොවෙන්නෙ, මේ කරුණු සත්‍ය බව අද ලෝකය පිළිගෙන තිබෙන නිසයි. එම නිසා භාණ්ඩ හුවමාරු ප්‍රතිපත්තිය උඩ සමාජවාදී රටවල් සමග ගනු දෙනු කිරීමේ වැඩ පිළිවෙල ඉදිරියට ගෙන යාමෙන් අපට මීට වඩා ප්‍රයෝජනයක් ලබා ගන්ට පුළුවන් බව මතක් කරන්ට කැමතියි. එසේ කිරීමෙන් අපේ ආර්ථික තත්ත්වය දියුණුවන අතර විදේශ විනිමය ප්‍රශ්නයත් විසඳෙනවා පමණක් නොව අපට අවශ්‍ය භාණ්ඩත් පහසුවෙන් ලබාගෙන මේ රටේ කාර්මික සංවර්ධනයක් සැලසීමේ වැඩ පිළිවෙළක් ඉදිරියට ගේන්ට පුළුවනි. එහෙත් ඒ සඳහා අවංක අධිරාජ්‍ය විරෝධී ප්‍රතිපත්තියකුත්, නිර්භීතව කටයුතු කිරීමේ හැකියාවකුත් තිබීම අවශ්‍යයි.

ගරු මන්ත්‍රීවරයෙක්

(கௌரவ அங்கத்தவர் ஒருவர்)

(An hon. Member)

දැන් රුසියාව.

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ

(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)

(Dr. S. A. Wickremasinghe)

තමුන්නාන්සේට තේරුණෙ නැතුවට මම මෙච්චර වෙලා කිව්වෙ රුසියාව ගැන තමයි. දැන් රුසියාව කියා රාජ්‍යයක් නැහැ. දැන් තිබෙන්නෙ සෝවියට් එක්සත් ජනපද රාජ්‍යයයි. පැරණී අධිරාජ්‍ය යුගයේ තිබුණු "රුසියාව" කියන නම සමහරවිට තමුන්නාන්සේලාගේ නොදන්නකම; අඥානකම නිසා තමුන්නාන්සේලා ගෙන් සමහරු පාවිච්චි කරනවා. නිදහස් සමූහාණ්ඩු 14 ක් සම්බන්ධ වුණු එක්සත් ජනපදයක් හැටියට පවතින රටක එක ජාතියක නමක් නැහැ. මා සෝවියට් රාජ්‍යය හැටියට ඒ රට හැඳින්වීමෙන් තමුන්නාන්සේලාට ඒ රට හඳුනාගන්ට බැරි වීම ගැන මා කනගාටු වෙනව. එහෙත් තමුන්නාන්සේලා ඒ රටට "රුසියාව" යයි කිව්වට මගේ විරුද්ධත්වයක් නැහැ. [බාධාකිරීමක්] අධිරාජ්‍ය වාදීන්ගේ ප්‍රචාරය තමුන්නාන්සේලා මෙතැන ගිරව් වගේ කිව්වට කන්දක් බර වෙනවද?

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.

(திரு. டென்சில் பெர்ணாண்டோ)

(Mr. Denzil Fernando)

ඒක නම් ඇත්ත [බාධාකිරීමක්]

වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ

(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)

(Dr. S. A. Wickremasinghe)

අද ලෝකයේ සමාජවාදී කඳවුරු ලෝක ව්‍යාප්ත අධිරාජ්‍ය බලවේගයෙන් නිදහස් කර ගැනීමට කරගෙන යන සටන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

තමුන්නාන්සේලා කෑ ගැසුවාට; තමුන්නාන්සේලා බිරුවට දුර්වල වෙනවද? තමුන්නාන්සේලා අපහාස කර ගන්න එකයි; තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට අපහාස කර ගන්න එකයි, එයින් සිද්ධ වෙන්නෙ.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපති තුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස් වීම 1967 අගෝස්තු 22 වන අඟහරුවාදා.

நேரம் பி. ப. 8 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினார்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது: செவ்வாய்க்கிழமை, 22 ஓகஸ்ட் 1967.

It being 8 p.m., the Chairman left the Chair to report Progress.

Committee report Progress; to sit again on Tuesday, 22nd August 1967.

කල් තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

I move,

"That the House do now adjourn."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.1 ට, 1967 අගෝස්තු 14 වන දින සභා සම්මතය අනුව, 1967 අගෝස්තු 22 වන අඟහරුවාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 8.1 மணிக்கு, சபை அதனது 1967 ஓகஸ்ட் 14 ஆம் தேதியத் தீர்மானத்திற்கிணங்க, 1967 ஓகஸ்ட் 22, செவ்வாய்க்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

Adjourned accordingly at 8.1 P.M. until 10 A.M. on Tuesday, 22nd August 1967, pursuant to the Resolution of the House of 14th August 1967.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අංක 8 දරණ ප්‍රශ්නයට පිළිතුරත් සමග ඉදිරිපත් කරන ලද ලැයිස්තුව

අනු අංකය	ගුරුවරයාගේ නම		දරණ සහතිකය	පෞද්ගලික ලිපිනය	පාසැලේ ලිපිනය	ඡන්ද කොට්ඨාශය	පත්වීම් ලබාගත් ආකාරය හා හේතුව
කොළඹ දකුණ							
1.	ඇන්නති ඇග්නස්	ගැ...	අ.පො.ස.ප. (සාමාන්‍ය)	222/2, පිවෝස් ලේන්, මරදන ...	කො/නිල්විදිය ර.මු.වි., කොළඹ 13 ...	මැද කොළඹ ...	උ. නැ. පලාත්වල දෙමළ මාධ්‍ය පාසැල්වලට සිංහල උප ගුරුවරුන් පත්කිරීම
2.	ඒ. ඇන්තනි	ගැ...	එම ...	22/2, පිවෝස් ලේන්, මරදන ...	එම ...	එම ...	එම
3.	ඩබ්. කේ. දේවයානි	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	23ඃ20, මැගසින් පාර, කොළඹ 8 ...	එම ...	එම ...	එම
4.	එස්. එම්. රත්නවේලි	පි ...	එම ...	19, ගිල්ප්‍රඩ් ක්‍රෙසන්ට්, කොළඹ 7 ...	කො/ග්‍රෑන්ඩ්පාස් මු.වි., කොළඹ 14 ...	එම ...	එම
5.	කේ. පී. එම්. ඇස්. හමීඩ	පි ...	එම ...	වග ඉරිදපොල, තුම්මෝදර ...	එම ...	එම ...	එම
6.	ඒ. එස්. එම්. පියදස	පි ...	එම ...	173/37, වුල්පන්ඩල් වීදිය, කොළඹ 13	කො/මට්ටක්කුලිය මු.වි., කොළඹ 15	කොළඹ උතුර...	එම
7.	එම්. පී. අම්බියාවති	ගැ...	එම ...	754, ගාලු පාර, කොළඹ 1 ...	එම ...	එම ...	එම
8.	එම්. එස්. එම්. කියාඩ්	පි ...	එම ...	කපුවත්ත, දෙනිපිටිය ...	එම ...	එම ...	එම
9.	ඩබ්. වී. ඊ. සිල්වා	ගැ...	එම ...	77, අළුත් පාර, මීගමුව ...	කො/මෝදර මුස්ලිම් විද්‍යාලය, කොළඹ 15	එම ...	එම
10.	ඊ. එස්. ගෝමස්	ගැ...	අ.පො.ස.ප. (සාමාන්‍ය)	මෙසෝනා, වේයන්ගොඩ ...	එම ...	එම ...	එම
11.	ඊ. ආර්. ප්‍රනාන්දු	ගැ...	එම ...	154/6, ශා.ජෝශප් වීදිය, මීගමුව ...	කො/අල් ඉක්බාල් මු.වි., කොළඹ 2...	එම ...	එම
12.	එම්. ආර්. පෙරේරා	ගැ...	එම ...	94/1, සා. ජෝශප් වීදිය, මීගමුව ...	එම ...	එම ...	එම
13.	කේ. පී. නන්දවති	ගැ...	එම ...	98, ඇඹරලුව පන්සල පාර, වැලිවේරිය	එම ...	එම ...	එම
14.	ඩබ්. ඊ. සිරිමති	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	80/1, මීගමුව පාර, පැලියගොඩ ...	කො/මදාත් තුල්ක හිරියා මුස්ලිම් බාලිකා වි., කොළඹ 9	එම ...	එම
15.	ඩබ්. බී. ප්‍රනාන්දු	ගැ...	එම ...	උදන්නාව, කොච්චිකඩේ ...	එම ...	එම ...	එම
16.	එම්. එම්. කුරේරා	ගැ...	අ.පො.ස.ප. (සාමාන්‍ය)	ඩබ්. ඇන්. අබේදීර බාරේ, පොලිසිය, කඳාන	කො/පාතිමා මුස්ලිම් බාලිකා වි., කොළඹ 12	එම ...	එම
17.	බී. ලීලාවති	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	මඩබාවිට, ඉහලගම, දන්ඕවිට ...	කො/හමීඩ් අල් හුසේන් ම.වි., කොළඹ 12	එම ...	එම
18.	ජී. එල්. එම්. එච්. පෙරේරා	ගැ...	එම ...	ශා. ලාසරුස් පාර, 27, මීගමුව ...	එම ...	එම ...	එම
19.	ඩබ්. පී. ඇස්. අබේවර්ධන	ගැ...	එම ...	''චන්ද්‍රිකා'' වැවල පාර, පෙතියාගොඩ, කැළණිය	කො/බුලුමැන්ඩල් වීදිය, මු.වි., කොළඹ 12	එම ...	එම
20.	එන්. ජී. රාමනායක	ගැ...	එම ...	6, අලුත්වත්ත, හොරපේ, රාගම ...	කො/මිහිදුමාවත ර.මු.වි., කොළඹ 12	එම ...	එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනු අංකය	ගුරුවරයාගේ නම		දරණ සහතිකය	පෞද්ගලික ලිපිනය	පාසැලේ ලිපිනය	ජන්ද කොට්ඨාශය	පත්වීම් ලබාගත් ආකාරය හා හේතුව
21.	පී. ඒ. විමලාවතී	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	බටේපොල, වතුරුගමු ...	කොා/අල් හිදයා ම.වි., කොළඹ 10 ...	මැද කොළඹ ...	උ. නැ. පළාත්වල දෙමළ මාධ්‍ය පාසැල් වලට සිංහල උප ගුරුවරුන් පත්කිරීම
22.	ටී. ඒ. දයාවතී	ගැ...	එම ...	කේ. ජිනසේන බාරේ, ල.ඩු.සේ., මරදන	එම ...	එම ...	එම
23.	එම්. එම්. නන්දවතී	ගැ...	අ.පො.ස.ප. (සාමාන්‍ය)	''රුක් සෙවන'', බෝවිල්ගමුව, පොතු හැර	කොා/මිහිදුමාවත මු.වි., කොළඹ 12 ...	එම ...	එම
24.	එම්. එම්. එස්. පෙරේරා	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	යටිහේන, මල්වාන ...	කොා/මාලිගාකන්ද මු.වි., කොළඹ 10	එම ...	එම
25.	කේ. පී. අප්පන්	පි ...	එම ...	120, මිහිඳු මාවත, හිරිපිටිය, වේයන් ගොඩ	කොා/එගොඩ උයන මු.වි., මොරටුව...	මොරටුව ...	එම
26.	ඒ. ජේ. එම්. මුනාර්ගු	පි ...	අ.පො.ස.ප. (සාමාන්‍ය)	193, මීගමුව පාර, වේයන්ගොඩ ...	කොා/ඩෙන්හැම් ඉංග්‍රීසි වි., කොළඹ 10	මැද කොළඹ ...	එම
27.	අයි. එස්. එම්. යූසුප්	පි ...	එම ...	රඩුහඳන, මොරන්න, කුරුණෑගල ...	එම ...	එම ...	එම
28.	කේ. ජී. ඩී. ප්‍රනාන්දු	පි ...	ජ්‍යෙෂ්ඨ ...	17, ශාං ජෝශප් පාර, මීගමුව ...	කොා/ගලගෙදර මු.වි., පාදුක්ක ...	අවිස්සාවේල්ල...	එම
29.	ඩබ්. ඩබ්. චාල්ස්	පි ...	අ.පො.ස.ප. (සාමාන්‍ය)	රද්දෙළුව, කටුගෙදර ...	කොා/අල් හිදයා මු.වි., කොළඹ 10 ...	මැද කොළඹ ...	එම
කොළඹ උතුර (ගම්පහ)							
30.	එම්. වී. පී. මර්සලින්	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	91/2, කැල්නි පාර, මීගමුව ...	කොළ/කුඩාරිමුල්ල මිශ්‍ර විද්‍යාලය, පූගොඩ	මීගමුව ...	එම
31.	ඩබ්. එම්. ඒ. ඩී. ප්‍රනාන්දු	ගැ...	එම ...	''හෙලන් විලා '', පලහතුරේ, කොච්චිකඩේ	කොළ/වෙලේගොඩ මු.වි., වත්තල ...	එම ...	එම
32.	ඩබ්. ජේ. එම්. ඩී. ඇල්. පීරිස්	ගැ	එම ...	55, ලුවිස් පෙදෙස, මීගමුව ...	කොා/අල් නිලාල් ම.වි., මීගමුව ...	එම ...	එම
33.	පී.එම්.පී.ආර්. කන්දප්පා	ගැ...	එම ...	උඩංගාව, කොච්චිකඩේ ...	කොළ/කහටෝවිට මුස්ලිම් බාලිකා වි. වේයන්ගොඩ	එම ...	එම
34.	ඩබ්. බී. ඇම්. ඇල්. රුද්‍රිගෝ	ගැ...	එම ...	3, සූරිය පාර, මීගමුව ...	කොළ/අල් සිලාල් මුස්ලිම් ම.වි., මීගමුව	එම ...	එම
35.	ඇම්. ඇම්. පී. පෙරේරා	ගැ...	එම ...	සී බීච් පාර, මීගමුව ...	කොළ/කුඩාරිමුල්ල මු.වි., පූගොඩ ...	එම ...	එම
36.	ඩබ්.එම්.අයි. කෘෂ්ස්	ගැ...	එම ...	පළහතුරේ, කොච්චිකඩේ ...	කොළ/වල්ගම මු. වි., මල්වාන ...	එම ...	එම
37.	ජේ. ආර්, එල්. ප්‍රනාන්දු පුල්ලේ	ගැ...	එම ...	31, ඇත්ගාල, කොච්චිකඩේ ...	එම ...	එම ...	එම
38.	ඩබ්. එල්. ජී. පීරිස්	ගැ...	එම ...	පළහතුරේ, කොච්චිකඩේ ...	කොළ/කම්මල්තුරේ මු.වි., කොච්චිකඩේ	එම ...	එම
39.	එම්. එස්. පී. කුඤ්ඤ	ගැ...	එම ...	දුවන, කොච්චිකඩේ ...	එම ...	එම ...	එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනු අංකය	ගුරුවරයාගේ නම		දරණ සහතිකය	පෞද්ගලික ලිපිනය	පාසැලේ ලිපිනය	ඡන්ද කොට්ඨාශය	පත්වීම් ලබාගත් ආකාරය හා හේතුව
40.	එන්. ඒ. අබේසූරිය	පි ...	ජ්‍යෙෂ්ඨ ...	ඇල්ලලමුල්ල, පස්යාල ...	කොළඹ/කහටෝවිට මූ.වි., වේයන්ගොඩ	අත්තනගල්ල ...	උ.නැ. පලාත්වල දෙමළ මාධ්‍ය පාසැල්වලට සිංහල උප ගුරුවරුන් පත්කිරීම
41.	එච්. ඒ. වනිගරත්න	ගැ...	එම ...	ඇත්ගාල, කොච්චිකඩේ ...	කොළඹ/ගල්ලොලුව මුස්ලිම් විද්‍යාලය,	මීගමුව ...	එම
42.	එච්. සිල්වා	ගැ...	එම ...	වැලිහේන, කොච්චිකඩේ ...	එම ...	එම ...	එම
43.	ඒ. ඩී. වී. සෙනෙහෙලතා	ගැ...	එම ...	බුළුගහගොඩ, ගනේමුල්ල ...	කොළඹ/තිහාරිය මුස්ලිම් බාලිකා විද්‍යාලය, කලගෙඩිහේන	ගම්පහ ...	එම
44.	ඇම්. එච්. ඇම්. ඇස්. මොල්ලිගොඩ	ගැ	එම ...	13, නිවාස පාර, පෙරියමුල්ල, මීගමුව	කොළඹ/දරුසලාම් මුස්ලිම් මහා විද්‍යාලය කලගෙඩිහේන	මීගමුව ...	එම
45.	එස්. බී. වනිගසූරිය	ගැ...	එම ...	මාකෙවිට, ජාඇල ...	කොළඹ/මාබෝල මුස්ලිම් විද්‍යාලය, වත්තල	මිනුවන්ගොඩ	එම
46.	ජී. ජේ. ආර්. පෙරේරා	ගැ...	එම ...	27, ශාන්ත ලාතරස් පාර, මීගමුව ...	කොළඹ/උඩුගොඩ මුස්ලිම් විද්‍යාලය, රුක්ගහවිල	මීගමුව ...	එම
47.	එම්. පී. අයි. ඩයස්	ගැ...	එම ...	පොලිස් ස්ථානය, පැලියගොඩ ...	කොළඹ/දරුසලාම් මුස්ලිම් මහා විද්‍යාලය කලගෙඩිහේන	වත්තල ...	එම
48.	කේ. ඇම්. රත්නසිලි	ගැ...	එම ...	මඩබාවිට, දන්ඕවිට ...	කොළඹ/නාඹුවව මුස්ලිම් මිශ්‍ර විද්‍යාලය, පස්යාල	මීරිගම ...	එම
49.	එස්. ඒ. ගුණපාල	පි...	එම ...	සෝමගිරිය, දුඹුන්නේගෙදර, කල්එලිය	කොළඹ/කහඩෝවිට මුස්ලිම් පිරිමි වි. වේයන්ගොඩ	අත්තනගල්ල ...	එම
50.	එස්. සිරියාවති පෙරේරා	ගැ...	එම ...	240, වටද්දර, වේයන්ගොඩ ...	කොළඹ/සපුගස්කන්ද බාලිකා විද්‍යාලය, මාකොළ, කඩවත	අත්තනගල්ල ...	යෝජිත පාසල් රජයට පවරා ගැනීමේදී සේවය සලකා බලා දෙන ලද පත්වීමක්
51.	කේ. එම්. දයාවති	ගැ...	එම ...	164, ගොංගිතොට, වත්තල ...	කොළඹ/නාගොඩ රෝ. ක. පිරිමි පාසල, කඳාන	මහර ...	එම

කළුතර

52.	ඩී. සී. කෝදගොඩ	ගැ...	එම ...	ඒ. වීරසූරිය මයා. බාරේ, නැඟින්න, දෙඩන්ගොඩ	ක/වැලිපැන්න මු. වි. වැලිපැන්න ...	මතුගම ...	උ. නැ. පලාත්වල දෙමළ මාධ්‍ය පාසැල්වලට සිංහල උප ගුරුවරුන් පත්කිරීම
53.	පී. එම්. එම්. වාලිස්	පි...අ.පො.ස.ප.(ඉහ)		මාරාව, අටුලුගම, බණ්ඩාරගම ...	ක/පැලැන්දමු. වි. පැලැන්ද ...	බණ්ඩාරගම ...	එම
54.	ඒ. කේ. එම්. ජිජ්රි	පි...	එම ...	60, වත්තල්පොල, පානදුර ...	ක/හේනමුල්ල මු. වි. පානදුර ...	පානදුර ...	එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනු අංකය	ගුරුවරයාගේ නම		දරණ සහතිකය	පෞද්ගලික ලිපිනය	පාසැලේ ලිපිනය	ඡන්ද කොට්ඨාශය	පත්වීම් ලබාගත් ආකාරය හා හේතුව
55.	කේ. එම්. එල්. එච්. එම්. මැනිකේ	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	අන්දන්දල, බුලත්සිංහල ...	ක/වෙයන්ගොඩ මු වි. අගලවත්ත ...	බුලත්සිංහල ...	උ. නැ. පළාත්වල දෙමළ මාධ්‍ය පාසැල්වලට සිංහල උපගුරුවරුන් පත් කිරීම
56.	සෝමාවතී මුනසිංහ	ගැ...	අ.පො.ස.ප. (සාමාන්‍ය)	137, දර්ගා නගරය ...	ක/අල්හම්බ්‍රා මු. වි. දර්ගා නගරය ...	බේරුවල ...	එම
57.	ජී. කේ. රාජපක්ෂ	ගැ...	එම ...	පාම් ගාඩන්ස්, රත්නපුරය ...	ක/අටුලුගම මු. බ. වි. බණ්ඩාරගම ...	රත්නපුරය ...	එම
58.	කේ. වී. ඒ. බාලසූරිය	පි...	එම ...	කේ. ඒ. රපියෙල් මයා. බාරේ, මිල්ල විපීය වත්ත, රත්කපුර	ක/අටුලුගම මු. පි. වි. ...	එම ...	එම
59.	වයි. මාගිරිස්	පි...	එම ...	''සෙමිසෙවන'',තුඹගොඩ,බලන්ගොඩ	ක/මග්ගොන මු. වි. මග්ගොන ...	බලන්ගොඩ ...	එම
60.	ජී. එච්. එස්. ප්‍රනාන්දු	පි...	එම ...	පිංකන්ද, ගොඩකවෙල ...	ක/වටවිල මු. වි. පානදුර ...	රක්වාන ...	එම
61.	ඩබ්. එම්. එම්. එස්. පෙරේරා	ගැ...	එම ...	සප්ලයි ස්ටෝර්ස්, අටකලන්පන්න ...	ක/කළුතර මු. බා. වි. කළුතර ...	රක්වාන ...	එම
62.	එම්. එම්. එන්. ගුණරත්න	ගැ...	එම ...	ගලබොඩ, ගල්ලැල්ල ...	එම ...	රත්නපුර ...	එම
63.	එම්. එස්. එම්. හුසයිර්	පි...	එම ...	ගොරකාන, මොරටුව ...	ක/කළුතර මු. ම. වි. කළුතර ...	පානදුර ...	එම
64.	එම්. එන්. වී. විල්සන්	ගැ...	එම ...	20, මල්වල පාර, රත්නපුර ...	ක/චීනකොටුව මු. බා. වි. බේරුවල	රත්නපුර ...	එම
65.	පී. බේබිනෝනා	ගැ...	එම ...	මද්දෙකන්ද, බලන්ගොඩ ...	ක/මරදන මු. බා. වි. බේරුවල ...	බලන්ගොඩ ...	එම
66.	එම්. එස්. එම්. ඒ. ෂාපි	පි...	එම ...	120, මපූර් චන්ද්‍රවන්කය, කළුතර දකුණ	ක/චීනකොටුව මු. ම. වි. බේරුවල ...	කළුතර ...	එම
67.	ඒ. ඒ. අබේසිංහ	පි...	එම ...	කුඹුල්කට්ටිය, අළුත් පාසල, කොළඹ ගෙඅාර	ක/මාලිගාහේන මු. වි. බේරුවල ...	රක්වාන ...	එම
68.	ඒ. එච්. එම්. විරසිංහ	ගැ...	එම ...	පාම් ගාඩන්ස්, ගල්කඩුව, රත්නපුර ...	ක/කළුතර මු. බා. වි. කළුතර ...	රත්නපුර ...	එම
69.	කේ. එම්. අයි. කුරුප්පු	ගැ...	එම ...	''සුබුලු'' ගොඩකවෙල ...	ක/හලවේගොඩ ම.වි. බේරුවල ...	රක්වාන ...	එම
70.	එස්. ඩී. ලීලාවතී	ගැ...	ජ්‍යෙෂ්ඨ ...	අඹේපිටිය, බේරුවල ...	ක/චීන/කොටුව මු. ම. වි. ...	බේරුවල ...	එම
71.	එම්. විජය	ගැ...	අ.පො.ස.ප. (ස)	සූරියකන්ද, බුළුතොට, ගාල්ල ...	67.1.15 දින පත්වීම අවලංගු කරන ලදී	කොලොන්න ...	එම
ගාල්ල							
72.	එච්. ඒ. එම්. සියාඩ්	පි...	ජ්‍යෙෂ්ඨ ...	102/5, ජම්පිනා, දඩල්ල, ගාල්ල ...	ගා/කුරුඳුවත්ත මුස්ලිම් විද්‍යාලය ...	ගාල්ල ...	එම
73.	පී. මරියදස	පි...	එම ...	''රුබිලොජ්'', කුරුඳුගහහැතැප්ම, ඇල්පිටිය	ගා/පනාපිටිය මුස්ලිම් විද්‍යාලය ...	ඇල්පිටිය ...	එම
74.	ඇම්. ඇස්. සිති	ගැ...	එම ...	309, මාතර පාර, කටුගොඩ, ගාල්ල ...	ගා/මල්හාර්ජ්සුල්හියා මුස්ලිම් බාලිකා ම. වි.	ගාල්ල ...	එම
75.	එම්. එච්. ඇම්. සයිපුඩීන්	පි...	එම ...	231, මහමෝදර, ගාල්ල ...	ගා/කන්දෙවත්ත මුස්ලිම් විද්‍යාලය ...	එම ...	එම
76.	ඒ. එම්. එම්. දරුක්	පි...	එම ...	9, කෝන්ගහ හන්දිය, ගාල්ල ...	ගා/හිරිඹුර මුස්ලිම් විද්‍යාලය ...	එම ...	එම
77.	එල්. ජේ. අමරසේන	පි...	එම ...	දෙරනලියද්ද, හැම්මැලිය, බද්දේගම	ගා/මල්හාර්ජ්සුල්හියා මු. පි. ම. වි. ...	බද්දේගම ...	එම
78.	ජී. එච්. මාලනි	ගැ...	එම ...	30, මුස්ලිම් පාසල පාර, දෙවට, කටුගොඩ	ගා/කන්දෙවත්ත මු. විද්‍යාලය ...	ගාල්ල ...	එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනු අංකය	ගුරුවරයාගේ නම	දරණ සහතිකය	පෞද්ගලික ලිපිනය	පාසැලේ ලිපිනය	ඡන්ද කොට්ඨාශය	පත්වීම් ලබාගත් ආකාරය හා හේතුව
79.	එම්. ඩී. වැරනියගොඩ	ගැ... ජ්‍යෙෂ්ඨ ...	තණබද්දේගම, ඇල්පිටිය ...	ගාෆමල්හාර්ජ්සුල්හියා මු. බා. ම. වි. ...	බද්දේගම ...	උ. නැ. පලාත්වල දෙමළ මාධ්‍ය පාසැල්වලට සිංහල උප ගුරුවරුන් පත්කිරීම
